
කොග්ගල නිලමේ
හේ. මාකස් ප්‍රනාන්දු

මෙම පොත ඔබ අප සැම කියවා ලබන දැනුමෙන් රැස් කර ගන්නා පින්,

ඉපැරණි හෙළ වංශ කතාවේ අප නොදුටු පැත්ත හෙළි පෙහෙළි කර දුන්

මෙම පොතේ කර්තෘ හේ. මාකස් ප්‍රනාන්දු මහතාටත්, හීන්බණ්ඩාර මහතාටත්,

රාවණ යුගයේ සිටි හෙළ වීරුවන්ටත්, ඔවුන්ට මාධය වූ ඒ. එෆ්. කොකාවල මහතාටත්

අනුමෝදන් වේවා.

කොග්ගල නිළමේ

භූත විද්‍යා පර්යේෂණ කතාන්දරය

කර්තෘ

ජේ. මාකස් ප්‍රනාන්දු



පෙර වදන

කොග්ගල නිළමේ යනු පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් එකතුවකි. ඉංග්‍රීසි ගුරුවරයෙකු වූ කොකාවල මහතාත්, හීන්බණ්ඩේ නිළමේත් ඒ පුද්ගලයින් දෙදෙනාය. පුද්ගල-යෙකුගේ නියම නම මෙබඳු කතාවකට යෙදීම නුසුදුසු යැයි හැඟී ගියෙන් කොකාවල මහතාගේ නම කොග්ගල ලෙසින් සඳහන් කළෙමි.

කලකට පෙර මෙහි කොටසක් පළවූ සිළුමිණ පුවත්පතේ කියවන්නන්ගෙන්ද නොයෙකුත් කරුණු ඇතුළත් ලිපි සිය ගණනක් මට ලැබිණ. ඒ බොහෝ ලිපිවල ඉතා වැදගත් තවත් කරුණුද ඇතුළත්ව තිබිණ. දැ හිතැතියන් එම කරුණු ලියා නොඑවූයේ නම් ඒවා සඳහටම නැතිවී යාමට ඉඩ තිබිණ. ඒ වැදගත් කරුණු මා වෙත ලියා එවූ ඇතැම් අයට මා පුද්ගලිකවම තුති කළද එසේ තුති පිරිනැමීමට නොහැකි වූ හැම කෙනෙකුටම මගේ නොවක් තුති මෙයින් පුදමි.

රාවණා යුගය වෙත මා යොමුවූයේ 1946 වසරේදී මා බදුලු රෝහලේ සේවය කළ කාලයේ සති දෙකක් පමණ දිනපතා රෝගියෙකු බැලීමට රාවණා ඇල්ලෙන් පැමිණි එවකට අනූහයවැනි වියේ පසුවූ සීයා කෙනෙකු රාවණා ඇල්ලත්, රාවණා රජතුමාත් ගැන මං සමග කී විස්තරයකිනි. එම සීයා දැනට ජීවතුන් අතර නැති නමුදු හෙළ දූයේ අතීතය සෙවීමට මා යොමු කිරීමේ පිනෙන් ඒ සීයාට නිවන් සුව ලැබේවා යි මම පතමි.

එතැන් සිට 1956 දී කොකාවල මහතා හමුවන තුරු හැකි හැම විටෙකම හෙළයාගේ අතීතය සෙවීමෙහි මා නිරත වූ නමුත් නිළමේ හමුවීමෙන් පසු මගේ කුතුහලය දියුණු තියුණු විය. ඉන් පසු මි ස් දිවි ගෙවා මරණින් පසු සත්ව දිවියක් නොලබා වසර දහස් ගණන් භූතාත්ම වල ගත කරන්නවුන් සොයා සාත්තර, අංජනම්, ආවේශ ආරූඪ, ප්‍රේත ආදී ගුප්ත විද්‍යාත්මක තැන් සිය ගණනක්

පිහිට භාර ගතිමි, එසේම අතීතය සෙවීමට මා යොමු කළ හොරාවල මහතාටත්, නිළමෙ තුමාටත් නිවන් සුව පතමි.

මෙම කථාවේ කොටස් කිහිපයක් පළ කළ සිතුමිණි කර්තෘ චින්තාමණී මොහොට්ටි මහතාටත්, එම පත්‍රයේ ගුප්ත ගවේෂණ කායාී මඩුල්ලටත් මගේ නොවක් තුති පුද කිරීමට පොත පළකිරීමේ වරය උපයෝගි කර ගනිමි.

කථාව සති කිහිපයක් පළවීමෙන් පසු වෙනත් සතිපත්‍ර පුවත් පතක කතුවරයෙක් 'ඉල්ලන තරමක් ගෙවීමට' තමාගේ පුවත්පතට මේ කතාව දෙන ලෙස ඉල්ලීමක් කළ නමුත් මා එය ප්‍රතික්ෂේප කළ බව මෙහි ලා සඳහන් කිරීම උචිත යැයි සිතමි.

ඒ සමගම සඳහන් නොකරම බැරි දෙයක් ඇත. එනම් සති කිහිපයක් කතාව පළවීමෙන් පසු මොහොට්ටි මහතාත් ගුප්ත විද්‍යා ගවේෂණ මණ්ඩලයේ තවත් මහතෙකු සමගත් ගුප්ත විද්‍යා මගින් සාක්තර කියන එක්තරා හිමි නමක් වෙත මා කැඳවාගෙන ගිය සැටිය. ආපසු එන ගමනේ තවත් සාක්තර කියන තැනකටද මා කැඳවාගෙන යනු ලැබිණ. ඒ දෙපොලෙදීම කලින් මා නොදත් මගේ පෙර ආත්ම පිළිබඳව විස්තර අපට ලැබිණ.

පසුව මට දැනගැනීමට ලැබුණේ මොහොට්ටි මහතා මා එසේ කැඳවාගෙන යනු ලැබුයේ මේ කතාව සිතින් මවා ගෙතුවක්ද, නැතහොත් ඇත්තටම සිදුවීමක් ද යන්න සෙවීමට බවය.

මෙම කතාව වසරක් පමණ කල් පළවීමෙන් පසුව පාකර් 51 රන් පෑනක් පත්‍ර කර්තෘ මහතාට එවා එය මට තෑගි කිරීමට ඉල්ලීමක් කළ ප්‍රාණ වෛද්‍යාචාර්ය ඩී. එම් ජයසිංහ මහතාට මගේ නොවක් තුති පුදමි. පසුව මා හඳුනා ගත් විට එතුමා කියේ මෙබඳු කතාවක් ලිවිය යුත්තේ රන් පෑනකින් බවත්, එනිසාම රන් පෑනක් තෑගි කළ බවත්ය, මට දිරි දුන් ඒ මහත්මාටත් හෙළ දූයේ නාමයෙන් මගේ නොවක් තුති පුදමි.

වසර දෙකක් මෙම කතාව සිතුමිණි පත්‍රයේ පළවීමෙන් පසු පද්මා කොකාවල මහත්මිය සිතුමිණි පතට ලිපියක් සපයමින් කොකාවල මහතාගේ නියම නමින් කතාව පළ කරන මෙන් ඉල්ලීමක්ද කර ඇත. එහෙත් කතාව සම්පූර්ණයෙන් ලියා අවසන්ව තිබූ බැවින් එම ඉල්ලීම ඉටු කිරීමට නොහැකි වූ බව කණගාටුවෙන් සඳහන් කරමි.

ඒ වන විට එතුමා හෝ එතුමිය ගැන වසර ගණනකින් කිසිම තොරතුරක් නොදැන සිටි මා ඉමහත් සොම්නසටත්, කොකාවල මහතාගේ පරලොව් සැපත් වීම ගැන අසා ඉමහත් දොම්නසටත් පත්වීමි. කොකාවල මහතාගේ අසනීපය ගැන මට දන්වා කොකාවල මහතාට ආවේග වී සිටි නිළමේ හමුවීම සහ මෙල්ල කර ගැනීමේ කාරියෙන් මෙවැනි ගුප්ත කාර්යයකට මග පෑදීම ගැනත් කොකාවල මහතා සමග ගත කළ සතිය තුළ මට කළ ඇප උපකාර වෙනුවෙන් පද්මා කොකාවල මහත්මියටද මගේ නොවක් තුති මෙයින් පුදමි.

මෙම කතාව සිතුමිණි පතේ පළවූ කාලයේ මට මුහුණ පෑමට සිදුවූ දේ බොහෝය. ඒවා සියල්ල ලිවීමට තවත් මෙබඳු පොතක් ලිවිය යුතු වේ. කෙසේ හෝ ඒවා ඒ සියල් ලන්ටම මගේ නොවක් තුති මෙයින් පුදමි.

කතාව පළවෙද්දී කතාව ඇතුළත් පොත ඉල්වා ලිපි දහසකට වඩා ලැබිණි. එහෙත් අමතර ආදායමකින් තොර මාසික වේතනයක් ලැබූ රජයේ සේවකයෙකු වූ මට පොතක් පළ කිරීමට හැකියාවක් නැතිවූ බැවින් එම ඉල්ලීම එකල ඉටු කළ නොහැකි වූ බව කරුණාවෙන් මෙහිලා සඳහන් කරමි.

මෙහි සඳහන් බොහෝ කරුණු තහවුරු කිරීමට සාක්ෂි ඇතිදැයි බොහෝ දෙනෙකු විමසූ නමුදු මෙහි සඳහන් හැම දෙයක්ම තහවුරු කිරීමට කරුණු සෙවීම උගහට බව මමද පිළිගනිමි. එහෙත් විජයගේ පැමිණීමටත් බුද්ධාගමේ පැතිරීමටත් පෙර මේ රටේ සිටියේ යක්ෂ, රාක්ෂයින් යැයි පරම්පරා ගණනක් තුළම මොළ සේදීමකට පත්ව ඇති බොහෝ දෙනෙකු මෙම කරුණු නොපිළිගත්තා වුවද, අපක්ෂපාතීව තීරණ ගැනීමට හැකි බොහෝ දෙනාකුගේ මතය වූයේ සාක්ෂි නොමැතිවද තර්කානුකූලව මෙහි සඳහන් බොහෝ කරුණු පිළිගත හැකි බවය.

මෙම මෙබඳු පොතක් වශයෙන් පළ කිරීමට මා දිරිමත් කළේ ප්‍රබුද්ධ කලා රසිකයෙකු වන සුමනදාස නන්දසේන හිතවතාය. ඔහුගේ දයාබර ගුණයට මගේ නොවක් තුති පුදමි. කොග්ගල නිළමේ මනා ලෙස මුද්‍රණය කර දුන් සංඛ ප්‍රකාශකයෝ සහ මුද්‍රණ ශිල්පියෝ ආයතනයේ කාර්ය මණ්ඩලයට ද මාගේ දයාබර තුතිය පිරිනමමි.

භූතාරූඪ වූවන් සමග විවිධ අවස්ථාවලදී කළ කතා බහ හැකිතාක් දුරට ඒ ආකාරයෙන්ම පොතට ඇතුලත් කළෙමි. ඒ නිසා මෙහි බස් වහර සම්මත ව්‍යාකරණ රීති වල පිහිටා විමසිය යුතු නොවේ.

භූතාත්ම පිළිබඳ අපමණ කතාන්දර පෙර අපර දෙදිග සාහිත්‍යයෙහි තිබේ. ඒවා සියලු දෙනා විසින් පිළිගෙන නැත. සියලු දෙනා විසින් ප්‍රතික්ෂේප කරන්නේද නැත. එම කතාන් දර වලට ඇතුළත් ප්‍රවෘත්ති බොහෝ දෙනා තුළ කුතුහලය අවුළුවමින් සැකය හා සංකාව හමුවේ අවිනිශ්චිතව පවතින්නේය.

සාමාන්‍ය මිනිසාගේ බුද්ධි පථයට විෂය නොවන අපමණ දේ ලොවෙහි පවති. ඒවායෙහි නියම ස්වභාවය සොයා විමසා පිරිසිඳ විවරණය කිරීම ඉතා ම අපහසුය. කොග්ගල නිළමේ කතාන්දරයේදී මමද ඒ අපහසුතාවය අත් දුටුවෙමි. භූත කතාන්දරයක සුවිශේෂ ලක්ෂණයද එයමය යනු මම තරයේම විශ්වාස කරමි. මේ පොත කියවන ඔබේ නිගමනය කුමක්දැයි මට දන්වන්නේ නම් ඉතාමත්ම ස්තුතිවන්ත වෙමි.

කොග්ගල නිළමේ මගින් හෙළි කළ කරුණු අනුව හෙළයේ අතීතය සෙවීමට තව තවත් හෙළයින් ඉදිරිපත් වේවා! යි යනු මගේ පැතුමයි. මෙහි තවත් කොටසක් ළඟදීම නිකුත් කිරීමට බලාපොරොත්තු වෙමි.

හේ. මාකස් ප්‍රනාන්දු.

183, මහවැලි උයන,
මහනුවර.

කොග්ගල නිලමේ

(1)

පළමු දවස

හොල්මන්, අවතාර, භූතාවේශ, භූත දමනය, යන්තර, මන්තර, හදි හූනියම්, අනවිණ, කොඩිවිණ, පිල්ලි, අංගම්, තත්කාල, සාස්තර, පේන, අංජනම්, ආදී අද්භූත ගුප්ත බලවේග සහ අද්භූත සිදුවීම් ගැන මා අසා තිබූ නමුත් එබඳු දේ ගැන සෙවීමට බැලීමට හෝ ඇත්ත නැත්ත සෙවීමට හෝ ඇවැසියාවක් මට නොවීය. ඒවා විශ්වාස කිරීමට හෝ නොකිරීමට හෝ හේතුද මට නොවීය. ඒ ගැන සිත යොමු කිරීමට අවස්ථාවක් හෝ උවමනාවක් හෝ මට නොවීය.

එහෙත් වසර 1956 දී මුහුණ පෑමට වූ එක්තරා සිදුවීමක් හේතුකොට ඒ ගැන සිත යොමු කිරීමට මට සිදුවිය.

එවකට මං සේවය කළ රෝහල පිහිටි පළාතේ එක්තරා පාසලක ඉංග්‍රීසි ගුරුවරයෙක් සිටියේය. දිනක් රෝහලට පැමිණි ඔහු මා හමුවී කතාබහ කිරීමෙන් පසු ඉතා සුළු කලකදී මා සමඟ බොහෝ සේ කුළුපග විය. ටික කලකදී ඔහු දිනපතාම මා හමුවීම සඳහා පැමිණීමට පුරුදු විය.

මේ අතර, මගේ බිරිඳ සහ පුතාද නිවාඩුවක් ගතකිරීම සඳහා කොළඹ ගොස් සිටි බැවින් මට කාලය ගෙවීමට සිදුවූයේ තනිවමය. ඒ කාලය තුළද ඉහත කී මිතුරා 'කොග්ගල' මහතා දිනපතාම සවස් වරුවේ මා හමුවීමට' ආ නමුත් එක් දිනක හෝ ඇඳිරි වැටෙනතුරු මගේ ගෙදර රැඳී සිටියේ නැත.

විනෝදාංශය වශයෙන් හඳහන් බැලීම, මන්තර ගුරුකම් හැදෑරීම ආදිය කළ ඔහුගේ නොයෙකුත් අත්දැකීම් ගැන කතා කරමින් කාලය ගත කළ මට ඒ දින කීපය තුළ පැයක් නොදැනිණ.

මගේ බිරිඳ සහ පුතාද ආපසු කැඳවාගෙන ඒමට දිනය එළඹිණ. එදින සෙනසුරාද දිනයක් වූ බැවින් කොග්ගල මහතා මා පිටත්වන තුරුම රැඳී සිට බසය පිටත් වූ විට මට ආයුබෝවන් කියා පිටත් විය. ඔහු නැවත ආපසු හැරී බසයේ මා දෙස නොපෙනී යන තුරුම ඇසිපිය නොහෙලා බලා සිටියේ හිස් බැල්මකිනි. කොග්ගල මහතා නොපෙනී ගිය පසුද මා කල්පනා කළේ ඔහුගේ හිස් බැල්ම ගැනය. කිසියම් බියක් හෝ චකිතයක් ඔහුගේ යටි සිතෙහි හොල්මන් කිරීමේ ලේශ්‍යාවක් ඔහුගේ මුහුණේ පිළිබිඹු වී තිබිණ.

දින තුනකට පසු ආපසු පැමිණි මට දැනගැනීමට ලැබුණේ කොග්ගල මහතා සිහි විකල්ව අසනීපයෙන් පසුවන බවත් මා කැඳවාගෙන යාමට පණිවුඩ කරුවන් කිහිප දෙනෙක්ම කිහිප වතාවක්ම පැමිණි බවත්ය. මා ආපසු පැමිණි විගසම එහි යන ලෙස ඉල්ලීමක්ද කර ඇති බව දැනගැනීමට ලැබුන බැවින් වහාම මම කොග්ගල මහතාගේ ගෙදරට ගියෙමි.

එහි ගිය මා දුටුයේ කාමරයක බිම දැමූ මෙට්ටයක් මත වැතිර සිටි කොග්ගල මහතාය. තරුණයින් හතර දෙනෙක් ඔහුගේ අත්ද, දෙපාද මෙට්ටයට තදකර අල්වාගෙන සිටියහ. කඳුළු පිරි දෙනෙතින් යුතුව කොග්ගල මහත්මිය මා ඉදිරියට පැමිණියාය. අසනීපය පිළිබඳ සුළු විස්තරයක් කළ ඕ තොමෝ කොග්ගල මහතාට සම්පූර්ණයෙන් සිහි නැතිවීමට පෙර මා කොළඹ ගිය බව කිවේයැයි ද, කීවාය.

වසර කිහිපයකට පෙර කොග්ගල මහතාට මළ යකෙකු ආවේශ වී සිටි බවත්, ඒ වාරයේදී මාතර කට්ටඩින් ලවා මළ යකා බැඳ දැමූ බවත්. ඕ මා සමග කීවාය. මේ වතාවේදීද කලින් වතාවේ යක්ෂාවේශයට පෙරදී මෙන්ම ඔහු අසහනයෙන් පසු වූ බවත්, කිසිම කරුණක් රහිතව ඇය සමගද, දරුවන් සමගද අඬදබර කළ බවත් කෙටියෙන් විස්තර කළාය.

යක්ෂාවේශය වීමට සතියකට පමණ පෙර කොග්ගල මහතා කොග්ගල මහත්මිය සමග කියා ඇත්තේ නැවත වරක් යක්ෂාවේශය වීමේ ලකුණු දැනෙන බවත්, එය සිදුවුවහොත් මාතරින් කට්ටඩි ගෙන්වීමට පණිවුඩ යවන ලෙසත්, ඒ අතර ඔවුන් පැමිණෙන තුරු ඔහුගේ ආරක්ෂාවට මා ගෙන්වා ගන්නා ලෙසත්ය.

මා එහි පැමිණීමට පැය බාගයකට පමණ පෙර කොග්ගල මහතා හූවක් කියා "අන්න ගණත්කාරයා මෙහෙ එන්න පිටත් වුනා, මම එයාට බය නැහැ" කියා කෑගැසූ බවත් කොග්ගල මහත්මිය මා සමග කීවාය.

අසනීප වීමට පෙර සතියක, දෙසතියක පමණ සිට නිතරම අසහනකාරී සීයක් දැනෙන බවත්. මා අසලට ගියවිට එය පහව යන බවත්. එබැවින් දිනපතාම මා හමුවී වචන කිහිපයක් හෝ කතාකිරීම ඇවැසි බවත්, කොග්ගල මහතා කලින් මා සමග කියා තිබිණ.

. කොග්ගල මහත්මිය එසේ කියන විට මට සිහි වූයේ වට මාස කීපයකට පෙර කොග්ගල මහතා සම්බන්ධ වූ සිද්ධියක්ය. එය මෙසේය.

රෝහලේ හෙද සිසුනේවාසිකාගාරයක පදිංචිව සිට රෝහලේ සේවය කළ නිලධාරිනියකට අසනීප විය. දහවල් දොළහ පසු වෙන්ම ඇයට තද හිසරදයක් ඇතිවිය. ඒ සමගම මුළු සිරුරම කම්පැනු ගැන්විණ. ඇතැම් විට ඇ සිහිනාශයෙන් පෙළෙඹවාය.

කොතරම් බටහිර ක්‍රමයේ වෛද්‍යකම කළද සුවයක් නොවීය. ඒ පළාතෙහි පරම්පරාගත රෝහල් සේවකයින් සහ ඇතැම් වැසියන් කීවේ එය අමනුෂ්‍ය දෝෂයක් බවත්, බටහිර වෙදකම නොව කළයුත්තේ යකැදුරු කමක් බවත්ය.

පළාතේ කට්ටඩියෙකු ගෙන්වා විමසූ විට ඔහු කීවේ යකැදුරුකම පිරිනමදී බෙර ගැසීම ඇවැසි බවය. රෝහල තුළ බෙර ගැසිය නොහැකි බැවින් යකැදුරුකම් කළ නොහැකි විය.

කොග්ගල මහතා මා හමුවීමට පැමිණි විට මා රෝහලේ නිලධාරිනියකගේ අසනීපය ගැන ඔහුට කීයේ ඔහුද යන්ත්‍ර ගුරුකම් අත්හදා බැලීම කරන බව මා සමග කියා තිබූ බැවිනි. ඔහුගේ ඉල්ලීම අනුව රෝගිණිය බැලීමට මම ඔහු කැඳවා-ගෙන ගියෙමි. ටික වෙලාවක් රෝගිණිය දෙස බලා සිටි ඔහු මා සමග ආපසු එන ගමනේදී කීයේ බෙර ගසා නොවිල් නොකර ආරක්ෂා යන්ත්‍රයක් බැඳීමෙන් එම රෝගය සුව කළ හැකි බවය.

එම නිලධාරිනියගේ නෑදෑ මහතෙකු සහ රෝහලට කැම් බඩු සපයන වෙළඳ දෙපාර්තමේන්තුවේ නිලධාරි මහතෙකුද සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව යන්ත්‍රය ජපකිරීම නිල නිවාසයේදීම කිරීමට එදිනම කටයුතු සූදානම කර ගතිමු.

සවස් යාමයේ මල් බුලත් තටුව ආදි ඇවැසි දේ සූදානම් කරද්දී කොග්ගල මහතා මට කියේ ඔහු සතුව තිබූ සියලු මන්ත්‍ර ගුරුකම් මටද දෙන බවය.

රෑ කෑමෙන් පසු යන්ත්‍රය ජප කිරීමට පටන් ගැනීමට පෙර වතුර වීදුරු තුනක් මැතිරූ කොග්ගල මහතා ඇවැසි උපදෙස් දුන්නේය. යන්ත්‍රය නවසිය වාරයක් ජපය අවසන් වූ පසු දහස් වාරය සම්පූර්ණ වීමට පෙර බිය උපදවන ශබ්ද ඇසීම හෝ කෙනෙකුට සිහිසුන් වීමක් හෝ ඇතිවුවහොත් මැතිරූ වතුර ටිකක් මුහුණට ඉස බීමටත් දෙන ලෙසත් උප- දෙස් ලැබුණි, එක වතුර වීදුරුවක් රෝගිණිය සඳහා ඇය සිටි කාමරයේත්, දෙවැනි වතුර වීදුරුව අනෙකුත් අය සඳහාත් තුන්වැන්න කොග්ගල මහතාට සිහි නැති වුවහොත් ඔහු සඳහාත් වෙන්විය.

නිල නිවාසයේ එදින අපි තිදෙනාත්, කොග්ගල මහතාත් රෝගිණිය සිටි කාමරයේ තවත් නිලධාරිනින් තිදෙනෙකුත් වීමු.

යන්ත්‍රය ජප කිරීම පටන් ගැනිණ. කොග්ගල මහතා යන්ත්‍රය ජප කළ අතර, අපි තිදෙනාද ඒ අසල පැදුරු එළා වාඩි වී සිටියෙමු. මා සිටියේ කොග්ගල මහතා ඉඳගෙන සිටි පැදුර මත ඔහු අසලටය.

අළුයම තුන පමණ වන විට මැතිරීම නැවැත්වූ කොග්ගල මහතා කියේ ''මිස්ට, දැන්නම් නමසිය වාරයත් පසු වෙලා, ඒත් කිසි ගතියක් නැහැ, අඟුරු දුම්මල දුම් ටිකක්වත් අල්ලමුද?'' කියායි.

දුම් ඇල්ලීමට බලන විට ගින්දර නිවී තිබූ බැවින් තරමක් ඈතින් පිහිටි රෝහල් මුළුතැන්ගෙය කරා ගොස් ගිනි අඟුරු ගෙන ඒම ඇවැසි විය. එහෙත් අනෙක් දෙදෙනාම යාමට මැලිවූ බැවින් මම තනිවම ගිනි අඟුරු ගෙන ඒමට රෝහල් මුළුතැන් ගෙය වෙත ගියෙමි.

@

ගිනි අඟුරුත් රැගෙන මං ආපසු එන විට කොග්ගල මහතා වේගයෙන් හිස කරකවමින් සිහියුන්ව සිටි නමුත් අනිත් දෙදෙනා දෙදනා මත හිස් තබාගෙන නින්දේ පසුවූහ.

මං එක්වරම සැලේ කොග්ගල මහතාගේ උරහිසට අත තබා සොලවා ''මිස්ට කොග්ගල'' යි බැරෙන් කීමය. ඒ සමගම කොග්ගල මහතා නින්දකින් අවදි වූවා සේ මා දෙස බලා 'මිස්ට මාකස්' වැඩේ හරි, කීවේ නියම සිහියෙන් නොවුන බව මට වැටහින,

කලින් මතුරා තිබූ වතුර වීදුරුවෙන් උගුරක් බිවූ ඔහු නැවත මැතිරීම පටන් ගත්තේය. මැතිරූ වතුර ගැන මට සිහි වූයේ ඔහු වතුර වීදුරුව අතට ගත් පසුවය.

අළුයම හතර හමාර පමණ වන විට යන්ත්‍රය සහ ගෙය ආරක්ෂා කිරීමට ඇවැසි දේ සියල්ල මතුරා හමාර විය. හිරු උදාවීමට පෙර රෝගිණියට යන්ත්‍රය පැළඳවීමත්, ගෙය ආරක්ෂා කිරීමත් අවසන් විය.

රෝගිණියට සම්පූර්ණ සුවය ලැබින.

හැම දෙන ඉවත්ව යාමට පෙර නිළ නිවසෙහිදී උදෑසන තේ පැන් සංග්‍රහයක්ද විය. එහිදී යන්තර, මන්තර පිළිබඳ නොයෙක් කරුණු සාකච්ඡාවට බඳුන් විය.

'මිස්ට කොග්ගල යන්ත්‍රය බඳිනකොට කාමරයේ ජනේ-ලය ළඟින් මිණිගෙඩි සද්දයක් ඇහුන, ඒ එක්කම වාගෙ ටිට ටිකක් ඈතින් වත්තෙන් ඒ සද්දෙ ඇහුන. ඊට පස්සෙ වත්ත පහලින් යාන්තම් ඇහුන'' ඒ කීයේ රෝගිණිය සිටි කාමරයේ සිටි අයෙක්.

''මටත් ඇහුණ, මටත් ඇහුණ'' කාමරයේ සිටි අනෙක් දෙදෙනාත් කීහ.

'මටත් ඇහුණ, නමුත් මට ඇහුණේ කාමරය ඇතුළින්' ඒ කීවේ කාමරයෙන් පිට සිටි අයෙක්.

'මිස්ට කොග්ගල සාමාන්‍යයෙන් මන්ත්‍ර ජප කරන්නෙ බුද්ධ මන්ත්‍ර වලින්, බුදුගුණ කියනකොට කොහොමද ආවේශයක් එන්නෙ? මා ඇසුවෙ යන්ත්‍රය ජප කරන විට කොග්ගල සිහිසුන් වූයේ ආවේශ වීමෙන් යැයි සිතිමෙනි.

''මිස්ට මාකස්, මා යන්ත්‍රය මැතිරුවෙ බුදුගුණ වලින් නොවෙයි, යක්ෂ දිෂ්ටි ගෙන්වන මන්ත්‍ර වලින්, ඔය මන්තර බුදුගුණමුද්‍රාවෙ පහළ වෙන්නත් දුස්සර වන්නියෙ භාවිතා කළැයි කියන ඒව'' අහිත් එක. මිස්ට මාකස්ට මා කිව නොවෙද, මා ළඟ ඇති මන්තර සියල්ලම මිස්ට මාකස්ට දෙනව කියා, මට දැන් හිතෙනව, මිස්ට මාකස්ට ඒවයින් වැඩක් ගන්න බැහැ කියල, යක්කුන්ගෙන් වැඩ ගන්න යක්කු ළඟට ගෙන්වගන්න ඕනෑ, මිස්ට මාකස් ඉන්න තැනට යක්කු එන්නෙ නැහැ මා යන්තර මතුරන වෙලාවෙ කොතරම් අඩගැහුවත් දිෂ්ටිය ආවෙ නැහැ, මිස්ට මාකස් එතැනින් ගියා විතරයි දිෂ්ටිය ආවෙ.''

''එහෙනම් මාක්ස් යක්කුන්ට වඩා බලවත් යකෙක්'' මා කීවෙ විහිළුවට මෙනි.

''විහිළු නොවෙයි, මිස්ට මාකස් ළඟ මොකක් හරි බල වේගයක් තියනව.'' ඔහු කීවේ කල්පනාකාරිවයි.

කොග්ගල මහතාට අසනීප වුවහොත් මා ගෙන්වීමට කියා ඇත්තේ එම විශ්වාසය අනුවයැයි මම සිතුවෙමි.

මා කොළඹ ගිය දවසේ හැන්දෑවේ කොග්ගල මහතා ගෙපිළිකන්නේදී හුවක් කියා සිහිසුන්ව ඇද වැටුන බවත් එවේලේ පටන් ඔහු නියම සිහිය නොලත් බවත්; දහවල් දොළහටත්, හැන්දෑවෙ හයටත්, රෑ දොළහටත් හතර පස් දෙනෙකු වුවද පෙරළා දමා දිවීමට තැත් කරන බවද කොග්-ගල මහත්මිය කීවාය. හට්ටඩි නිහිප දෙනෙකු පැමිණි මුත් ඔවුන් එකෙකුට හෝ අසලට යාමට හෝ නොහැකි වූ බවද ඈ කීවාය.

නිතර නිතර ''කොග්ගල, මං ආවෙ උඹව ගෙනියන්නයි උඹ ගෙනියනව, ගෙනියනවමයි'' කියා කෑ ගසන බවද ඈ කීවාය.

මෙබඳු ආවේශයක් වූ තැනැත්තෙකු ඊට පෙර මා දැක නැති නමුත් එහි සිටි කිසිවෙකුට, ඒ බව නොදැනෙන සේ හැසිරීමට මම ඉටා ගතිමි. එහෙත් කොග්ගල මහතා මා පුද්ගලිකව දැන හැඳින සිටි බැවින් කාමරයට ගොස් ඔහුට කතා කිරීමට අදහස් කළෙමි.

ගෙට ගොඩවූ වේලේම මා කොග්ගල මහතා සිටි කාමරයට කර පොවා බැලූ නමුත් ඔහු මා නොදුටු බව මෙන් මගේ පැමිණීම ඔහු නොදත් බව මට සහතිකය. මා පැමිණි වේලේ පටන් ගෙදර රැස්වී සිටි පිරිසෙන් ඇසුනු කසු කුසුවෙන් ද යක්ෂාවේශය ගැන යම් යම් කරුණු ඇහිඳ ගතිමි.

යක්ෂාවේශය ගැන මා කිසිවක් නොදත් බව මම කිසිවෙකුට ද නොහැඟවූයෙමි. මා එහි පැමිණි වේලේ පටන් කොග්ගල මහතා පෙර මෙන් කලහකාරී නොවූ බවත් තරමක් සන්සුන්ව නිහඬ වූ බවත් යමෙකු කියනු ඇසීමෙන් මම දිරිමත් වීමි.

කල්පනාකාරීව විමතියෙන් යුතුව කොග්ගල මහතා සිටි කාමරයට මම ඇතුළු වීමි.

කොග්ගල මහතා උඩුකුරුව මෙට්ටය මත සිටියේය. තරුණයින් හතර දෙනෙක් ඔහු මෙට්ටයට තදකර අල්වාගෙන සිටියහ. ඔහුගේ දෑස් සම්පූර්ණයෙන්ම විවරව තිබුනද එතුළ හිස් බැල්මක් විය. දෑස් වහලය වෙත එල්ල වී තිබිණ. මා කාමරයට ඇතුළු වුවද ඔහු මා දුටු බවට හැඟීමක් නොවීය. කාමරයෙහිත් අවටත් [illegible] නිහැඬියාවක් පැවතිනා.

මා කොග්ගල මහතා අසලට ගොස් මිස්ට කොග්ගල් මොකද මේ? අසනීපයෙන්ද? යි ඇසුවෙමි.

'මම මිස්ට කොග්ගල නොවෙයි. හිතන්න එපා ' ඔය මහත්ය මහහැරියට. ඒ මම බයේය කියල. මහත්තයට තියා මහත්තයට වැඩිය ලොකු අයටවත් මම බය නැහැ'' යි ඔහුගේ පිළිතුර විය.

'මං තමුසෙට කිව්වෙ නැහැනෙ මට බයවෙන්න කියල. තමුසෙගෙ නම කොග්ගල නොවෙයි නම් මොකක්ද නම? 'මා ඇසුවේ කොග්ගල සමග තිබූ කුළුපග බව යටපත් කරගෙනය.

'මහත්තය දැනගන්නව හොඳයි. මං හොඳ වැදගත් පරම්පරාවකට අයිති වැදගතෙක්. මගේ නම ……… ගෙදර

හින්බණ්ඩාර' හෙතෙම පෙළපත්, වාසගම් නාමාවලියක් කියාගෙන ගියේය. එම පෙළපත් සහිත නම ෆුල්ස්කැප් පිටුවකින් බාගයක් පුරවා ලිවීමට සෑහේයැයි මට සිතින.

ඒ මා සමග කතා කළේ කොග්ගල නොවන බවත් ඒ ඔහුට ආවේශ වී සිටි භූතාත්මය බවත් මම තේරුම් ගතිමි.

මේ අතර මා කොග්ගල මහතාගේ තළල් තලයට අත්ල තබා බැලුවේ ඔහුට උණ ගතියක් හෝ හිස රුද ගතියක් ඇතිදැයි බැලීමටය.

විදුලි සැර පහරක් ලද්දකු සේ කොග්ගල මහතා තිගැස්සී උඩ විසිවිය.

'බුදු මහත්තයෝ අත ගන්න, ගන්න ඔය අත අහකට' යි හේ වේගවත් ව කෑ ගැසුවේය. මා නොදැනුවත්වම මා සතුව ඇති කිසියම් ගුප්ත බලවේගයකින් එය සිදුවූයේ යැයි සිතීමෙන් මම දිරිමත් වීමි. මම ඔහුගේ දෑසට මගේ දෙනෙත් කෙළින්ම එල්ල කර ඇසිපිය නොහෙළා තද බැල්මකින් ඔහුගේ දෑස් දෙස ටික වේලාවක් බලා සිටියෙමි.

'බුදු අම්මෝ, මෙන්න මිනී මරණවෝ!' යි හේ කෑ ගැසීය. ඔහුගේ සිරුර වෙව්ලීමට පටන් ගති. එහෙත් මගේ අතට යටවූ හිස නොසැලිණ. දොහොත් එක් වී නමස්කාර ලීලාවෙන් ළය මත තැන්පත් විණ. ඔහුගේ දෑස් පියවී ගියේය. හේ අසමින් කෙඳිරීමට පටන් ගති.

'අයියෝ මා පිච්චෙනවා ...... අනේ අම්මෝ ......මම තමුන්නාන්සේ කියන ඕනෑම දෙයක් කරන්නම් ...... අම්මෝ ...... ඔය අත විතරක් ගන්න අහකට. අනේ ...... අම්මෝ ...... අයි ... යෝ......' හෙතෙම බැගෑපත් විය.

මෙහි කිසි යම් රහසක් ගැබ් වී තිබිය යුතුයැයි මට සිතින රැස්ව සිටි පිරිස කිසිම හැලහොල්මනක් නොමැතිව බලා සිටියහ. කාමරය තුළ නිහැඬියාව රජ කළේය.

මළ පෙරේතයකු හෝ මළ යකෙකු හෝ වෙච්චා මොහු නම් නම්බුකාර මළ යකෙකු විය යුතු යැයි මම සිතුවෙමි.

ඔහුගේ නම හීන්බණ්ඩාර යැයි කී හෙයින් ඔහුට නිළමෙ යනුවෙන් ඇමතීමට ඔහු කැමති වනු ඇතැයි මම සිතුවෙමි. ඊ ළඟට මම ඔහු ඇමතුවේ 'නිළමෙ' කියාය.

'නිළමේ' මං අත අහකට ගන්නම්, හැබැයි තමුසෙ කොග්ගල මහත්තයගෙ ඇහෙන් අයිං වෙන්න ඕන, ඒකට කැමතිද?' මා ඇසුවේ තරමක් සැද ගතියෙනි.

'අනේ බුදු මහත්තයෝ, මං තුන් අවුරුද්දක් මේව ඇමදල, ආව සේව කරල වරම් ගත්තෙ කොග්ගල අරං යන්න, ඒ නිසා ඒක නම් කරන්න බැහැ. වෙන ඕන දෙයක් කරන්නම්

තමුසෙට අයිංවෙන්න බැරිනම් ඔහෙ ඉන්නව, මාත් මගේ අත අහකට ගන්නෙ නැහැ.

මහත්තෙය කොච්චර වෙලං ඔහොම අත තියාගෙන ඉන්නද? මහත්තෙයගෙ අත රිදෙන්න වෙයි. එහෙම නොවෙයි මං හොඳ යෝජනාවක් කරන්නම්, මහත්තය අත අහකට ගන්න. මං කිසි පෙරළියක් නැතිව නිශ්ශබ්දව ඉන්නම්. මහත්තය කියන දෙයක් කරන්නම්.

කොග්ගල මහතාව අල්ලාගෙන සිටි හතරදෙනාට අයින් වීමට කීවේ කාමරයේ දොර වසා යතුරු දැමීමෙන් පසුවයි.

කොග්ගල මහතා අල්වාගෙන සිටි හතරදෙනා අයින් වූහ. ඒ සමගම අල්ලපු කාමරයේ සිටි කොග්ගල මහත්මිය 'අනේ මහත්තයෙං ඔක කියන ඒව විශ්වාස කරන්න එපා. අත අරින්න නම් එපා' යි අනතුරු ඇඟවීමක් කළාය.

'තෝ ... , තෝ ... , තෝ එනවද මෙතන ඒ මහත්තය වත් උගන්නන්න, තෝ තමයි කොග්ගල කැවෙ. තෝ ... නිසා තමයි මේ ඔක්කොම උනේ. ඊ ළඟට හෙනියන්නෙ තෝ තමයි.' නිළමෙ ක්‍රෝධයෙන් වෙව්ලමින් කියාගෙන ගියේය.

එහෙත් මගේ නියමය පරිදි කොග්ගල මහතා අල්වාගෙන

සිටි හතර දෙනාම ඔහු අතහැර අයින් වූහ. දූන් කොග්ගල දෑත් ළය මත තබා දෑස් පියා නිහඬව සිටී.

'හොදයි නිළමෙ, මම අත අහකට ගන්නව. හැබැයි කිසි කලබලයක් හෙම කරනව නෙවෙයි. දැඟලුවොත් දන්නව නේ කරන දේ.' කෙසේ වෙතත් මගේ අත කොග්ගල මහතාගේ නළලින් ඉවතට ගැනීමට පෙර දොර වසා යතුරු දමා ඇතිදැයි ද බැලිමි.

කොග්ගල දූන් දෑස් පියාගෙන දෙඅත් ළය මත තබාගෙන උඩුකුරුව සයනය කරයි. මමද පුටුවක් ගෙන්වාගෙන කොග්ගල අසලින් තබා වාඩි වීමි.

පැවස්වන විට විකිස් ටික පිරිසද වැඩිමිය. එහෙත් අමුතු කිසිවක් සිදු නොවීය. සුපුරුදු පරිදි හැන්දෑ යාමයේ හයට පමණ ගිහු දහනාරි වෙයැයි සියලු දෙනාම බලාපොරොත්තු වූ නමුදු කොග්ගල නිසොල්මනේ කල් ගෙවූයේය. මා කාමරයෙන් පිටව ගිය අවස්ථා වලදී පමණක් ඇවැසි වුවහොත් කොග්ගල අල්ලා මෙල්ල කිරීමට කිහිප දෙනෙක් සූදානම්ව සිටියහ.

රාත්‍රියට කොග්ගල මහතාගේ ගෙදර ගතකිරීමට සිදුවන බවත් මා කලින් නොදැන සිටි බැවින් ගෙදර ගොස් රාත්‍රී ආහාරයද ගෙන රාත්‍රිය ගත කිරීමට ආපසු ඒම මට ඇවැසි විය. සැහෙන පිරිසක් රැස්ව සිටි බැවින් කොග්ගල මහතා දහනාරි වුවහොත් මෙල්ල කිරීමට අපහසුවක් නැති බව පෙනී ගියෙන් රාත්‍රී හතට පමණ ගෙදර යාමට මම සූදානම් වූනෙමි. මා තනිවම යැවීමට බොහෝ දෙනෙකු අකමැති වූයෙන් පැමිණ සිටියවුන්ගෙන් දෙදෙනෙක් මා මගේ ගෙදරටම හැර ලීමට මා සමග පිටත් විය.

මා කෑම කා ඒමට පමාවන බැවින් මා සමඟ ආ දෙදෙනාට ආපසු යන ලෙස කිවත් ඔවුන් ඊට අකමැති වූහ. එහෙත් මා එනවිට රෝහල් සේවකයෙකු කැටිව ආ හැකි බව කී විට ඔවුන් ආපසු ගියහ.

රාත්‍රී නවයට පමණ මා ආපසු ගියේ තනිවමය. මා කොග්ගල මහතාගේ ගෙට ගොඩ වෙත්ම එහි රැස්ව සිටි අය මා දෙස බැලුයේ විමතියෙනි. කොග්ගල මහතාට අසනීප වූ දිනයේ පටන්ම ගමේ කිසිවෙකුත් රාත්‍රී කාලයේ තනිව ඇවිදීමට බියව සිටියහ.

කොග්ගල මහතාගේ කාමරයට කර පොවා බැලු මා දුටුයේ කොග්ගල මහතා නිදා සිටින බවය. කොග්ගල මහතාගේ අසනීපය ගැන සවිස්තරව අසා ගැනීමට එය සුදුසු අවස්ථාවක් විය.

කොග්ගල මහතා සිටි කාමරයේ තරමක් ඈත කාමරයක සිටි කොග්ගල මහත්මිය සමඟ මම කතාවට වැටුණෙමි.

මේ වර අසනීප වීමට පෙර මාස තුනක පමණ සිට කොග්ගල මහතා තරමක අසහනයකින් පසු වූ බවත් නිවැරද්-දේ පවා කොග්ගල මහත්මියට බැණ වැදීම, ඇය නොරිස්සීම හිටි හැටියේ බිය වී නින්දෙන් කෑගසා නැගිටීම ආදිය සිදු වූ බව කොග්ගල මහත්මිය මා සමඟ කීවාය.

පෙර වතාවේද මෙම අසනීපයම සෑදීමට පෙරද එම රෝග ලකුණු ඇති වූ බැවින් මේ වතාවේ ඇ විශේෂයෙන් සැලකිලිමත් වූ බවද කීවාය. මා කොළඹ ගිය දින හැන්දෑවේ ගෙදර ආ හැටියේම කිසි වරදක් නොමැතිව ඇයට බැණ වැදී ගෙපිලිකන්නට ගිය බවත් එහිදී හූවක් කියා සිහිසුන්ව වැටුන බවත් ඇ කීවාය. එවලේම ඇ කට්ටඩියෙකු ගෙන්වා නූලක් බැන්දවූ නමුත් කට්ටඩියා ගෙදරින් පිට වීමටත් පෙර එම නූල කඩා දැමූ බවද ඇ කීවාය.

සෑහෙන විස්තර රැසක් එකතුකරගත් පසු මම කොග්ගල මහතා සිටි කාමරයට නැවත ගියෙමි. ඒ වනවිට පැමිණ සිටියවුන්ගෙන් බොහෝ දෙනෙක් ආපසු ගොස්ය. වේලාව රැ දොළහ පමණ වන විට ඉතිරිවුයේ මමත් තව පිරිමි දෙදෙනෙකුත් පමණි.

හාන්සි පුටුවක් කොග්ගල මහතා අසලින් තබා ගත් මම ටිකක් විවේක ගැනීමට සූදානම් වත්ම කොග්ගල දෑස් විවර කර මා දෙස රැදුරු බැල්මක් හෙළුවේය. කොතරම් ආත්ම විශ්වාසයක් තිබුණද මට තරමක් සැක සිතිණ.

''නිලමෙ, නිදාගෙන ඉවරද? මොනව ද ඕනැ ?'' මා විමසුයේ නිලමේගේ ඇවැසියාවන් සපුරා ලීමට නොව නිලමේගේ අදහස් දැනගැනීමටය.

''මොනවද ඕනැ? මට ඕනැ කොග්ගල. කොග්ගලය ගෙනියනව, ගෙනියනවමයි.''

''උඹට ඕනැ විදියට කොග්ගල ගෙනියන්න දෙන්න බැහැ උඹ වැඩිය දැඟලුවොත් ගහනව පරසක්වල.'' යි මා කීවේ ලක්ෂයින්ට, අවතාර හොල්මන් වලට නොබියව සැර පරුෂව කතා කළ විට ඔවුන් මෙල්ල වන බව අසා ඇති බැවිනි. එහි ඇත්ත නැත්ත සෙවීමට මෙය කදිම අවස්ථාවකැයි ද සිතුවෙමි.

''උඹ කවුද මට ඔහොම කතා කරන්නෙ? මමත් හොඳ වැදගත් ලක්ෂයෙක්. බලාගෙන හිටපන් ගහනව උඹට බෙල්ල කඩලා යන්න. මට බැරි වුවත් මට ඉන්නව හොඳ ගණන් කාරයො.''

නිලමේගේ පාරට්ටුවම ඔහු පාවාදුන්නේය. මානසික විද්‍යාව අනුව බලනකල යමෙකු කිසියම් දක්ෂකමක් වෙනත් කවුරුන් හෝ ලවා කරවන්නේයැයි කීම ඔහුගේ නොහැකි-යාව පිළිගැනීමකි.

''මා කවුද කියා දැනගන්න ඕනැ නම් උඹ වගෙ පෙරේත දණ්ඩෙකුට වරම් දීපු එකාගෙන් අහල බලාපන්. උඹ දූන ගතින් මා සමන් දෙවියන්ගෙ හොඳ යහළුවෙක්. ඇත්ත නැත්ත අහල බලපන් උඹට වරම් දුන් එකාගෙන්.'' මා කියේ මගේ දෑස් කෙළින්ම ඔහුගේ දෑස් වෙත එල්ල කර ගෙනය. මා ඔහු දෙසට එල්ල කළේ තද බැල්මකි.

නිලමෙගේ බැල්ම රුදුරු කමින් ටිකක් අඩුවිය. ඔහුගේ මුහුණෙහි විමතිය පිළිබිඹුවිය. මගේ දෑස් ඔහුගේ දෑස් වෙතින් ඉවතට නොගෙනම තවත් තදින් බැලුවෙමි. නිලමෙගේ ගරු සරු නැතිකමින් මා කෝප වූ බවක් දක්වමින්.

''උඹට තවත් දැනගන්න ඕනෑද? එහෙනම් අහගනින්. මා විෂ්ණු දෙවියන්ගෙ යාලුවෙක්. උපුල්වන්, කතරගම කන්දෙකුමාර, විභීෂණ දෙවිවරුන්ගෙ නෑයෙක් සූනියම දේවතාව හොඳම යාලුවෙක්. තවත් ඕනෑද? දැනට ඔය ඇති. උඹත් හොඳ කෙරුම් කාරයෙක් නම් මා කවුද කියල උඹම හොයාගනින්.''

නිලමෙගේ නොහොත් කොග්ගල මහතාගේ මුළු ගතම වෙව්ලා ගොස් මුහුණෙහි නිවට නියාළු බවක්ද පිළිබිඹුවිය.

ඔහු සැකමුසු බැල්මක් මා වෙත හෙළා ''හොඳයි, මා එහෙනම් ගිහින් බලාගෙන එන්නම්.''

කොග්ගල මහතාගේ සිරුර ස්වභාවික විය. දෑස්වල කඳුළු පිරුණි. දකුණු අතේ ඇඟිලි වම් අතින් පිරිමදිමින්, අතිනත මිරිකමින් මා දෙස අහිංසක බැල්මක් හෙළුවේය.

''මිස්ටර් මාකස්, කොයි වේලෙද ආවෙ? බලන්නකෝ මේ කාලකන්නිය ආයෙත් ඇවිත් කරදර කරණව. මාස දෙකක විතර ඉඳල මා දැනගෙන හිටියා මූ බැම්මෙන් මිදිල බව. මිස්ටර් මාකස් බලන්න මා හැමදාම ගියෙත් ඒ නිසයි. මිස්ටර් මාකස් හමුවුනේ නැති දාට මට හරිම අසහනයක් දැනුණා. මා හිතුව මූ මිස්ටර් මාකස්ට බය ඇති කියල. හේතුව මට හරියටම කියන්න බැහැ. ඒ සමහර විට අර යන්තරය බැන්ද දවසෙ වූ සිද්ධිය නිසා වියහැකියි. මූ බලාගෙන ඉඳල තියෙන්නෙ මිස්ටර් මාකස් මෙහෙන් යනතෙක්. එදා හැන්දෑව ගෙදර ආ බවක් මට මතක නැහැ. මා ගෙදර ඇවිත් තියෙන්නෙ සිහියෙන් නොවෙයි. එදා සිද්ධීන්ගෙන් මට මතක ඇති අන්තිම සිද්ධිය තමා මිස්ටර් මාකස් බස් එකට නැග්ග එක. ඊට පසුව මොනව වුනාද කියල මා දන්නෙ නැහැ.'' කොග්ගල මහතා කිවේ [illegible] දුක්මුසු ලීලාවකිනි

කොග්ගල මහතාට නිලමෙ ආවේෂ වූ දින සිට මේ දක්වා පියවි සිහිය ලත් පළමු වතාව එය බව කොග්ගල මහත්මියද කීවාය. එදින පටන් මේ වනතෙක් කිසිම අහරක්ද ගෙන නැත. ඉඳ හිට බලෙන් පෙවූ වතුර ටිකක් හෝ පැඩම් ඉස්ම ටිකක් පමණි ඔහුට ලැබී ඇත්තේ. එයද පොවා ඇත්තේ ඉතා අමාරුවෙන් ය.

කොග්ගල මහතා කතා කරණු ඇසී කොග්ගල මහත්මියද කාමරයට දුව ආවාය.

''අනේ මහත්තය මෙයාට දවස් ගණනක ඉඳල අහරක් නැහැ. මා හනික කැම ටිකක් බෙදාගෙන එන්නම්'' යි කිවාය.

''මට කැම නම් කිසිම රුචියක් නැහැ පද්මා වතුර ටිකක් ගන්න බොන්න, දරුවො කැවද?'' යි කොග්ගල මහතා කියේ තරමක් ආයාසයෙනි. කොග්ගල මහත්මිය කුස්සිය පැත්තට ගියාය.

''මිස්ටර් කොග්ගල කොහොමද දැන් ඇඟට පණ නැතිව ඇති නොවෙද? අද තමා මා කොළඹ ඉඳල ආවෙ. මිස්ටර් කොග්ගලට අසනීපයි කියල ආරංචි වුන හැටියෙම මා මෙහි ආව. මා කල්පනා කළා මා යද්දී හොඳට හිටිය මිනිහ කොහොමද මේ හිටි හැටිය අසනීප වුනේ කියල.''

කොග්ගල මහත්මිය කැම පිඟානක්ද අතැතිව කාමරයට ආවාය. කොග්ගල මහතාගේ දරුවෝද තම පියා අසලට වී සිටි අත්දම ළඟන්නා සුළුවිය. ශාරීරිකව එකම ගෙදර ජිවත් වුවද දින ගණනක් තම පියාගෙන් වෙන්ව සිට නැවත එකතු වීම මුළු පවුලේම ප්‍රීතිමත් අවස්ථාවක් විය. දරුවන් ලං කරගෙන කොග්ගල මහතාද ආහාර ගත්තේ ඉමහත් සතුටකිනි. ආහාර ගෙන අවසන්ව ටික වේලාවක් සතුටු සාමිචියෙන් ගතවිය. එහෙත් එම සතුට වැඩි වේලාවක් නොතිබිණ.

හාන්සිවී සිටි කොග්ගල මහාතා යටිගිරියෙන් හුවක් කියා මෙට්ටය මත දිගාවී දර දඬුවිය. දතින් දත් වසාගෙන යටිගිරියෙන් කෑ ගැහුවේ ඉමහත් වේදනාවකින් මෙනි. ඉන් පසු හඬා වැලපීමට පටන් ගති.

"නිලමෙ ආවද? නිලමෙ මහ ලොකු ගණන්කාරයෙක්නෙ. ඇයි මේ අඬන්නෙ? වැලපෙන්නෙ? නිලමෙට මොකද වුණේ?" යි මම ඇසුවෙමි.

"බුදු මහත්තයෝ මට සමා වෙන්න. මා නොදනුවත්ව යි මහත්තයට තර්ජනය කළේ. මීට පස්සෙ මා කවදාවත් මහත්තයාගෙ මූණ බලන්නෙ නැහැ මට බලන්න බැහැ. මා නොදන කළ වරදට සමාවන්න බුදු මහත්තයෝ" කියමින් නිලමේ දොහොත් මුදුන් දී වැන්දේය.

"ඔහොම තමා නිලමෙ අටලෝදහමෙ හැටි. උඩ පැන්නොත් බිම වැටෙනව, නොවේද? මා නිලමෙට සැර වැර වුනේ නැහැ. තර්ජනය කළෙත් නැහැ. මා දන්නව මගේ බලතල. නිලමෙට බොරුවට තර්ජනය කරල මට වැඩක් නැහැ. මා නිලමෙට අනුකම්පා කරණව. නිලමෙ පෙළා දුක් දෙන්න මට වුවමනාවක් නැහැ." මා නිලමෙට දෙසුමක් කළේ ඔහු මා වෙත නමා ගැනීමටය.

"කියන්න මහත්තයො, කියන්න බුදු මහත්තයො මා කළ වරදට මට සමා වෙනව කියල. මා සමාව ලබා ගන්නවද බලන්න කෙනෙක් ඇවිත් ඉන්නව. මට සමාවක් ලැබුනෙ නැහැ කියල ඒ ඇත්ත ගිහින් කීවොත් මා ඉවරයි.' නිලමේ නැවතත් බැගෑපත් වී මට වැන්දේය.

"හොඳයි කමක් නැහැ. නිලමෙ නොදන කළ වරදට සමාව දෙනව. මීට පස්සෙ මා කියන විදියට ඉන්න ඕනැ. මා කියන දෙයක් කරන්න ඕනැ." මම නිලමෙට' සමාව දුනිමි.

නිලමේ සැනසුම් සුසුමක් හෙළා හිස උඩුකුරුව හරවා වහලය දෙස බලා හිස නැමුවේය. අපට නොපෙණි එහි ඉහලින් සිටි යමෙකුට නිලමෙ එසේ ආචාර කළේයැයි මට සිතිණ.

''නිලමෙ දූන් කියනව කොහෙද ගියේ කියල.'' මා කළේ නියෝගයෙකි.

''මා ගියා කතරගම.'' දොහොත් පපුව මත තබාගත ඇස් පියාගෙන නිලමෙ පිළිතුරු දුනි.

''ගිහින් මොනවද කළේ?''

''මා ගියේ කතරගම දෙවි හාමුදුරුවන් වහන්සෙ බැහැදකින්න.''

' ඉතින් බැහැ දැක්කද?''

''නැහැ දේවාලෙ අහලක වත් යන්න බැරිවුණා.''

''ඉතින් හැරිල ආවද?''

''හැරෙන්න ලැබුනෙත් නැහැ.''

''එහෙනම් මොකද වුනේ?''

''මා යනකොටම කාලි මැණියො මා දිහාවට.'' කඩාපැනාන.''

''ඉතින්?''

''ගිනි කස පහර තුනක් ගහල කිව . . . . (නිලමෙ හඩා වැලපෙයි) මීට පස්සෙ මහත්තයට සැර වැර වුනොත් මාව අළු කරණව කියල. මෙ බලන්න මගේ පිට දිහා. කසපාර වැදුන තැන් තාමත් පිච්චෙනව. (ඔහු ඇලයකට හැරි පිට පෙන්වයි. පිට දිගට පාර තුනක් පලු මතුවී තිබිණ) බුදු මහත්තයො මා මහත්තය කියන ඕනැ විදිහකට ඉන්නම්, මට වද දෙන්න එපා.'' නිලමෙ නැවතත් මට වැන්ද.

' මා කියන දේ කරණව නම් නිලමෙට වද දෙන්නෙවත් හිරිහැර කරන්නෙවත් නැහැ. මගේ නියමය නම් තමුසෙ කොග්ගල මහත්තය අත් හැරල යන්න ඕනැ. හොඳයි තමුසෙ යනවද?''

"අනේ බුදු මහත්තයෝ ඒක නම් කියන්න එපා. ඒක නම් කරන්න බැහැ. වෙන ඕනෑ එකක් කියන්න මා කරන්නම්. මා තුන් අවුරුද්දක් දහදුක් විඳල වරම් ගත්තෙ කොග්ගලට ආවේශ වෙන්න. මා මේ ආත්මයෙ ඉපදිල ඉන්නෙත් ඒ අදහසින්මයි."

"තමුසෙ කලින් කිව්වෙ කොග්ගල මහත්තය අරන් යන්න වරම් ගත්තයි කියල. දැන් කියනව කොග්ගල මහත්තයට ආවේශ වෙන්න වරම් ගත්තයි කියල. ආවේශ වෙන්න වරම් අරන් කොග්ගල මහත්තය අරන් යන්නෙ කොහොමද?"

"ඒක සුළු දෙයක් මහත්තය. භූතයෙක් යම් කෙනෙකුට ආවේශ වුණොත් ඒ තැනැත්තට ඕනෑ විදිහට නොවෙයි එයා වැඩ කරන්නෙත් හැසිරෙන්නෙත්. භූතයට ඕනෑ විදිහටයි. ආවේශ වූ ශරීරය හසුරවන්නෙ භූතයයි. මා ආවේශ වෙල ඉන්නෙ කොග්ගලගෙ ඇඟට නොවෙයි. සිතටයි. කොග්ගලගෙ සිත යටපත් කරල එතැනට මගේ සිත ආවේශවෙලා. මේ කතා කරන්නෙ කොග්ගල නොවෙයි. කතා කරන්නෙ ... හිත් බණ්ඩාර. කොග්ගලගෙ කටින් කතා කළාට ඒ කට අයිති මටයි හසුරුවන්නෙ මමයි. කොග්ගලට මා ආවේශ වෙල ඉන්නතුරු එයා කරන දේට වගකීම ඔහු මත පවරන්න බැහැ; වගකිවයුත්තා මමයි. කොග්ගලට මා ආවේශ වෙල ඉන්නකොට එයා ආහාර ගන්නෙ නැහැ. ඒ මට ආහාර ඕනෑ නැති නිසයි. මා වැන්නන්ට ආහාර ඕනෑ නැත්තෙ අපට ශරීර නැති නිසයි. ආහාර ගන්නෙ නැතිව ටික කලක් ඉන්නකොට කොග්ගලගෙ ශරීරය මැරිල යයි. එතකොට මගේ අදහස සාර්ථකයි.

කොග්ගල ගෙනියනවය කීවෙ මාව අල්ලල නැවැත්තුවෙ නැති නම් මා දුවනව. දුවන්නෙ මා නොවෙයි. කොග්ගලයි දුවන්නෙ. මා ළිඳකට පනිනව. නැතිනම් කන්දකින් පල්ලට පනිනව ඒත් නැතිනම් පාරෙ දුවන කාර් එකක් හෝ බස් එකක් හෝ කෝච්චියක් හෝ

ඉස්සරහට පනිණව. එතකොට ඒ පනින්නෙ කොග්ගලගෙ ශරීරයයි. ඒ ශරීරය කුඩු පට්ටන් වුනාම කොග්ගල ජිවත් වෙලා ඉවරයි. (කොග්ගලගෙ මුහුණෙ මඳ සිනාවක් මතුවෙයි.) එතකොට මා කොග්ගලගෙ ශරීරය අතහැරල ඔහේ යනව. එතකොට කොග්ගලගෙන් පලි ගැනීමත් අවසානයි. හහ් ... හහ් ... හා ... හේ ඉමහත් ප්‍රීතියෙන් වෙගවත්ව සිනාසුනා.

තත්ත්වයේ බරපතල කම මට වැටහි ගියේ එවිටය. පලි ගැනීමේ චේතනාව කොතරම් දරුණු දැයි මට නියම වශයෙන් වැටහි ගියේ ඉන් පසුවය. එහෙත් කොග්ගල මහතා කෙරෙහි නිලමේ මෙතරම් දරුණු වෛරයක් බැඳ ගැනීමට හේතුව කුමක් දැයි දැන ගැනීමට මට උවමනා විය. මගේ කුතුහලය ඇවිස්සිණ. මගේ සිතෙහි මෙතෙක් වේලා හොල්මන් කළ පැනය නිතැතින් ම මගේ මුවින් පිටවිය.

''ඇයි, නිලමෙ කොග්ගල මහත්තය එක්ක ඔය තරම් තරහ ?''

''තරහ ? තරහ නොවෙයි මහත්තය කොග්ගලට මා ජාති ජාතිත් වෛර කරණව. පලි ගන්නව. ඒ පලිය ගන්න තමා මා ඇවිත් ඉන්නෙ.''

''හොඳයි, හැම දේකට ම හේතුවක් තියෙන්න ඕනැනේ. ඔය තරම් ජාති ජාතිත් වෛර කරන්න කොග්ගල මහතා කළ වරද මොකක්ද?

ඒක මහ දිග කතාවක් මහත්තය. ඒ කතාව ඇහුවොත් මම නොවෙයි කොග්ගල මරන්නෙ මහත්තයයි. ඌ ඒ තරම් නරක එකෙක්. වංචා කාරයෙක්. මා මැරෙණ වෙලාවෙ ඌ මට දුන් පොරොන්දුව කඩ කළා. මා රැවැට්ටුවා. බොරු කළා. පලිය මා ගන්නවා ගන්නවා ම යි.''

මෙතෙක් වේලා කාමරය අසලම ආලින්දයේ වාඩිවී තවත් දෙතුන්දෙනෙකු සමඟ කතාකරමින් සිටි කොග්ගල මහත්මිය කාමරයට දුව ආවාය. ඇය දුටු කොග්ගල ආවේශවී සිටි නිලමේ වියරු වූ බවත් පෙනිණ. නිලමෙ දූස් කරකවා ඇය දෙස රවා බැළුවේය.

"අනේ මහත්තය, ඔය මිනිහ කියන ඒවා ගණන් ගන්න එපා. ඔය මිනිහ මහ අලි බොරු කාරයෙක්. කට ඇරියොත් බොරු. මහත්තයට දැන් නිදි මතත් ඇතිනෙ. මෙන්න මේ කොට්ටයත් දාගෙන ඔය හාන්සි පුටුවෙවත් නිදා ගන්න." කියා ඕ කොට්ටයක් මා අත තැබුවාය.

කොග්ගල නොහොත් නිලමේ වියරුවෙන් කෑ ගැසුවේ "තෝ? තෝ ආවද මගෙ මූණ බලන්න? කොග්ගල ඉවර කරල ඊට පස්සෙ ගෙනියන්නෙ තෝ තමයි, කොග්ගල කෑවෙ තෝ තමයි."

කොග්ගල මහත්මිය කාමරයෙන් පිටත සිටියදී නිලමෙ නොයෙක් දේ කිවද ඇය කිසිවක් නොකියා නිලමෙ කොග්ගල සමඟ වෛර බැඳීමට හේතු විමසූ විට එම කතාවට ඉඩ නොදී කොග්ගල මහත්මිය හරස් කැපීමට හේතුවක් තිබිය යුතුය යි මම සිතුවෙමි. මෙහි ලොකු රහසක් තිබිය යුතුය.

නිලමේ කෝපවී සිටි බැවින් ඒ ගැන ඒ වේලාවේ විමසීම නුසුදුසු යැයි මම සිතුවෙමි.

නිලමේ ගේ තර්ජනයත් සමඟම කොග්ගල මහත්මිය කාමරයෙන් පිටවී ගියාය. ඇය පිටවූ පසු නිලමේද නිහඬවිය මගෙ සිතේ ඇතිවූ කුතුහලය දුරු කර ගන්නා තුරු මා නො ඉවසිලිමත් වීමි.

"නිලමේට නිදිමත නැතිද?" මා ඇසුයේ නිලමේ ගේ කෝපය තුනී වී ඇතිදැයි දැනගැනීමටය.

''ඔය මහත්තයලාට තියෙන නිදිමත, මහන්සිය, වෙහෙට්-ටුව ආදී කිසි දෙයක් මේ අපට නැහැ මහත්තය. ඒවා ඇති වන්නෙ ශරීර ඇති අයටයි. අපිට ශරීර නැති බැවින් අපට එබඳු ශාරීරික වේදනා නැහැ. මහත්තයල නිදිමත නම් නිදා ගන්න. මා සද්ද නැතිව. ඉන්නම්'' යැයි නිලමෙ කියේ මගේ සිතැගි දත්තෙකු සේය.

ඒ සමඟම නිලමෙ ඔහු අවට සිටියවුන් දෙස බලා ''මහත්තය නිදා ගත්ත අතරෙ උඹල මට කෝචෝක් කරන්න ආවොත් වැඩ වරදියි'' කිවේ අණතුරු හැඟවීමක් ලෙසය.

''මා නිදා ගත්තම ඔයගොල්ල නිලමෙ එක්ක කතාවට යන්න එපා'' කියා ඉඟියක්ද කළෙමි.

සුපුරුදු යහන නොමැතිව හාන්සි පුටුවක වකුටුව් නිදා ගැනීම අපහසුවක් වුවද මගෙ ජීවිතයේ කවදාවත් නොලත් අත් දැකීම ලබා ගැනීමට ලත් අවස්ථාව ඒ අපහසුවට වන්දියක් යැයි සිතා සිත සනසා ගතිමි. එහෙත් නිදි දෙව් දුවගේ පැමිණීම නොසිතූ ලෙස පමාවිය. නිදි ලොවට පිවිසෙනු වෙනුවට කල්පනා ලොවේ මම අතරමං වීමි.

මිය ගිය අය ජීවත්වන අයට ආවේශව් තම ජීවිත කාලයෙ සංසිඳවා ගැනීමට නොහැකිවූ ආශාවන් සන්සිඳවා ගන්නා බව මා අසා ඇත. එහෙත් දැක නැත. ඊට අවස්ථාවක් නොලැබිණ. එබැවින් අහම්බෙන් ලත් අවස්ථාවෙන් අපහසු-කම් අතරින් වුවද ප්‍රයොජන ගැනීමට තීරණය කළෙමි.

''මහතතය තාම නිදි නැතිද? නිදාගන්න මහත්තය. හෙට උදේ පාන්දරින්ම අවදිවන්න, අර මංඳූති අවදිවන්න කලින්. එතකොට මා කියන්නම් කොග්ගල කළ කැත වැඩේ මොකක්ද කියල.'' නිලමෙ කියේ මා නිදිවරා සිටි බව දත් සේය. කොග්ගල සමඟ වෛර බැඳීමට හේතුව කිමට පොරොන්දුවීම මට ඉමහත් සැනසීමක් විය. ඒ හා සමඟම මම නිදි ලොවට පිවිසුනෙමි.

(2)

දෙවැනි දවස

නිලමෙගේ මිනිස් දිවිය.

පසු දිනට පහන්විය. අවදිවූ විගස මගේ නෙත් යොමු වූයේ නිලමේ වෙතය. කොග්ගල දූස්පියා දූත් පපුව මත තබාගෙන මෙට්ටය මත උඩුකුරුව සයනය කරයි. නිලමේට කතා නොකරම මම කාමරයෙන් පිටවීමි.

මුහුණ සෝදාගෙන තේ පානයෙන් පසු නිලමේ බැලීමට කාමරයට ගියෙමි. ඔහු කලින් සිටි ඉරියව්වෙන්මය. මා කාමරයට ඇතුළුවත්ම ඔහු දූස් පියායගනම මට කතා කළේය.

"හා මහත්තය ආවද? මා පොරොන්දු වුනා වගේම මා කිසි කරදරයක් නොකර සිටිය. මහත්තයට මගෙන් කිසි කරදරයක් උනේ නැහැ නොවැ?" යි නිලමේ ඇසුවෙ ඉතාමත්ම සුහද ලීලාවෙනි.

"නිලමෙ හරි හොඳයි නෙ. ඊයෙ රෑ කාටවත් කිසි කරදරයක් කළේ නැති එක ලොකු උදව්වක්." මා කීවේ නිලමෙගේ සිත් දිනා ගැනීමටය.

"මට හිරිහැරයක් නැති නම් මගෙනුත් හිරිහැරයක් නැහැ. මට හිතුනොත් මා උදවු පදවුත් කරණව. ඔය කොග්ගල මහගෙ වගෙ නොවෙයි. දූත් බලන්න, මහත්තය මේ නිදිමරාගෙන කරදර විඳින්නෙ කොග්ගලට උදවු කරන්න. බලන්න ඒ ගෑණිගෙ කෙලෙහිගුණයක් තියෙනවද කියල. අඩු ගානෙ මහත්තයට මුහුණ සෝදන්න වතුර ටිකක් වත් ගෙනත් තිබ්බද. මහත්තයට ලිඳට යන්න සිදුවුනා මුහුණ සෝදන්න." නිලමෙ එසේ කීවේ ඇතැම් විට කොග්ගල මහත්මිය කෙරෙහි මගේ සිත බිඳවීමට වියහැකිය.

''කමක් නැහැ නිලමෙ. මට ලිඳට ගිහින් මුහුණ සෝදන එක අමාරුවක් නොවෙයි නෙ'' මා එසේ කියන විට මගේ සිතෙහි හොල්මන් කළ එක් දෙයකි. එනම් කාමරය තුළ සිටි නිලමෙ මා ලිඳට ගිය සැටි දුටුවේ කෙසේද යන්නයි.

දැන් නිලමෙත්, මාත් මිතුරෝය. නිලමෙගෙන් ඕනෑම විස්තරයක් අසා දැනගැනීමට හැකි බව මට පෙනී ගියේය. නිලමේ කොග්ගලගෙන් පලිගැනීමට පැමිණීමේ හේතුව මෙතෙක් මම නොදැන්නෙමි. ඒ ගැන නිලමේ සඳහන් කළ විට කොග්ගල මහත්මිය හරස් වූ සැටිද මට සිහිවිය.

මා කාමරයට පැමිණි පසු නිලමේ බලාගැනීමට මට භාර කළා සේ කාමරයේ සිටි අනෙක් අය කාමරයෙන් පිටවූහ· ඔවුන් ගියේ මුහුණ සේදීම, තේ බීම ආදිය සඳහාය.

මම නිලමේ ඇමතුවෙමි. ''නිලමේ, මම බොහොම වෙලා නිලමෙ ගැන ඊයෙ රෑ කල්පනා කළා, එක් අතකින් නිලමෙ තද අධිෂ්ඨාන ශක්තියක් ඇති කෙනෙක්, අනිත් අතට නිලමෙ හරි මෝඩයි. ඉතින් මට විසඳගන්න බැරි වුන ප්‍රහේලිකාව තමා. නිලමෙ කොග්ගලගෙන් පලිගන්න අදහස් කළේ ඇයි කියන එක, මා හිතාගෙන නිදගත්තෙ අද උදෙන්ම එය ගැන නිලමෙගෙන් අහන්න.''

''ඔය කතාව මහත්තය අහන්න ඉස්සරවෙල මා කියන්නයි හිතාගෙන හිටියෙ, ඒත් මට ඊට අවස්ථාවක් ලැබුනෙ නැහැ. දැන් හොඳ අවස්ථාව, ඔන්න එහෙනම් අහගන්න.

නිලමෙ දෑස් පියාගෙනම කතාව පටන් ගත්තේය.

''මහත්තය, මං උඩරට ... ... පළාතෙ හොඳ වැදගත් පවුලකට අයිති, උසස් පෙළපතකින් පැවතෙන කෙනෙක්. මිළ මුදල් අතිනුත්, වතුපිටි අතිනුත්, මට සෑහෙන තත්ත්වයක් තිබුන. කොටින්ම කියතොත් මං හොඳ වංශක්කාරයෙක්.''

''ඔව්, ඔව්, ඒ බව පෙණෙනව. ඉතිං කියනවකො කතාව''

'මගෙ වත්තෙ කොනේ කරාබු, ගම්මිරිස්, එනසාල්, පොල්, පුවක් ආදී හැම වගාවක්ම තිබුණා. මට කිසි දේකින් අඩුවක් තිබුනෙ නැහැ, ඒ පළාතෙ හැටියට මටත් ගමේ යම් කිසි තත්ත්වයක් තිබුණා, මට දුවක් හිටිය. මගෙ මැණිකෙත් හරි ලස්සනයි, හරි කරුණාවන්තයි. උයන්න, පිහන්න හොඳට දන්නව. මට හරි ආදරෙයි, මමත් ඇයට හරි ආදරෙයි මගෙ දුවට (අනුලාවතීට) මා පවුලෙ හැම කෙනෙකුටම වැඩි යෙන් ආදරය කළා, අපේ වතුපිටි වලින් ලැබුණ ආදායම ගෙදර වියදමට ඇරල යමක් ඉතිරි වුණා, ඉතිරිවුන හැම සතය ක්ම මං හරි පරිස්සමෙන් එකතු කළා, මං ඉතිරි කළ මුදල් ගැන මං විතරයි දැනගෙන හිටියෙ, අනිත් අය ඒ ගැන දැන-ගෙන සිටිය නම් ඉතිරි කරන්න ලැබෙන්නෙ නැහැනෙ මහත්තෙයො.

අපි හිටිය ගේ වැඩිය විශාල නැහැ, තරමක් පරණයි. පරම්පරාගත ගෙයක්. අපේ අත්තල, මුත්තල සිංහල රජ්ජුරු-වො වෙනුවෙන් සටන් කරපු අය, ඒ කාලෙ ඉඳලම අපිට තැනක් තිබුණ ... ... නිලමෙත් අපේ මුත්ත කෙනෙක් සැහෙන වී, කුරක්කන් කොගයකුත් නිතරම ගෙදර තිබුණ.'

එහෙනම් ඒව සුද්ධ පවිත්‍ර කරල තියන්නත් සැහෙන මහන්සියක් වෙන්න ඇති.

'මා එසේ කිවේ නිලමෙ මිනිස් දිවියක් ගතකළ කාලය තුල ගෙදං දෙර පිරිසිදුවෙන් තබාගත්තේද යන්න දැනගැනිම සඳහාය.

''හපෝ මහත්තය, මොනව සුද්ධ කරන්නද, ඕව සුද්ධ කළේ නැහැ කියල නැතිවෙන්නෙ නැහැනෙ, ඕව තියනවද නැද්ද කියල බලන්නවත් ලැබෙන්නෙ නැහැ. අනිත් එක ඕව අතු පතු ගාන්න කාටද වෙලාව තියෙන්නෙ, මැණිකෙට ගෙදර වැඩ නිසා එයාටත් වෙලාවක් නැහැ. දුව ඉස්කෝලෙ ගිය නිසා එයාටත් වෙලාඃක් නැහැ.''

'ඉතින් කාටහරි කුලියක් දීල කරවන්න තිබුන නොවැ' මං එසේ ඇසුයේ නිලමේගේ ගෙදර ඇති දේ පිට අයට හෙළි දරව් කිරීමට අකමැත්තක් තිබුනේද යන්න දැනගැනීමටය. සෑහෙන ආදයමක් තිබුන නම් ඒ වෙනුවෙන් වියදම් කළාට පාඩු නැහැනොවේද?''

''මොන එහෙකටද මහත්තයො එක එකාට අපිට ඇති දේ පෙන්වන්නෙ. තියෙන බව දැනගත්තම ඉල්ලන්න එනවනෙ.''

''ඉතින් ඔය තරම් යමක් කමක් තිබිලත් දන් පින් හෙම කෙරුවෙ නැතිද?''

''ඒවයින් අඩුවක් නැහැ මහත්තයො. හැම පෝයකටම පන්සලේ උපාසක දානයත් දුන්න. ඒකට නොවරදවාම මගෙ මැණිකෙත් ශත විසි පහක් තිහක් දෙනව. ඒ තියා මගෙ මැණිකෙ හැම පෝයකටම සිල් ගත්ත. උපාසක දානෙ උයන්නත් බොහොම මහන්සි උනා. ඉස්කෝලෙ නිවාඩු දවසකට පෝය වැටුනොත් දුවත් සිල් ගත්ත.''

''ඔය සිල් ගත්ත ඔක්කොටම දෙනවද ඒ උපාසක දානෙ?''

ඔව් මහත්තය කවුරුත් එක්ක සහභාගි වෙලා තමා දානෙ උයන්නෙ. උපාසක දානෙට සල්ලි වෙනම එකතු කරණව, සමහර දාට මගෙ මැණිකෙ තමා සල්ලි එකතු කරන්නෙත්. සමහර දාට දානෙ උයන්නෙත් අපේ ගෙදරමයි.''

''ඒ අතින් නිලමෙත් හුඟක් පින් කරන්න ඇති නේද?''

''ඔව් මහත්තය උපාසක දානෙ උයන්න මාත් උදවු වෙනව.''

''එදාට ගෙදරත් හරිහැටි උයන්න පිහන්න බැරිව ඇති නේද? ඔව් ඉතින් තමන් ගැන හිතන්නෙ නැතිව දානෙ ටික සූදානම් කරල දෙන එකත් ලොකු පිණක්නෙ. එදාට බඩගින්නෙ ඉන්නවද?''

''අනේ නැහැ. බඩගින්නෙ හිටිශෙ නැහැ. ඒ දානෙට උයාපු දෙයිප්ම අදික් කනව. වෙන කොහෙන් කන්නද? ගෙදර උයන එක නොකා? අනිත් එක අපිත් ඒකට සමමාදම් වෙල තියෙනවනෙ.''

''ඔව් නිලමෙ තර්කානුකූලව ඒක හරි. දානයක් දීමට කෙනෙකුට ආධාර වෙන එකත් පිණක්. දානය ලබාගැනීමත් දානය දීමට ආධාර කිරීමක්. එතකොට දන් ලබන තැනැත්තත් දන් දෙන තැනැත්ත වගේම පිණක් කරණව. නොවෙද නිලමෙ?''

''ඔව් එහෙම වෙන්න ඕනැ. අනේ මා දන්නෙ නැහැ මහත්තය මොන අදහසකින් ඕවා කියනවද කියල. මා සිල් නොගෙනම උපාසක දානෙ කාපු නිසාද දන්නෙ නැහැ.'' නිලමෙට මගේ ඇණුම් පදය තේරුම් ගියා සේය.

''නිලමෙ අටසිල් ගත්තෙ නැහැ කිව්ව නේද? අඩු ගානෙ පන්සිල්වත් රැකල තියෙනවද?''

''කව්ද. මැණිකෙද?'' මැණිකෙ පන්සිල් නොවෙයි හැම පෝයටම අටසිලුත් ගත්ත. හැම පෝයටම සිල් පවාරණ වෙල ඇවිත් මට පින් දෙනව. අනේ මගෙ මැණිකෙ රත්තරං කඳක්.''

''මැණිකෙ නොවෙයි ඔයි. තමුසෙ පන්සිල්වත් රැක්කද ජීවත්වෙල ඉන්දදි.?''

''අපෝයි ඔව්, මා කීප සැරයක්ම පන්සිල් අරන් තියෙනව. මගෙ අප්පච්චි මැරුණ දවසෙ මළ ගෙදරදී පන්සිල් ගත්ත. මට හොඳට මතකයි. තව ඔය දානෙ ගෙවල්වල හෙම ගිහින් තවත් කීප වතාවක්ම පන්සිල් අරන් තියනව.''

''එහෙනම් තමුසෙ ඒ කාලෙත් ඉඳල තියෙන්නෙ දූන් වගේ තමයි. වැඩි වෙනසක් නැහැනෙ.''

''ඔව් මහත්තය මා ඒ කාලෙත් ඒ තරම් දුක් වින්දෙ නැහැ. දැනුත් ඒ තරම දුකක් විඳින බවක් කියන්න බැහැ. කොග්ගලට ආවේශ වෙන්න වරං ගන්න දුක් වින්ද ටික විතරයි.''

''තමුසෙ තාම කිවෙ නැහැනෙ කොග්ගලගෙන් පලි ගන්න තැත් කරණ හේතුව.''

''ඔහොම ඉන්න කොට මගෙ දුවට දීගයක් හරි බින්නයක් හරි හොයන්න මා කල්පනා කළා. මට හිතට අල්ලන කවුරුවත් හොයාගන්න බැරිවුනා. මා මහ මසුරෙක්ය කියල කවුරුවත් කැමැති වුනේ නැහැ. එකක් දෙකක් හරියා-ගෙන ආවත් මගෙ දේපොල බෑණාගෙ නමට ලියන්න කිව්වා. ඉතින් මහත්තයො, මගෙ ඔය පරම්පරාවෙන් ආපු දේයි, මා හරිහම්බ කරපු ඒවායි ඔක්කොම මා මැරෙන්නත් කලින් වෙන කාටවත් පවරල මා නිකම් බලා ඉන්නෙ කොහොමද? ඒ නිසා මා කැමැතිවුනේ නැහැ.''

''ඒ දේ පොල තමුසෙ කාටවත් දෙන්නෙ නැතිව ඔය තරම් ආශාවෙන් තියාගෙන ඉඳල තමුසෙ මැරුණට පස්සෙ ඒව අරගෙනද පරලොව ගියේ?''

''අන්න ඒක තමයි මහත්තය මට තියෙන එක හිතේ අමාරුවක්. මට ඒව ගෙනෙන්න බැරිවුනා එකයි හිතට අමාරු. මා හිතුවෙ නැහැ ඔය තරම් ඉක්මනට මා මැරේවිය කියා. ඔය කාලෙ තමා කොග්ගල කියල ඉංග්‍රීසි ගුරුවරයෙක් ගමෙ ඉස්කෝලෙට පත්වෙල ආවෙ. මා බොහොම දුර කල්පනා කරල එයාට මගෙ ගෙදර නවාතැන් දුන්න.''

''තිලමෙ එහෙනම් පරම්පරා ගණනක් දුරට කල්පනා කරල තියෙනව.''

ඔව් මහත්තය. ඒ දරුවටත් යන කල දසාවක් තියෙන්න එපායැ. ටික කලක් යනකොට මා හිතුව වගේම අනුලාවති කොග්ගල එක්ක යාළුවුණා. මමයි මැණිකෙයි දෙන්නම මේ සම්බන්දෙ ගැන දැනගත්තට විරුද්ධවුනෙ නැහැ.''

''එහෙනම් කොග්ගල තමුසෙගෙ දූවට යාළු වෙලා දේපොල නාස්ති කළා?''

''නැහැ, නැහැ. එහෙම එකක් වුනේ නැහැ. අපි හිතා-ගෙන හිටියෙ කොග්ගල අපෙ දුව කාර බඳියි කියල. නමුත් එයා මගෙ දුව බැන්දෙ නැහැ. ඔය අතරෙ මට අසනීපවුනා. දවසින් දවය මා දුර්වල වුනා, මා හිතුව මා මැරෙයි කියා. දවසක් මා කොග්ගලයි මගේ දුවයි ළඟට කැඳවල ඇඳේම ඉඳගෙන කොග්ගලගෙ වම් අතයි, අනුලාවතිගෙ දකුණු අතයි එකට තියල මගෙ අතින් අල්ලාගෙන කිව ''පුතා කොග්ගල, මගෙ දුව උඹට බාරයි. මා නැති වුනත් උඹ මගේ දුව කාර බැඳ ගන්න ඕනැ කියල. ඒ වෙලාවෙ කොග්ගල කිව හොඳයි අප්පච්චි, මා පොරොන්දු වෙනව කියල. මට ඒ වචන ටික කණේ වැටුනම හරි සතුටකුත් සැණගාටුවකුත් ඇතිවුණා.

ටිකෙන් ටික මගෙ අසනීපෙ වැඩිවෙනකොට මා දැනගන්න මා වැඩි කල් ජීවත් නොවන බව. ඒ එක්කම මගෙ දේපොල වතුපිටි, ගැන ඉවසන්න බැරි ආසාවක් ඇතිවුණ. මෙව දාල යන්නෙ කොහොමද කියල හිතුණ මගෙ මැණිකෙත් ළඟ හිටිය. මැනිකෙ හිටියෙ අඩ අඩා යි. මගේ දූවත් අඩ අඩා සිටිය. කොග්ගලත් කඳුළු පිසදමනව මා දැක්ක. මගෙ මැණිකෙයි දූවයි ගැන තද ආදරයක් උපන්න.

ඒ මගෙ අන්තිම මොහොතයි. එතැනින් ඇවිත් තමා මා මේ ආත්මෙ උපන්නෙ.''

''තමුසෙ මැරෙණ මොහොතෙ වතුපිටි, දේපොල, අඹුදරුවන් ගැන සිතල වේදනාවකුත් තන්හාවකුත් ඇතිවෙල මළ පෙරේතයෙක් වෙල උපන්න. එහෙම නොවේද?''

''අනේ නැහැ මහත්තය, එහෙම කියනන එපා. මට අනුකම්පා කරන්න. මා මේ ආත්මෙ උපන්නට මළ පෙරේත-යෙක් නොවෙයි. මටත් යම් කිසි බලතල, පුළුවන්කාරකම් තියෙන අයෙක්.

මහත්තය මට ඔහොම කතා කළාට වෙන කෙනෙක් හෙම කතා කරන්නෙ නැහැ. එහෙම කතා කරල යහතින් යන්න දෙන්නෙත් නැහැ. ඉතින් මා බලාගෙන හිටිය කොග්ගල මගෙ දුව කාර බදිනතුරු. ඒක සිදු වුනෙ නැහැ. ටික කලකට පස්සෙ කොග්ගල වෙන පළාතකට මාරුවක් අරගෙන ගියා ඒ ගියාට පසු වත් මා නිතර ගියා කොග්ගල බලන්න. මා හිතුව කොග්ගල පසුව වත් මගේ දුව කාර බදියි කියල.

ඔහොම ඉඳල කොග්ගල දූන් ඔය ඉන්න මරදූති කසාද බැන්ද. එදා තමා මා කොගලගෙන් පලි ගන්න වරං ගන්න ගියෙ. කොග්ගලට ආවේශ වෙන්න වරම් ගන්න මට දහදුක් විඳින්න සිදුවුණා. තුන් අවුරුද්දක් දාස මෙහෙවර කළාට පස්සෙ වරම් ලැබුණ. එදාම ගියා කොග්ගල සොයාගෙන. ගෙදරට ගිහින් කොග්ගලගෙ හිත බිය වද්දන්න නොයෙකුත් හොල්මන් කළා. සති දෙකකට විතර පස්සෙ දවසක් හැන්දෑවෙ ගොම්මන් වෙලාවෙ මට කොග්ගල හමුවුණා ගෙපිලිකන්නෙ තනි ව ඉන්නව. වටින් ගොඩින් ඇදිරි වැටිගෙන එනකොට කොග්ගලට පෙනෙන්න මා එයා ලහට ගියා. මා දුටු හැටියෙ කොග්ගල හොඳටම බයවුනා. මිනිහට ඉබේම කෑ ගැහුණා. මිනිහ හූ කිව්ව. ඒ එක්කම සිහි විකල් වෙලා සිහි නැතිව වැටුණ. මාත් බලාගෙන හිටියෙ ඔය අවස්ථාව එන තුරු තමා. මා ඔහුට ආවේශ වුණා. ඊට පස්සෙ ඒ වෙලාවෙ ඉඳල කොග්ගල මගෙ අණ සකට යටත්. මා බලාපොරොත්තු වුනේ නම් මා දුටු හැටියෙ බයටම කොග්ගල මැරේවිය කියායි. නමුත් එහෙම වුණේ නැහැ. මා අදහස් කළේ කොග්ගල ගෙන ගිහින් මුහුදට පනින්න. ඒ ටික කරගන්න ලැබුණේ නැහැ. අහල පහල අය එකතුවෙල කොග්ගල අල්ලල බැඳ දැම්ම. කොහොම උනත් ඇත්ත කියන්න ඕනෑ මහත්තයා ඒ පළාතෙ ඉන්නව හරි දක්ෂ කට්ටඩි. උන් මාව අල්ලල අවුරුදු හතකට දින තියල බැඳ දැම්ම. බන්දනය කරල ගිහින් දැම්මෙ සන්දර වලට. අවුරුදු ගණන ගත වුනාට පස්සෙ ඒ බැම්මෙන් මා අත්මිදුණා.

බැම්මෙන් මිදුණට පස්සෙ ලංකාවෙ හැම අස්සක් මුල්ලක් නැර මා කොග්ගල හෙව්වා. මා දන්න කොග්ගලගෙ නෑ දෑ ගෙවල්වලට ගිහින් ඒ අයගෙ කතාවලට කන් දීගෙන හිටිය කොග්ගල ඉන්න තැනක් හොයාගන්න. අන්තිමේදි දවසක් කොග්ගලගෙ අයියාගෙ ගෙදරදී මා අහගෙන හිටිය කොග්ගල ලුනුගල ඉස්කෝලෙ උගන්වන බව. මා මෙහාට ආව කොග්ගල හොයාගෙන, ලුනුගල ඉස්කෝලෙ උගන්-වනවය කිව්වට කොයි ඉස්කෝලෙද කියල මා දැනගෙන හිටියෙ නැහැ. පළාත හොයාගත්තෙත් බොහොම අමාරු-වෙන්. හොයා ගන්නම මාස ගණනක් ගතවුනා. මෙහාට ඇවිත් හැම ඉස්කෝලයක් ගානෙම ගියා.

''ඕක ඔයතරම් අමාරු දෙයක්යැ. අධ්‍යාපන අධ්‍යක්ෂ තුමා හමුවෙල එයාගෙන් ඇහුව නම් කොග්ගල කොයි ඉස්කෝලෙද උගන්වන්නෙ කියල, එයා කියයි.''

''ඒ ඇත්තොත් අපිට ඒ තරම් ලොකු අය නොවෙයි මහත්තය, ඒ වුනත් ඒ අයට කතා කරන්න අපට ශරීරයක් නැහැනෙ. කාට හරි ආවේශ වෙල තමයි කතා කරන්න ඕන. ඒකත් ඒ තරම් ලේසි වැඩක් නොවෙයි.''

දවසක් සවස් වරුවෙ මා දැක්ක කොග්ගල කඩ මණ්ඩියෙ ඉඳල ගෙදර යනව. මට ඒ වෙලාවෙ ඇතිවුණ සන්තෝසෙ කියල නිම කරන්න බැහැ මහත්තය. (කොග්ගල තොල කට ලෙවකෑව.) මා එදා පටන් කොග්ගලට ආවේශ වෙන්න සුදුසු මොහොතක් බල බලා පස්සෙන් ම ගියා. මා කොග්ගලට කිට්ටුකළ වෙලාවෙ මට දැණුන කොග්ගල ටිකක් බියෙන් වගෙ වට පිට බැළුව. ඒ වුනත් මට එයාගෙ ඇඟට ආවේශ වෙන්න තරම් එයා බයවුණේ නැහැ. සමහරවිට ඒ වෙලාව දවල් වෙලාවක් නිසා' එයා මාව දකින්න නැහැ.

ඊට පසුවදා ඉස්කෝලෙ අවසන් වෙල කොග්ගල කෙළින්ම ගෙදර ගියේ නැහැ. ගියේ මහත්තය බලන්න

මාත් පස්සෙන් ම ගියා. එදා තමයි පළමු වරට මා මහත්තය දැක්කෙ. මහත්තයගෙ ගෙදරට කොග්ගල යනකොට මා ගියෙ කොග්ගල ළඟින්මයි. අපි දෙන්න මහත්තයගෙ වත්තට ඇතුළුවෙන ගේට්ටුව ළඟට යන කොට ම මහත්තය ගේ ඇතුළෙ ඉඳල එළියට ආව. මහත්තය දැක්ක ම මට හරි බයක් ඇතිවුණා. ඒ මක් නිසා ද කියල මට තේරුණෙ නැහැ. මහත්තය ජීවත් වෙන වාසස්ථානෙ ළඟට යන්නත් මා බයවුණා. කොග්ගල ආපසු එනතුරු මා ගේට්ටුව ළඟ බලා සිටිය. කොග්ගල ටිකක් වෙලා කතා කර කර ඉඳල ගෙදර ගියා. මාත් කොග්ගල පස්සෙන්ම ගෙදර ගියා.

මගේ අදහස වූයේ නිලමෙට පින්දී එම ආත්මයෙන් අත්මුදවීමය.

''එදා රෑ මා ගියා මගෙ යාළුවො හමුවෙන්න. ඒ අය මා කොග්ගල හොයන කාලෙ හමුවෙලා දැන ඇඳින ගත්ත අය. ඒ අය බොහොම දෙනෙක් මේ පලාතෙම අය නිසා මා හිතුව ඒ අය මහත්තය දන්නව ඇති කියා. ඉස්පිරිතාලෙ වත්තෙ සැරිසරණ කිප දෙනෙක්ම කිව හරි කරුණාවන්තයි, ඒත් මහත්තයට බොරුව පෙන්වන්න බැහැ කියල. මහත්තය යකෙකුටවත් බයත් නැහැ කිව. මහත්තයව ආරක්ෂා කරණ බලගතු අය කිප දෙනෙක්ම ඉන්නව කීව. ඒ නිසා මහත්තය ගෙන් ප්‍රවේශම් වෙන්න කිව. බැරිවෙලා වත් මහත්තයත් එක්ක හැපෙන්න එපා කියලත් කිව.''

''නිලමෙ දැන දැනත් ඇයි මා එක්ක ඊයෙ හැප්පෙන්න ආවෙ?'' මා නොදත් කිසියම් ගුප්ත බලවේගයන් මා ආරක්ෂා කරණ බව මා නොදත් නමුත් නිලමේ දත් නිසා මට අළුත් ආත්ම විශ්වාසයක් ඇතිවිය.

''කවුරුත් කේන්ති ගියාම මෝඩ වැඩ කරණවනෙ මහත්තය. ඒව දැන් අමතක කරල දාන්න, මා මහත්තයට මට පුළුවන් ඕනැම උදවුවක් කරන්න ලෑස්තියි.''

''අන්න හොඳා නිලමෙ. මාත් නිලමෙට මට හැකි තරමින් උදවු කරන්නම්, හැබැයි මා කියන දේ හරියට කරන්න ඕනැ. අහන දේට නිලමෙ දන්න තරමින් ඇත්ත ඇති සැටියෙන් කියන්න ඕනැ. මට ඕනැ කරනව භූත ලෝකය ගැන විස්තර දැනගන්න. නිලමෙ භූත ලෝකයෙ කෙනෙක් නිසා නිලමෙට පුළුවනි මට ඒ උදව්ව කරන්න.''

''හොඳයි මහත්තය මා දන්න තරමින් මහත්තයට ඕනැ විස්තරයක් කියන්නම්. ඉස්සර වෙලාම මා මගෙ අත් දැකීම් කියන්නම්. මා කොග්ගල හොයාගෙන මෙහාට ඇවිත් ආවේශ වෙන්න සුදුසු වෙලාවක් එනතුරු කොග්ගල පස්සෙ ගියානෙ ඒ කාලෙ හැමදාම කොග්ගල මහත්තය බලන්න ගියා. ඒ යනකොට මාත් ගියා. හැබැයි මහත්තය කිට්ටුවට ගියෙ නැහැ ඈතින් ඉඳන් බලා හිටිය. මහත්තය හැසිරෙන හැටි කියන කරණ දේ ඇහුවම දැක්කම වෙනත් අය මහත්තයට සලකන හැටි දැක්කම මටත් මහත්තයට ටිකක් බය ඇතිවුණා. ඒ අනුව මට තේරුම්ගියා කොග්ගල මහත්තය සමග ආශ්‍රයට වැටිල ඉන්න තුරු මට කොග්ගලට ආවේශ වෙන්න බැරි බව. ඒ නිසා මා බොහොම වීරිය කළා කොග්ගල මහත්තයගෙන් වෙන් කරන්න. ඒකත් අමාරු වුණා. හැමදාම ඒ මිනිහ මහත්තය බලන්න යනව. ඒ අතර දවසක මා අහගෙන හිටිය කොග්ගලගෙ ගෑනිට කොග්ගල කීව එයාට අසනීප වුනොත් මහත්තයට එන්න කියන්න කියල. ඒකත් මට ඇල්លුවෙ නැහැ. මා ඒ ගෑනිවත් බය ගන්නල ලෙඩ කරල අයින් කරන්න අදහස් කළා. ඒ ගෑනි ගෑනියෙක් නොවෙයි යක්ෂණියක්. අපි වාගෙ ඇයන්ට බැහැ ඒකිව බියවද්දන්න. මාත් ඔහෙ ඉතින් අවස්ථාවක් එනතුරු බලා හිටිය.

මා කොග්ගලගෙ පස්සෙන් යන කාලෙ එක දවසක් කොග්ගල මුළු දවසම ගත කළේ මහත්තයත් එක්ක. එදා සවස මහත්තය බස් එකක නැගිල ගියා යන්න. කොග්ගල මහත්තය 'කලින් කීවෙ කොළඹ යනව කියල මහත්තය බස් එකට නැංග හැටිමය මා කොග්ගලට ආවේශ වුණා.

මා කල්පනා කළා කොග්ගලත් අරගෙන බස් එකට පණින්න. ඒත් ඒක ඒ තරම් ලේසි වුනේ නැහැ. එදා තමයි මාස ගණනක් මා බලාපොරොත්තු වුන අවස්ථාව මට ලැබුණේ. ඒ ආ ගමන තමා මේ ඉන්නෙ. දැන් නම් කොහොම කිවත් මා නම් යන්නෙ නැහැ. කොග්ගල ගෙනියනව ගෙනියනවමයි.

නිලමේගේ කතාව ඇසූ මට තත්ත්වය තරමක් දුරට වැටහින. නිලමේ පිටත් කිරීම ලෙහෙසියෙන් කළ නොහැකි බව මට සිතින. අමනුෂ්‍ය ආත්මවල උපන් අයට පින් පැමිණවීමෙන් එම ආත්මයන්ගෙන් මුදා ලිය හැකි බව මා අසා තිබිණ. එහෙත් ඒ ඔවුනගේ කැමැත්ත අනුවය. පින් ගැනීමට කැමැති අයෙකුට විනා පින් ගැනීමට අකමැති අයෙකුට පින් දිය නොහැක. එබැවින් නිලමේ සමඟ මිතුරු වි ක්‍රමයෙන් ඔහුගේ සිත අමනුෂ්‍ය ආත්මය කෙරෙහි කලකිරවා ඔහු ඊට කැමැති කරවා ගැනීමට මම ඉටා ගතිමි. මේ සඳහා මා කෙරෙහි තිබූ ඔහුගේ බියද ඉවහල් කර ගැනීමට හැකිවේ යැයි මම සිතුවෙමි.

"නිලමේගෙ කතාව සම්පූර්ණයෙන් මා දැනගත්තෙ දැනුයි. නිලමෙ ගැන මටත් හරි දුකයි. කොග්ගල කරල තියෙන්නෙ හරි කැත වැඩක්. නිරපරාදෙ නිවැරැද්දෙ නිලමෙ දුක් විඳින එක ගැන මටත් දුකයි. ඒක හරි අපරාධයක්. නිලමෙ තව කොපමණ කාලයක් මේ වගෙ දුක් විඳින්නද? නිලමෙට මේ දුකින් අත්මිදීමට මට කළ හැකි ඕනෑම දෙයක් කිරීමට මා පොරොන්දු වෙනව."

"ඇයි මහත්තය මා දුක් විඳිනවා යයි කියන්නෙ? මට මට හිතු හැටියෙ ඕනෑ වෙලාවක ඕනෑම තැනකට යා හැකියි. ඕනෑම දෙයක් කළ හැකි බල පුළුවන් කාරයෙක් මම. මට මේක දුකක් නොවෙයි. මේකත් එක්තරා විදියක සැපක්. මහත්තය හරි කරුණාවන්තයි. ඒත් ඇයි මා ගැන දුක් වන්නෙ? මහත්තය කියන ඕනෑම දෙයක් කිරීමට මා සූදානම්. හැබැයි කොග්ගල අතහැරල යන්න කියන්න විතරක් එපා."

''නැහැ. මා දූනට ඒ ගැන කතාකරන්නෙ නැහැ. ඒව පසුව බලාගනිමු. දූන් මට නිලමෙ කියන්න නිලමෙ සතු බලතල මොනව ද කියල. නිලමෙට කළ හැකි දේවල් මොනවද කියල. එතකොට මට නිලමෙගෙන් කරවගන්න හැකි දේවල් මොනව ද කියල තිරණය කරන්න පුළුවනි. එය මට මගේ පරීක්ෂණ වලට ප්‍රයෝජනවත් වෙන්න පුළුවනි.''

''මහත්තය මට නොපෙනී ඉන්න පුළුවනි. ගිතුණ වෙලාවක මා කැමැති අයට පෙනෙන්න පුළුවන්. කිසි කෙනෙකු නොදැනුවත්ව ඔවුන් කරණ දේ බලාගෙන ඉන්න පුළුවන්. හැතැම්ම සිය ගණනක් වුනත් මොහොතකින් යන්න හැකි යි.''

''කාගෙවත් හිතෙ තියෙන දේ බලන්න බැරිද?''

''බොරු කියන්න ඕනැ නැහැනෙ මහත්තය, ඒක නම් මට කරන්න බැහැ. අපේ ඇත්තන්ගෙ එක එක කට්ටුවට අයිති බලතල වෙනස්. සමහර අය ඉන්නව අනුන්ගෙ හිත් බලන්න පුළුවන් අය. ඒත් මට බැහැ. ඔය අනිත් අයගෙ හිතේ තියෙන දේ ඇයි අපි බලන්න යන්නෙ? කාගෙවත් දේ මොකටද මහත්තයො තම තමුන්නෙ දේ බලාගන්නවා මිස.''

මා නිලමෙගේ කටයුතු වලට අවහිර කිරීමට තැත්කිරිම නිසා නිලමෙ මට ඇණුම් පදයක් වත් කීවේදැයි මට සැකයක්ද පහළවිය.

''මහත්තය කෑම ලෑස්තියි කෑම ටික කාල ඉන්න.'' කාමරයට ඇතුළුවූ කොග්ගල මහත්මිය කීවාය. නිලමෙ සමඟ කතා කරමින් සිටි මට වෙලාව ගතවනු නොදැණිණ. මා පෙර දින ගෙදරින් ආ ගමන බැවින් මා ගෙදර ගොස් කෑම කන බව පැවසුවද කොග්ගල මහත්මියගේ පෙරැත්තය නිසාම මට දිවා ආහාරය එහිදී ගැනිමට සිදුවිය. මා ගෙදර යන බව කී විට නිලමේද මා දෙස බැලුවේය.

''මහත්තය බඩගිනි ඇතිනෙ. ගිහින් කාල එන්න. අපි වගෙ නොවෙයිනෙ මහත්තයල. බඩගිනි, නිදිමත දුක් වේදනා ආදිය දැනෙන අයනෙ. යන්න, යන්න ගිහින් කාල එන්න.''

නිලමේ තවත් ඇණුම් පදයක් කිවේදැයි මට සැක සිතිණ.

තවත් දෙතුන් දෙනෙකු සමඟ දිවා ආහාරය ගනිමින් ඔවුන් සමඟ සාකච්ඡා කළේ කොග්ගල මහතාට ආවේශවී ඇති මළ' යක්ෂයාගේ උපකාරයෙන් භූත ලෝකය පිළිබඳ මෙතෙක් කිසිවෙකු නොදත් බොහෝ විස්තර ලබා ගත හැකි අයුරුය.

ගතවූ දින කිපයට වඩා නිලමේ සන්සුන්ව සිටීම ගැන කොග්ගල මහත්මියද සතුට පලකළාය.

මෙතෙක් ඈ සමඟ නිවි සැනසිල්ලෙ කතා කර වැඩි විස්තර ලබා ගැනීමට නොහැකිව තිබු නමුත් දිවා ආහාරය ගැනීමෙන් පසු ඇයද සැනසිල්ලෙන් අපගේ කතා බහට එකතු වූවාය.

''මහත්තය දවස් හතරකට ඉස්සර දා උදේ කොග්ගල මහත්තය ගෙදරින් පිට වෙලා ගියා. එදා ඉස්කෝලෙත් නිවාඩු නිසා මා කල්පනා කළා කොහෙ ගියාද කියල. අනුමානෙට හිතුව මාකස් මහත්තය බලන්න යන්න ඇති කියා. ගෙදරින් ගියෙ ඉස්කෝලෙ යනව කියලයි. සෙනසුරාද ඉස්කෝලෙ නැහැනෙ මහත්තය. ඒ නිසා තමා මා හිතුවෙ මහත්තය බලන්න යන්න ඇති කියල.

සති ගණනකම ඉඳල මහත්තයගෙ හැසිරීම ටිකෙන් ටික වෙනස් වීගෙන ගියා. අපි බැඳල අවුරුදු තුනටම විතර පසුවත් මාසයක් විතරම ඔය විදියට හැසිරුණා. සුළු දේකට වුනත් මහත්තයට තදින් කේන්ති ගියා. හිටි ගමන් හදිස්සියෙ ගැස්සිල වට පිට බලනව. කල්පනා කර කර බලාගත්ත අතේ බලාගෙන ඉන්නව. මාව පෙන්නන්න බැහැ. කිසිම වරදක් නැතුව මට බණිනව. නාන්න ඕනැකමක් නැහැ.

කිළුටු ඇඳගෙන ඉන්න ආසයි, ඕව තමා රෝග ලක්ෂණ පසුගිය වතාවෙත් ඔහොම තිබුණ නිසා මා සැක කළා මේ වතාවෙත් ඔය කාලකණ්නිය ඇවිත් කියල. පටන් ගත් දා සිට අසනීපෙ ටිකෙන් ටික වැඩිවුනා. මේ වතාවෙ ඔය රෝග ලක්ෂණ පලවුනාම මට කීව මාකස් මහත්තය ළඟ ඉන්න කොට මට හරි සූවයක් දැනෙණව. එහෙම කියල හැම දාම ගියා මාකස් මහත්තය බලන්න. මාකස් මහත්තය බලනතුරු මහත්තයට ඉවසිල්ලක් නැතිව. ඒ නිසා මහත්තය හැම දාම මාකස් මහත්තය බලන්න ගියා. කිප දිනක්ම ඔහු මට කියල තිබුන මේ වතාවේ අසනීප වුනොත් ඉස්සරවෙලාම මාකස් මහත්තය ගෙන්න ගන්න කියල. ඊට පසුව කට්ටඩි ගෙන් වන්න කියල කීව.,,

කොග්ගල මහත්මිය කෑම කන ගමන් කතාව කීව.

'මහත්තයත් දහයට ගණින්න බැරුව වගේ හිටියට මන්තර සැත්තරෙත් යහමින් දන්නව ඇති. නැතිනම් කොහොමද ඔයතරම් දරුණු යකෙක් මෙල්ල කළේ? ඒ කීවෙ අප සමඟ කෑම කමින් සිටිය සියාතු සියාය.

සියාතු සියත් දත යුතු හැමදෙයක්ම දන්න කෙනෙකු හැටියටත් වැඩි හිටියකු ලෙසත් ගමේ අය පිලිගත් කෙනෙක්

''අනේ නෑ සියාතු ඔය මන්තර කියන ඒව කළුද සුදුද දන්නෙ නැහැ. මටත් පුදුමයි ඔය යකා මට යටත් වුනේ කොහොමද කියලං''.

සියාතු සිය නමින්ම මං ඇමතුයේ රෝහලේ නිලධාරි-යෙකු වශයෙන් මා ඉසිලූ සමාජ තත්වය අනුවයි. කෙසේ වෙතත් කොග්ගල මහත්මියත් සියාතු කීදේ ඇසීමෙන් මගේ ආත්ම ශක්තිය බොහෝ දුරට වැඩිවුනා. කොග්ගල මහතාට ආවේශවී සිටි මළ යකා මට බිය බව වෙනත් අයගෙන් ඇසීම මට මහත් ආඩම්බරයක් විය.

කලින්වතාවේ මළ යකා අවේශවී බැඳ දැමූ විට එය සදහටමයැයි කොග්ගල මහත්මිය සිතූ බව ඇය කීවාය. මේ වතාවේද කලින් කටයුතු කළ කට්ටඩීන් ගෙන්වීම සඳහා මාතරට විදුලි පණිවුඩයක් සහ ලිපියක්ද යැවූ බව කොග්ගල මහත්මිය කීවාය. තවත් දින තුන හතරකින් හෝ ඔවුන්

පැමිණෙනු ඇතැයිද එතෙක් කොග්ගල මහතා බලා ගැනීම කොග්ගල මහතාටත් ඇයටත් මට කළ හැකි ලොකුම උපකාරය බවත් කොග්ගල මහත්මිය කීවේ කඳුළු පිරි දෑසිනි

මට කිරීමට හැකි සෑම උපකාරයක්ම කිරීමට මා සූදානම බවත් දිගටම එහි රැඳී සිටීමට මගේ රාජකාරි අනුව නොහැකි බවත් හැකි හැම විටම පැමිණෙන බවත් මම කිවෙමි. එහෙත් රැකියාවෙන් නිවාඩු ගෙන හෝ කට්ටඩි පැමිණෙන තුරු එහි ම නවතින ලෙස ඇය ඉල්ලා සිටීවිට මට එය මග හැරිය නොහැකි විය

පැමිණ සිටි ගම්මුන් සමග ගමේ ගොඩේ යක්ෂ කතා අවතාර හොල්මන් ගැනත් යකුන් ගැනත් මළවුන් ගැනත්. ගම්බද ඇදහිලි විශ්වාස ආදිය ගැනත් කතා කරමින් සිට පස්වරු දෙකට පමණ මම නැවතත් කොග්ගල මහතා සිටි කාමරයට ඇතුළුවත් ම ඔහු ඇසුයේ

,මහත්තය කෑම කෑවද? මාත් කෑවේ නැතත් ඔහෙ පැත්තකට වෙලා බලා හිටිය. මහත්තයල කතාවුන දේත් මා අහගෙන සිටිය. පසුගිය වතාවෙ වගෙ මේ වතාවෙත් බැඳල දාන්නයි ලෑස්තිය. ඒව හරි යන්නෙ නැහැ. ඔය කියන තක්කඩි දැන්ම එන්නෙ නැහැ. ඒකට වැඩෙ මා සලස්වලයි තියෙන්නෙ. පසුගිය වතාවෙ මට දස වද දීල බැඳල දැම්ම. මේ වතාවෙ නම් ඒ ටික කරන්න බැරිවෙයි. ආවාවෙකො බදින්න. මා හොඳ පාඩමක් උගන්වන්නම්.,, නිලමෙ පාරම් බෑවේ සෑහෙන බියකින් බව මට සිතුණි.

යක්ෂයින් භූතයින්, යන්තර මන්තර ගැන මා වැඩි යමක් නොදත් බැවින්ම මට හමුවී සිටි මළ යකාගෙන් හැකි තරම් දේ ඉගෙන ගැනීමට අදහස් කළෙමි.

'නිලමෙ කීව නොවෙද. නිලමෙට ඕනෑ වෙලාවක ඕනෑ තැනකට යන්න පුළුවනි කියල. ඕනෑ කෙනෙක් කියන දෙයක් අහගෙන ඉන්නත් කරණ දෙයක් බලා ඉන්නත් හැකියි කියල.' මා කීවේ නිලමේ බැඳ දැමීමේ අදහස ගැන ඔහු කෝප වී ඇති දැයි දැන ගැනීමටය.

'ඔව් මට පුළුවන්. ඇයි මහත්තයට මොකක් හරි හොර-යක් හෙම අල්ලන්න ඕනැද?

මට ඔය කාගෙවත් හොර අල්ලන්න ඕනැ නැහැ අනිත් අයට හොරෙන් කවුරු හරි යමක් කරනවණම් ඇයි අපි එයාට හොරෙන් ඒව බලන්නේන යන්නෙ?, මා එසේ කීවේ මා අනික් අය නොසොයන කෙනෙක් බව නිලමේට දැන්වීමටය.

'ඒකත් ඇත්ත තමා මහත්තයා. එහෙම උනොත් අපි ඔක්කොම හොරු.' නිලමේගෙ කතාවෙ උපහාසයක්ද ගැබ්වී තිබිණ.

'නිලමෙට පුළුවන්ද දැන් මගෙ ගෙදරට ගිහින් මේ වෙලාව එහි ඉන්නෙ කවුද, කරන්නෙ මොනවද, කතා කරන්නෙ මොනවද කියල බලාගෙන එන්න,. මා සූදානම් වූයේ නිලමේගේ හැකියාවන් ගැන පරීක්ෂණයක් කිරීමටය.

'හරි මහත්තය, ඒක සුළු දෙයක්. ඉන්න අයයි කරන දේයි, කතාවෙන දෙයයි නොව ඕනැ? හැබැයි මහත්තයා ගේ ඇතුලට නම් යන්න බැහැ. එලියෙ ඉඳන් බලාගෙන එන්නම්. ඔන්න මං ගියා.

කොග්ගල මහතාට පියවි සිහිය ලැබිණ. නිලමෙ ඔහුගෙ නිල මෙහෙය කිරීම සඳහා ගිය බැව් පෙනිණ. කොග්ගල මහතා දූස් පිස දමා මෙට්ටය මත වාඩි වීය.

'මිස්ට මාකස් කොයි වෙලාවෙද ආවේ? කැම හෙම කෑවද?' කොග්ගල මහතා ඇසුවේය.

'මං ආවේ ඊයේ. තාම ගියෙ නැහැ. ගෙදර බලා ගෙන ඇති මං එනතුරු.'

'මගෙ ඇඟට පණ නැහැ. නැගිටින්නවත් බැහැ. මේකනම් මං පෙර කළ කරුමයක් පලදෙනවා.'

කොග්ගල කීවේ ඇත්ත. කරුමෙ කියන්නෙ කරපු දෙය. කොග්ගල නිලමෙගෙ දුව බඳින්න පොරොන්දු වෙලා බැන්දෙ නැහැ. ඒක තමා කරුමෙ. මා එසේ සිතුවත් කීවේ නැහැ.

'මිස්ට කොග්ගල දන්නෙ නැද්ද පසු ගිය දින දෙක තුනේ සිදුවූ දේවල් ගැන. ඒ කියන්නෙ ඔය නිලමෙගෙ බලයට යටත් වෙලා ඉන්නකොට සිදුවූ දේවල්,

'මං කිසිදෙයක් දන්නෙ නැහැ මහත්තය. සමහර වෙලාවට සමහර දේවල් සිහිනෙන් දැක්ක දේ වගේ මතක තියෙනව. ඒත් පැහැදිලිව මතක නැහැ,

පැය කාලක් පමණ ගතවිය. නිලමෙ තවමත් නැහැ කොග්ගල මහත්මිය දොඩම් වීදුරුව ගෙන ආවාය. සැමියාට දොඩම් වීදුරුව දෙමින් 'මහත්තයා කෑම ටිකක් කමුද?' යි ඇසුවාය.

'නැහැ ඕනැනැහැ. දොඩම් බීවම ඇති.' කියා කොග්ගල මහතා දොඩම් වීදුරුව හිස් කළේය.

මෙයින් මට එක් අදහසක් පහල විය. එනම් කොග්ගල මහතාට යමක් කෑමට දීමට ඇවැසි විට නිලමෙ කිසියම් කටයුත්තකට යවා ඒ අතරෙ කොග්ගල මහතාට ආහාර ගැනීමට ඉඩ සැලැස්වීමයි.

හිටි හැටියේ කොග්ගල මහතාගේ මුළු ගතම වෙව්ලා ගියේය. ගිරිය යටින් හූවක් කීවේ ය. නිලමෙ ඇවිත් ය.

'නිලමෙ ආවද? කොහොමද ගමන? කියන්න බලන්න විස්තරය.'

'මං ගියා මහත්තයගෙ ගේ ළඟටම. ගේ ඇතුලට යන්න හිතුනත් එහි ඇතුල් වෙන්න තරම් බලයක් මට නැහැ. ගේ ඇතුලෙ පානක් පත්තු වෙනව. ඒ දිහා බලන්න වත් බැහැ. ඒ නිසා මං එලියට වෙලා බලා හිටියා කවුරු හරි එලියට එන තුරු. ලස්සන චූටි බබෙකුත්, නෝනා කෙනෙකුත් එලියට ආව.' නිලමෙ කියාගෙන ගියා

ඇයි නිලමෙ කලින් කිව නොවෙද කොග්ගල මහත්තය මගෙ ගෙදරට යනකොට නිලමෙත් යනව කියල. ඒ යන කොට ඔය නෝනා දැකල පුරුදු නැතිද?' මං ඇසුයේ නිලමෙ හැමදාම කොග්ගල සමඟ මගේ ගෙදරට යන බව කියා තිබු බැවිනි.

'කොහෙ දූනඇඳුනුම් කම් ඇතිකර ගන්නද මහත්තය මං කොග්ගල යනකොට එහාට යන්නෙ මාව පෝරකයකට

ගෙනියන්න වගේ. කොග්ගල අතහැරල යන්න බැරි නිසා යනවා. එහෙම යනකොට වෙන කවුරු ඉන්නවද කියල බලන්න සිහියක් නැහැ. වෙනෙකක් කියා මහත්තය හමුවෙන බව දන්නෙත් මහත්තයට ඇති බය නිසාම ඉන්නවද නැතිද කියා බලනවා. ඒත් යාන්තම් පෙනෙන තෙක් මානයේ සිට. ගෙදර වෙන කවුද ඉන්නේ කියා බැලීමට හිතේ සහනයකුත් නැහැ. නිලමෙ කියාගෙන ගියේ මං බලාපොරොත්තු නොවූ ලෙසටයි.

'හරි. හරි, දූන් ඉතින් ගිය ගමනෙ විස්තරේ කියනවකො මං හරස් කැපුවා.

එතකොට ම ඉස්පිරිතාලෙ පැත්තෙ ඉඳල සරමකුයි බැනියමකුයි ඇඳ ගත්ත, මේ අපි වාගෙ කෙනෙකුත් ආව.,

හොඳයි ඒ එක්කෙනෙකු හරි මොනව හරි කිව්වද? කිව නම් ඒ මොනවද? මා නොඉවසිලිමත්ව ඇසුවා

'මැණිකො මහත්තය ඊයෙ ගිය ගමන |තාම ආවෙ නැහැ, අද ආවෙ නැතිනම් රට ගිහින් බලල වරෙන්. මාරිමුත්තු ගෙ කඩේට ගිහින් සීනි රාත්තල් දෙකක් ගෙනෙන්. කියල නෝනා කීව. රුපියල් පහකුත් ඒ ආපු එක්කෙනාට දුන්න

'නෝනා මහත්තය මං දැන්ම ගිහින් මහත්තයත් බලල එන ගමන් සීනිත් අරන් එන්නද?'' ඒ තැනැත්තා ඇහුව. එතකොට නෝනා කීව'' නෑ නෑ හවස ගියාම ඇති. නැති නම් රෑ වෙලා පලයන්. දැන් ගිහින් සීනි ගෙනෙන්''. මං ඒ ටික අහගෙන ආව.

'නිලමෙට බැරිද නිදන් තියෙන තැන් හොයල කියන්න

'අනේ බැහැ මහත්තයො. මට පෙණෙන්නෙත් ඔය මහත්තයලට පෙණෙන්න වගෙ තමා. හැබැයි මහත්තයලට යන්න බැරි තැන් වලට මට ගිය හැකි. ඉදිකටු සිදුරක් තුලින් වුවත් මට ගිය හැකියි. මට ඉන්න, ගමන් කරන්න ඉඩ කඩ අවශ්‍ය නැහැ.''

''එහෙම නම් නිලමෙ කලින් කිව නොවෙද නිලමෙට කරන්න බැරි දෙයක් නැහැ කියල

,,ඇයි මහත්මයා මට බැරි වුනාට පුළුවන් අය මං අඳුණනවනෙ. ලොකු ලොකු බලතල ඇති අය මා අඳුණනව හමුවෙලත් තියෙනව. ඕනෑ වෙලාවක හමුවෙන්නත් හැකියි.

'කොහෙද ඒ අය ඉන්නෙ? මට බැරිද ඒ අය හමුවෙන්න

එක තැනක නොවෙයි මේ හැම තැනම ඉන්නව,

මහත්තය ගැන මට කීවෙත් ඒ අය තමා ඒ අය මගෙ හොඳ යාළුවො. හුඟ දෙනෙක් ඉන්න තැනක් කියන්නම් මහත්තය එතැන ගැන දන්නවද කියන්න බැහැ. මේ පලාතෙ ඇත්තො නම් එතැන හොඳට දන්නව.''

''කියනව බලන්න. සමහරවිට මා දන්නව ඇති.

(2)

පාලමක් යට භූත රජ දහනක්.

''මහත්තය දන්නවනෙ රෙකුලාසි පාලම? අර අධාවත්ත අයිනෙ බිබිලෙ පාරෙ පාලම? මෙහි ඉඳල හැතැප්ම දෙකක් විතර දුර ඇති. ඒ පාලම අයිනෙ ලොකු ගලක් තියෙනව ඒ ගල යටින් මහා දිග උමඟකට ඇතුළු වෙන්න දොරටුවක් තියෙනව. පහලට බැහැල හොඳට බැළුවොත් තමා එහි දොරටුව පෙණෙන්නෙ.''

''හා, හා මහත්තය, ඔය කියන තැන මා දන්නව. පණට ආදරේ ඇති කෙනෙක් නම් එතැනට යන්නෙ නැහැ. එතැනට රෙකුලාසි පාලම කියල නම හැදිල තියෙන්නෙ ඇදිරි වැටුනට පස්සෙ කිසිකෙනෙකුට තනිවම ඒ පාලමෙන් එහා මෙහා යන්න බැහැ. මහත්තයට ඔතැන ගැන හොඳ විස්තරයක් පසුව කියන්නම්.'' ඒ කීවේ සියාතු සිය.

කොග්ගල මහතා නැවත කතා කළේය.'' ඔය උමඟ ළඟ ඉඳල මහියංගනයට යන්න කෙටි පාරක්. කියනව රාවනා රජ්ජුරුවන්ගෙ කාලෙ තමා ඔක හාරල තියෙන්නෙ. බොහොම

තැන් දැන් කඩා වැටිල. ඒ වුනත් සෑහෙන දුරක් දැනුත් යන්න හැකියි. ඔය උමඟ විතරක් නොවෙයි මේ පලාතේ ඔය වගෙ උමං තවත් බොහෝ තියෙනව. මිනිස්සු ගල් ලෙන් වල ජීවත් වෙන කාලෙ ඒවායෙ ජීවත්වෙල ඉඳල මැරිල භූතාත්ම වල ඉපදිල තාමත් ඒවායෙ ඉන්නව. ඒ උමං ගල්ලෙන් වල ඉන්න අපේ ඇත්තන්ගෙන් කොග්ගල ඉන්න තැනක් ගැන හෝඩු-වාවක් දැන ගන්න මං ගියා ඒ හැම තැනම. ඒදවස්වල තමයි මට ඔය හුග දෙනෙකු හමුවුනේ.

ලුණුගල් කන්දෙ ඉන්න ඒ එක් කෙනෙක් නිතර එනවා ඉස්පිරිතාලෙ පැත්තෙ. එයාගෙ යාළුවො හුග දෙනෙක් ඉස්පි-රිතාල වත්තෙ ඉන්නවළු. එයාගෙන් තමා මම කොග්ගල ගැන දැනගත්තෙ. කොග්ගල නිතර ඉස්පිරිතාලෙ පැත්තෙ එනව ඒ යාළුව දැකල තියෙනව.

මහත්තය හමුවෙන්න කොග්ගල නිතර ඉස්පිරිතාලෙට එන බව කිවා. මහත්තයත් හරි බලවන්තයෙක්ය කියල එයත් කීවා. අමනුෂ්‍ය සංහතියෙ හැම දෙනෙක්ම මහත්තයට බය බවත් කීවා. ඒ බය නිසාම මහත්තයට උදව් කරන බවත් කීවා

දවසක් මහත්තයා ලුණුගල් කන්දෙ ඇවිද්දා නගා මැරූ අල හොයන්න. නගාමැරූ අල හොයන්න බොහොම අමාරුලු. එයා කිව මහත්තයට නගාමැරූ අල තියෙන පැත්තට යන්න පෙන්නුවෙ එයයි කියල.

මොනවා, ඒක හරි කතාවක්නෙ. නගාමැරූ අල හොයන්න මං ලුනුගල් කන්දට නැංග එක ඇත්ත. මං ගියෙ තනිව නොවෙයි. මේ පලාතෙම තවත් කෙනෙක් එක්ක. එද නගාමැරූ අල හොයන්න අපි බොහොම මහන්සි වුන එකත් ඇත්ත. ඒත් අපිට කවුරුවත් පෙන්නුවෙ නැහැ. උදේ ඉඳලම ඇවිදල, ඇවිදල අන්තිමට අල හම්බ වෙන කොට හරියට දහවල් දොලහයි. ඔය කියන එක්-කෙනා මං නම් දැක්කෙ නැහැ.

'ඒ අය පෙණෙන්නෙ නැහැ මහත්තය. අනිත් අයට පෙනුනත් විශේෂයෙන් මහත්තයට පෙණෙන්න එන්නෙ, නැහැ. නොපෙණී ඉඳගෙන කරන්න පුළුවන් උදව්වක් කරාවි.

නිලමෙට බැරිද එයා ගෙන්වන්න? ඔය ඇත්තො වැඩියම ඉන්නෙ කොහෙද?

'මහත්තයට ඕනැම නම් කැඳවාගෙන ආ හැකියි. ඒත් මොනවටද මහත්තයො ඔවුන් ගෙන්නල අපිට ඇති වැඩෙ මොකද? හොඳ හොඳ බලගතු අය ඉන්නෙ ඔය රෙගුලාසි පාලමේ උමගෙ තමා.'

(නිලමෙ සඳහන් කළ උමග ගැන විස්තරයක් මා මෙහි කලින් සඳහන් කළ තැනැත්තාගෙන් අසා දැනගතිමි. පලාතෙ පැරැන්නන් කිහිප දෙනකුම කීයේ එතන උමගක් ඇති බව අසා ඇතත් කිසිවෙකු එහි ගොස් නැති බවය. එහි ඇතුලට යාම තබා ලෙන දොර අසලටවත් යාමට නොහැකි බවය ඔවුන් කීවේ. මෙය බැලීමට යාමට මහත් ආශාවක් තිබුණ නමුදු මා සමඟ යෑමට කිසිවෙකු සොයා ගැනීමට නොහැකි වීමෙන් එම අදහස අතහැර දැමීමට සිදුවිය. ඔවුන් එහි යාමට බය වූයේ අමනුෂ්‍යයින්, හොල්මන් සහ අවතාර වලට ඇති බිය නිසාය.

එහෙත් ඊට වසර හතකට පමන පසු මා බදුලු රෝහලේ සේවය කල කාලයේ උමහෙහි ඇති බූත බලපෑම් ගැන සඳහන් නොකර බදුල්ලේ ජනතා වාර්තාකරු පියසේන විජේසුන්දර මහතා සමඟ එහි ගියෙමි. මා උමගෙහි සැහෙන දුරක් ගොස් හැරී ආවෙමි. අඩි හතක් පමන දිගැති නයි හැවක් දැකීමෙන් ඉන් ඔබ්බට යෑමට මමද බියවීමි. උමහ අසල වූ ඔයෙන් ගැලූ දිය දහරකින් එවකටත් දණක් පමන මඩ පිරී තිබුණි. මගේ ගමනින් කලබලවූ කිරිවවුලන් මගේ මුහුණෙත් ඇඟේත් හැපෙමින් පියාසර කිරීමට පටන් ගති. මා ආපසු පැමිණ උමගෙන් පිටවන විට ගත් ඡායාරූපයක් 1963 අගෝස්තු මස 15 වැනි දින ජනතා පත්‍රයේ උමහ ගැන විස්තරයක්ද සහිතව පලවිය.)

'ඔය උමහ ඇතුලෙ අමනුෂ්‍යයන් කීදෙනෙක් විතර ඉන්නවද,? යි මම ඇසුවෙමි.

''අපොයි මහත්තය, දහස් ගණනක් ඇති. ගණන් කරන්න බැරි තරම් ඉන්නව. බොහොම බලවත් අයත් ඉන්නව.'' නිලමේ කීයේ ගරු ගාම්භීරත්වයක් ආරූඪ කරගෙනය.

බලවත් අය පමණක්ද? බවලත් අය නැතිද? මා ඇසුවේ විහිළුවට මෙනි.

අපෝ ඔව් බලවත් අයත් ඉන්නව. අවුරුදු දහස් ගණන් බලවත් අයත් බවලත් ඇත්තොත් ඉන්නව.'' නිලමේ කීවේ කල්පනාකාරීවයි.

''ඒ අය දැන් බොහොම නාකි ඇති නේද?,, සිනාවක් නගමින් මා ඇසුවා'

'නැහැ මහත්තය. ඒඅය වයස්ගත වුනාට නාකි වෙන්නෙ නැහැ. හැම දාම එක වගේමයි. රාවනා රජ්ජුරුවන්ගෙ කාලෙ ඔය උමඟ කප්පවපු එක්කෙනෙක් එහිම ඉන්නව. එයා දැන් උමඟෙ අයිතිය පවර ගෙනයි එහි ඉන්නෙ. එයාගෙ නම ජන්තු, එයාගෙන් වරම් නැතුව කිසිම කෙනෙකුට එහි ඇතුළු වෙන්න බැහැ.''

,උමඟ බලන්න යන්න මට අවසර දෙයිද?''

''අහලා බලන්න ඕනැ. ටිකක් ඉන්න. 'මා ගිහින් අහල එන්නම්' විනාඩි කිපයක් ගතවිය. නිලමේ නිගඩය. කාමරයේ සිටි අවුරුදු විසිපහක් පමණ වූ තරුණයෙක් අරනෝලිස් ටිකක් සසල ගතියකින් එට පිට බැලිය. වරක් ඔහු තිගැස්සී සිටි තැනින් නැගිට පිට වී යාමට ද තැත් කළ නමුත් ඔහුගේ දෙකකුල් වාරු නැති සේ නැවත හිඳ ගත්තේය ගෙය අවට තද කුණාටුවක් හමා යනු ඇසිණ. මොහොතකින් සියල්ල සන්සුන් විය. කොග්ගල තොමහාත් නිලමේ නැවත කථා කිරීමට සුදානම් බව පෙනිණ.

''මහත්තයා මා ගියා රෙකුලායි පාලමේ උමඟට. ජන්තුට කීව විස්තරය· මෙහි ආව· ඇවිත් බලල ගියා එයා වේගයෙන් හිතා වෙලා කිවා එයා මහත්තයා ගැන හොඳට දන්නවා· කියා ඕනැ වෙලාවක උමඟ බලන්න එක්ක එන්න කිව. එයාගෙන් කිසිම අවහිරක් නැතැයි කිව.''

''කවුද ඔය ජන්තු කියන්නේ?'' මා ඇසුව·

''එයා තමයි රාවනා රජ්ජුරුවන්ගේ කාලෙ ඔය උමඟ කැප්පෙව්වේ ජන්තු තමා උමඟ කැණීම භාරව ඉඳල තියෙන්නේ රාවන රජ්ජුරුවන්ව බොහොම කිට්ටුවෙන් සේවය කළ කෙනෙක් තමා ජන්තු' රාවනා රජ්ජුරුවෝ භාරතයෙ පලාත්

නවයක් යටත් කර ගන්න සටනට යනකොට ජන්තුත් ඒ සේනාවේ ගිහින් තියෙනව. ඒ කාලෙ ලංකාවේ හිටිය කීප දෙනෙක්ම ඔය උමගෙ ඉන්නව. ජන්තු තමා නායකය. මේ පලාතටත් ඔය උමගටත් ජන්තු හරි ආසයි එයා පණ වගෙ ඔය උමග අරක්ෂා කරනව. එයා කැමති නැති කෙනෙක් හෙම ඔය උමගට ඇතුළු වන්න හැදුවොත් ඒ අය බිය වද්දනව. නැති නම් මරණව· හැබැයි මහත්තය වගෙ ටිකක් බල සම්පන්න කෙනෙක් ගියොත් අතවර කරණ්න බැරි නිසා උමඟ සහවනවා සහවනවයි කියන්නෙ ඒ යන තැනැත්තාට උමගක් ඇති බව පෙනෙන්නෙ නැහැ.''

''මොනව? ඔය තරම් ලොකු උමගක් සහවනව? උමගක් සඟවන්නෙ කොහොමද?'' මා විමතියෙන් ඇසුවා.

''මහත්තය එයා උමග හංගනවා නොවෙයි. ඒ යන තැනැත්තගෙ හිතට එයා කාවද්දනව එතන උමගක් නැහැ කියල. හරියට මායාකාරයෙක් මිනිසුන්ට නොයෙක් දේ මායාවෙන් පෙන්වා වා ගෙ, මායා කාරය බලා ඉන්න අයගෙ හිතට කාවද්දනව ඒඅයට මායා කාරය හිතන දේ පෙණෙනව කියා. බලන තැනැත්තගෙ හිතට බල කරණව. ඒක මායාවක් අපි අවතාර, හොල්මන් ආදි වශයෙන් හඳුන්වන දේ පෙණෙන්නෙත් ඒ වගේම තමා. තවත් හොඳ විස්තරයක් ගන්න උවමනා නම් මා ගිහින් ජන්තු එක්ක එන්නම්''

එය ඇසී කොග්ගල මහත්මිය කාමරයට දුව ආවාය. අනේ මහත්තයො මොනවද මේ කරන්න හදන්නෙ? මේ එකකු ඇවිත් තියෙන කරදර මදිවාට තවත් එකකු ගෙන්වා ගන්නද හදන්නෙ? අනේ පින් සිද්ද වෙයි මහත්තයො එන්න නම් දෙන්න එපා. ඔය කාලකණ්ණියට තනියම බැරි නිසා තව එකෙක් උදව්වට ගෙන්න ගන්නයි හදන්නෙ. ඕවට රැවටෙන්න එපා. මම දන්නව ඔය කපටියගෙ හැටි. පසු ගිය වතාවෙ නටපු නාඩගම ගැන මං දන්නව..'යි කීවේ ඉමහත් බියකිනි.

එසේ කියා කොග්ගල මහත්මිය කාමරයෙන් එළියට ගියා පමණි. කලින් වතාවේ කලබලකාරී වූ තරුණයා නැවතත් නොසන්සුන් විය. ගෙය අවට මහ කුණාටුවක් හමන හඬ ඇසිණ. ඒ ජන්තු පැමිණ ඇති බවට සළකුණකි. තරුණයා

සිහිසුන්ව බිම දිගාවිය. .... කිසිවෙකුට නොතේරෙන බසකින් ඔහු යමක් කීවේය.

''ඔන්න මහත්තය එයා ආවා,''යි නිලමේ කීවේ මහත් සාඩම්බරයෙනි.

''මොනවද එයා කීවෙ? ඒ භාසාව තේරෙන්නෙ නැහැ නොවැ?'' මා කීව.

''එයා කීවෙ අවුරුදු පන් දහසකට පසුව මිනිස් ඇසකින් ලොවදුටු බවයි.''

එයාට අපි කතා කරණ බාසාව තේරෙන්නෙ නැතිද?''

බිම වැටී සිටි තරුණයා අප බස ඔහුට තේරෙන බව ඇඟවීමට මෙන් හිස සැලිය. ජන්තු රාවන යුගයේ ජීවත් වුවෙකැයි කී හෙයින් අප නොදත් වැදගත් කරුණු රැසක් මට ලබා ගත හැකි බව හැඟිණ.

තමාද ජන්තු කියන්නේ? නිලමෙ අපට තමාගැන බොහොම වර්ණනා කර තිබෙනවා. මා බොහොම ආශාවෙන් සිටිය තමා හමුවන්න.'' මා කීයේ අවේශවූ තරුණයා දෙසට නෙත් යොමා ගෙනය.

තරුණයා සන්සුන් විය. කතාව ඇරඹිණ. ඔහු කතාකළේ මහත් අපහසුවෙනි. එතරම් ඈත අතීත යුගයක කරුණු ගැන කතා කිරිමට තරම් එම ගැමි තරුණයා දියුණු මානසික තත්ත්වයක නොවන බැවින් එසේ වියැයි මම සිතුවෙමි

'මාත් බොහොම අශාවෙන් හිටිය මහය හමුවන්න' ජන්තු කතා කළේ ගැඹුරු කටහඬිනි. මහය? ජන්තුලගෙ කාලෙ කෙනෙකු ඇමතූ හැටි වෙන්න ඇති මා සිතුව. මහත් ගරු සරුවෙන් යුතුව කතා කළ බැවින් එය කෙනෙකු ගරු සරුව ඇමතීමට යොදන ඇමතීමක්ද යන්නත් සැක සිතුව.

''මහය මේ පලාතට ආ දවස්වලම මට මහය ගැන අපේ ඇත්තො කීප දෙනෙක්ම කීව. ඒ ඇත්තො මහයට බොහොම සළකනව.''

'මං බොහොම ආසයි ජන්තුලගෙ ලෝකය ගැන තොරතුරු දැනගන්න. මට සුළු විස්තරයක් දෙන්න හැකිද ඔබේ ලෝකය ගැන? ඔය ඇත්තො කී දෙනෙක් විතර දැනට බූත ආත්ම වල

ඉන්නවද?? ඒ ඉන්නෙ කොහෙද? කාලය ගත කරන්නෙ කොහොමද ආදී දේ දැනගන්න මා ආසයි.''

''අපේ ලෝකය කිව්වාම අපි නම් ගණන් ගන්නෙ අපේ කාලෙඅප එක්ක ඉඳල මිය ඇදිල බූතාත්ම වලට ආ අයයි. එහෙම නැතිව බූත ලෝකය කිව්වාම මේ අද ඊයෙ මියැදිල බූතයින් වෙලා, අපේ ලෝකයෙ ඉන්න අයත් අයිති වෙනව. ජන්තුකලේ පැහැදිලි කිරීමක්.

''මං කැමති ඇත අතීතෙ ජන්තු මිනිස් ජීවිතයක් ගත කළ කාලෙ ජීවත් වෙල මියැදිල බූත ලෝකයට ඇතුල් වුන අය ගැන දැනගන්නයි.,, මං කිව්වෙ බූතලෝකය ගැන හොයන කොට මුල ඉඳන් පටන් ගැනීමට සිතාගෙන,

''අපි තාමත් දහස් ගණනක් ඉන්නව. සමහරෙක් නම් අපේ ඇඳහිලි වෙනස් කරල වෙනත් ඇදහිලි අනුව මිනිස් ජීවිත ලබල ඉන්නව. අපේ ඇදහිලි වෙනස් නොකළ අය හැමෝම ඉන්නෙ බූතාත්මවල. ඒ අය මේ පලාතෙ විතරක් නොවෙයි මේ රටේ හැම පලාතකම වාගෙ ඉන්නව. මගෙ උමගෙත් සෑහෙන ගණනක් ඉන්නව. ඒ හිටියට හැම කෙනෙකුටම සමාන බලතල නැහැ. සමහරෙක් උමහට ආවට පස්සෙම උමගෙන් එළියට ගිහින් නැහැ. සමහරෙක් ඒ අයගෙ නෑ දැයෝ, යාළුවො බලන්න යනව.'

''කොහෙද ඒ යාළුවො, නෑ දැයො ඉන්නෙ?, මං ඇහුවා

'සිහගිරියෙ, ලග්ගල, රිටිගල, දෙවුන්දර, මා තොට, රාවනපුර, රක්ආන, හාන්තැන්න සමන්අඩවිය, නාදිව, මිණිපුර බිම්තැන්න, සීතාඑලිය, රක්ගල, ආදී පලාත් වලත්, තවත් බොහෝ පලාත් වලත් ඉන්නව.'

''ඔය කියන තැන් රාවනා රජතුමාගෙ කාලයෙ ඉඳන් ජනවාසව තිබු තැන්ද? මං ඇහුව.

'ඔවු සීහගිරිය, සිහපුරය, සීහගිරි විමන, කියන්නෙ එකම තැනටයි. ඒගිරි මුදුනෙ රාවනා රජ්ජුරුවන්ගෙ එක මාලිගයක් තිබුණ. රාවනා රජ්ජුරුවො යුද්දෙන් පැරදුනාට පස්සෙ සිහගිරිය වල් බිහිවුනා. වල් බිහිවුනත් අපේ ඇත්තෙ; රකුන් වෙලා එහිම ජීවත් වෙනව. ලග්ගල තවත් වැදගත් නුවරක්.

රට මැද තිබුණ ලොකුම රකුවිමන, 'මහාකලී' තිබුණෙ ලග්ගල අතල රටේ හතර කොන රකු විමන් හතරක් තිබුණ ඒ හතර වෙන්වී තිබුණෙ සිව්රැහැට.' ජන්තු කියාගෙන ගියා

'ජන්තු, සිව්රැහැ කිවෙ මොකක්ද? ජන්තුට නම කියල කතා කළාට තරහ නැහැනෙ?'

'අහා, නැහැ. අප සලකන්නෙ නමින් හුරෙකු ලෙස තැකීමක් කියා. සිව්රැහැ අපේ ඇදහීම් අනුව කොටස් හතරක් වුනා. යක්,රක්, දෙව්, නා තමා ඒ කොටස් හතර. ඒ ඒ රැහේ මියැදී ඇත්තො ඒ ඒ විමන් වලට එක් වෙනව ඒ ඒ විමන අරක් ගත් අයත් හිටිය. මහය කැමති නාම මෙහි ගෙන්වන්නත් හැකියි. සමහරෙක් හරි උජාරුයි. කවුරුවත් ලහට ගෙන්වන්න බැහැ. අපි ඒ අය ලගට යන්න ඕනැ හමුවන්න ඕනැ නම් ඒ ඒ අය අරක්ගෙන ඉන්න විමන් වලට යන්න ඕනැ. සීගිරිය රැක ඉන්න රකුන් නම් ගෙන්වන්න හැකි වෙයි. මං ගිහින් කැඳවං එන්නද?

''හා, හා, කලබල වන්න එපා. පසුව කැඳවා එමු. දැනට මට ඕනැ කරන්නෙ ඒ ඇත්තො ගැන විස්තරයක් පමණයි.''

''මේ අපි ගැනද? අපි ගැනත් අපි හැඳින හැටිත් අපේ බස ගැනත් බොහොම දන්නෙ බාහුරු. එයා කැඳවන් එන්න හැකියි. ඒත් එයා හොයාගන්න එක තමා අමාරු. රට හැම තැනම යනව.'' ජන්තු කිවෙ කල්පනා කාරීවයි.

',එහෙනම් ඉස්සර වෙලාම මං ගැන කියන්නම්. රාවනා රජ්ජුරුවො සිංහපුරය කරවන කාලයෙ බිම්තැන්නෙ සිට නොයෙක් දෙසට කෙටි පාරවල් තැනුව· උමහ කැපිම බාරව හිටියෙ මම යි. මා කරවපු ඒ උමහට හරි ආසයි. ඒ නිසා තමා මා මියැදුනායින් පසුවත් එහිම එය රැකගෙන ඉන්නෙ. මං තමා මේ ඉසව්වෙ රකුන්ගෙ නායකයා. අවට ගව් ගණනක ඉන්න රකුන් මගෙ අණ සකට යටත්ව තමයි ඉන්නෙ. ඒ ඇත්තෙක් වරදක් කළොම දඩුවම් දීමත් මට බාරයි.''

ඔස උමග පමණක් නොවෙයි භාරතයත්, ලංකාත් යාකර පාලමහැදුවෙත් මා තමා

''මොනවද ඒ ඇත්තන් කරණ වරද?,,

''අපි ගැන හෝ අප රකින නිදන් පැරණි වීමන් ආදිය ගැන මනුස්සයින්ට කිසිම තොරතුරක් දීම සහ මුලින්ම තහනම්. අපේ සමහර ඇත්තො පුද පූජා ලබන්න, ගරු සැලකිළි ලබන්න වැඳුම් පිදුම් ලබන්න සමහර මනුස්සයින්ට ආවේස වෙනව. ඒ ආවේස උනාම ඒ අයට කරන්න තහනම් දේත් කරනව. ඒ ඇත්තන්ට අවසර තියෙනව සාස්තර කියන්න, යස්ස භූත බලපෑම්වලින් හැදෙන ලෙඩ රෝග සුවකිරීම්. ආදියට ඒ ඇත්තො සමහර තැන්වලදී නිදන් තිබෙන තැන් ඒව ගතහැකි විදි ආදිය කියනව. ඒව ඒ අයට තහනම්. මට බලය තියෙනව මගෙ අඩවියෙ ඕන දෙයක් ගැන මා කැමති ඕනැ කෙනෙකුට ඕනැම විස්තරයක් දෙන්න. ඒ අයටත් පුළුවන් මගේ අවසරය ඇතිව ඒ විස්තර තවත් අයට දෙන්න.
නමුත් එහෙම ලෙහෙසියෙන් අවසර දෙන්නෙ නැහැ. මහයට ඕනැ නම් මා දන්න නිදන් ගැන විස්තර දෙන්න හැකියි· රාවන රජ්ජුරුවන්ගෙ වස්තුවෙනුත් ටිකක් මා බාරෙ තියෙනව. හැබැයි ඒව ගැන විස්තර කීවට තිබෙන තැන නම් කොහොමටවත් කියන්න බැහැ·''

'හා, හා, ජන්තු මාත් හරි වසනාවන්තයෙක්නෙ. මං හිතන්නෙ නැහැ ඔය තරම් විස්තර අද ජීවතුන් අතර ඉන්න කාට්ත් අහන්න ලැබෙයි කියල.'' මං කීවේ ජන්තු මට ඒ විස්තර දීමෙන් උපකාරයක් කරන බව පෙන්වා ඔහුගේත් මගේත් බැඳීම වැඩි කර ගැනීමටයි.

ඇත්තෙන්ම, මහය හරි වාසනාවන්තයි බලවන්තයි දැන් ජීවත් වෙල ඉන්න ඇත්තො තබා දැනට වසර දහස් ගණනකට පෙර ජීවත්වුන අයත් ඒව දන්නෙ නැහැ අපේ රටේ ජීවතුන්ගෙ සමාජය වෙනස් වීගෙන ගියාම මියැදුනවුන් ගැන ඇදහීම ටිකෙන් ටික අඩුවී යනකොට අපිත් ඒ අයගෙන් ඈත් වුනා.

රාවණ රජ්ජුරුවන්ගෙ වස්තුව බොහොමයක් රකින කෙ-නෙක් තමා සිහපුර මකර. ඒ ඇත්ත මහ බලවතෙක්. ඒ වස්තුව තියෙන්නෙ කොහෙද කියල දන්නෙ මකර පමණයි. ඒ වගෙ තවත් අය තවත් පලාත්වල ඉන්නවා ඒ රකුන් තමා අපේ ජාති-ක වස්තු රකින්නෙ. කලින් කල අපි එක්රැස් වෙලා නොයෙක් දේ ගැන කතිකා පවත්වනව තම තමා භාරෙ තියෙන වස්තුවට මොනව හරි අතුරු අන්තරාවක් වෙන්න එනව නම් ඒ ගැන කතිකා කරල ආරක්ෂා කරන්න කටයුතු කරනව''

''ජන්තු භාරෙ තියෙන වස්තුව මොනවද කියලවත් ඒවා තිබෙ-න්නෙ කොහෙද කියලවත් මං අහන්නෙ නැහැ නමුත් ඒ වස්-තුව ගැන විස්තරයක් දෙන්න බැරිද ?,,

,,මං ලඟ තියෙන්නෙ රාවන රජ්ජුරුවන්ගෙ මුදුවයි කඩු-වයි මාලයකුයි පමණයි මං හිතන්නෙ නම් ඒ තමා වටිනාම වස්තු යැයි කියා. වැඩි විස්තර පසුව කියන්නම් ඒ විස්තර කියන්න අඩු ගානෙ මකර ගෙන් වත් අහන්න ඕනෑ. මකර තමා දැනට ඉන්න රකුන්ගෙ නායකයා. අපි දෙන්න හොඳම යාළුවො. මහය ගැන මකරට විස්තර සහිතව කීවොත් මං හිතන්නෙ මහයට ඒ විස්තර කිමට අවසර ලැබෙයි කියා.,, මං දැන් යන්නම්. සිහපුරයට ගිහින් මකර හමුවී පසුව එන්නම්,,

ජන්තු ගිය පසු නිලමෙ නැවත කතා කිරීමට පටන් ගත්තේය.

'දුටුවද මහත්තය මිනිහගෙ තරම? ඔය අය මගෙ යාළු-වො. ඒ ඇත්තන්ට නොකළ හැකි දෙයක් නැහැ. ,'නිලමෙ කිව්වෙ ගරු ගම්භිර ලීලාවකිනි.

ජන්තු සමඟ බොහෝ වෙලා කතා කරමින් සිටි බැවින්ද රෑ බෝ වී තිබු බැවින්ද පෙර දින රැයෙත් ගෙදර නොගිය බැවින් මං කැඳවාගෙන යාමට මැණිකා පැමිණ සිටි බැවින්ද ගෙදර යාමට මම අදහස් කළෙමි.

මා යන බව ඇසු නිලමේ මහත් සේ සතුටු විය. ඔහුට උවමනා හැටියට සිතු දේ කිරීමට අවස්ථාව ලැබෙයැයි ඔහු සිතුවා විය හැක.

කොග්ගල මහත්මිය කීවේ ''අනේ මහත්තයො ගෙදර ගිහින් හැකි ඉක්මනින් එන්න ''කියයි. පෙර දින රැයෙත් ගෙදරින් පිටවී සිටි නිසා මා ගෙදර ගොස් එදිනම ආපසු නොඑන බැව් පැවසූ විට ඕ කනස්සලු වූවාය. ඇගේ දෑසින් කඳුළු බිඳු දෙකක් ඉවතට පැනීමට සූදානම්ව ඇති බැව් මම දුටිමි. මා පිටව යාමට පෙර සුදුසු ආරක්ෂාවක් කර යන බව කී විට ඇය සැනසුම් සුසුමක් හෙළුවාය. අපි අලින්දයේ කතා කරමින් සිටි අතර නිලමේ කථා කරනවා ඇසී මම කාමරයට ගියෙමි.

''මහත්තයා දැන්ම යනවද?''

''මං තව ටික වෙලාවකින් යනවා''

''හා ,එහෙමනම් රෙකුලාසි පාලමෙ බිම් ගෙයි ඉන්න මගෙ යාළුවො ටික මෙහාට මට තනිවට ගෙන්න ගන්න පුළුවන් ඒ ගැන මහත්තයාගෙ අමනාපයක් නැද්ද?''

'' කවුද යාළුවො? ජන්තු එහෙමද? ''

''නැහැ, නැහැ, ජන්තු මහත්තයා හමුවන්න ඒ වෙලාවේ ආවාට ලේසියෙන් එයා ගෙන්වන්න බැහැ. මගෙ යළුවො කිවෙ මේ පළාතෙ ජිවත් වෙලා මෑතකදී මැරුණු අය. හොට්ටා නිට්ටා, වකුටා, පොකුටා, දිගනා සුගුණා දැල්ලා බොල්ලා පණා ඒ අය තමා මගෙ යාළුවො.,, නිලමෙ නම් වට්ටෝරු වක් කියාගෙන ගියේය.

''නිලමෙට යාළුවො බොහොම ඉන්නව වගෙයි. ඒ වුනත් මං නැති අතර ඒ අය ආවම සලකන්න කෙනෙක් නැහැ නොවැ' ඒ නිසා මං ඉන්න වෙලාවක කැඳවාගෙන එන්න. දැනට ඒ අදහස අත්හරිනවා හොඳයි,,

''මහත්තය ඉන්න වෙලාවට ඒ ඇත්තො හතර මායිමට වත් ඇතුළුවෙන්න බයයි මං දන්නව ඒ ඇත්තො කොහොමටවත් එන්නෙ නැහැ අර මර දූතිටත් මගෙ කෙරුම් ටිකක් තාම පෙන්වන්න බැරිවුණා මොනව කරන්නද මහත්තයා නිසා ?,,

"නිලමෙ, මං යනව තව ටික වෙලාවකින්' දහ කරන්නෙ නැතිව ඉන්න ඕනැ. තේරුණාද ?,,

"හොඳයි, හොඳයි මහත්තය."

සත දහයේ කාසියක් කහ දියරින් සෝදා පිරිසිදු රෙදි කඩක ගැට ගසා එය නිලමෙ අසලට කිට්ටු කළෙමි.

"නිලමෙ දන්නවද මේ මොකක්ද ? කියා"

ඔව් මහත්තය· ඔය කතරගම දෙවියන්වහන්සෙට පඩුරක්. එතකොට මහත්තය යන්නෙ මං කතරගම දෙවීහාමුදුරුවන්ට බාර කරලද මං කළ වරද මොකක්ද ඇයි මට මේ වද දෙන්නෙ ඔය පඩුර මං ග අතේ බැන්දම මං දැවෙයි. අනේ බුදු මහත්තය ඒක නම් කරන්න එපා" නිලමෙ බැගෑපත්ව ඉල්ලුවා.

,,ඔව් මේක කතරගමට පඩුරක් තමා. නිලමෙ වරදක් කළාට නෙවෙයි මේක බඳින්නෙ. නිලමෙට වරදින් වළකින්න. වරදක් කරන්න කලින් වළක්වන එක හොඳයිනෙ මේක බැන්දට නිලමෙ පිච්චෙන්නෙ වත් කිසිම කරදරයක් වෙන්නෙ වත් නැහැ' නිලමෙ දන්නවනෙ මං නිලමෙට කිසිම අනතුරක් නොකරන බව. හෙට උදේ මං එනතුරු කිසි හැලහොල්මනක් නැතිව ඉන්න හැකි යි. ඒකට තමයි මේ පඩුර බඳින්නෙ දැන් තේරුණාද?" දඟකාරකම් බැහැ කිසි කරදරයක් නැතිව ඉන්න ඕනැ.,. මං අවසන් වදන් කියේ තර්ජණාත්මකවය.

සූදානම් කරන ලද පඬුර කොග්ගල මහතාගේ ඉන වටා බැඳීමි. එය බඳින ගමන්ම මම කරණීයමෙත්ත සූත්‍රයද කීවෙමි. කොග්ගල මහතා දොහොත් මුදුන් දී වැඳගෙන සිටියේය. පිරිත අවසානයේ "සාදු සාදු සාදු" යි කීවේය. මගේ ගුරුකම හරිගිය බැව් දතිමි.

'දැන් කිසි දෙයකට බයවෙන්න එපා මං කී හැටිසට හෙට උදේ මං එනතුරු නිලමෙ සන්සුන්ව ඉදිවි. " මා කොග්ගල මහත්මිය අමතා කියේ නිලමෙටද ඇසෙන සේය.

මා කාමරයෙන් පිටත්ව යනු බලා සිටි නිලමෙ "මහත්තය හෙට උදෙන් ම එන්න "යි කිවේය.

එය ඇණුම්පදයක් දෝහෝයි මා නැවත නිලමෙ දෙස බැලීමේදී මට හැඟීගියේ එය ඇණුම්පදයක් නොව ඇත්තෙන්ම ඔහු මගේ පැමිණීම උදයේම බලාපොරොත්තුව සිටි බවය·

රෑ නවයට පමණ ගෙදරට ලඟාවූ මා මළයකෙකු සැරිසරන ගෙදරක සිට මහරෑ තනිව ඒම ගැන මගේ භයානිව අසතුටක් දැක්වූවාය. කොග්ගල මහතාට මළයකෙක් වැහී ඇති බවත් එම යකා ඉතා දරුණු එකෙක් බවත් ඒ වනවිට මුළු පලාතෙම පැතිර තිබු බැවින් ඇයටද ඒ ගැන විස්තර ලැබී තිබින.

මං නිවසට පැමිණී වහාම මගේ බිරිඳගෙන් මං ඇසුවේ "අද සවස දෙකට විතර ඔයා සිටියෙ කොහිද?" යන්නයි ඒ, නිලමෙ මගේ ගෙදරට පැමිණ එහි එවෙලේ සිදු වූයේ යැයි කී දේ ඇත්තදැයි දැනගැනිමටය.

'ඇයි? මං හිටියෙ ගෙදර." ඒ ඇගේ කෙටි පිළිතුරයි

'ගෙදර තමා. මං දන්නව. දෙකට විතර මැණික මෙහි ආවද?"

ආහ් ඔව් ආව. දෙකට විතර මැණික යවල මාරිමුත්තු කඩෙන් සීනි ගෙන්වා ගත්ත."

වෙන මොනවද කිවෙ? මං ගැන මුකුත් කීවද.?

ඔව්. මං මැණිකට කීව මහත්තය රෑයේ ගිය ගමන් ආවේ නැහැ. හැන්දෑවට ගිහින් බලල එන්න කියා. ඒ බව ඔයා කොහොමද දන්නෙ?"

මං එය ඇසුවෙ නිලමෙ කී දෙයක ඇත්ත නැත්ත සෙවීමට. කී විට ඇය තවත් විමසිලිමත් වූවාය.

කවුද නිලමෙ කියන්නෙ?"

"නිලමෙ කියන්නෙ කොග්ගල නිලමෙ ඒ නම හැදුනෙ නම දෙකක් එකතුවීමෙනුයි. මැරුණ නිලමෙ කෙනෙක් කොග්ගල මහත්තයගෙන් පලිගන්න කොග්ගල මහත්තයට ආවේස වුන. දෙදෙන එකතුවෙල එක ශරීරයක ඉන්න නිසා කොග්ගල නිලමෙ කියන නම හැදුන."

කොග්ගලගේ සහ නිලමෙගෙ දුව අනුලාවතීගේ සම්බන්ධය ගැනත් කොග්ගල මාරුවී ගොස් පද්මාවතී සමග විවාහ වූ හැටිත් නිලමෙ මිය ගොස් පලි ගැනීමට පැමිණි සැටිත් විස්තර කිරීමට මට සිදුවිය. ඒ ඇසීමෙන් ඇය තුල සෑහෙන බියක් ඇතිවුයෙන් මම ඒ ගැන පසුතැවිලි වීමි. ශරීර රහිතව අප අතර හැසිරෙන භූතයින් පිළිබඳව දිගු විස්තරයකින් ඇයගේ බිය පහකළෙමි.

නිදිදෙව් දුව මා වෙත පැමිණෙන තුරුම මා කල්පනා කළේ කොග්ගලත්. නිලමෙත් ජන්තුත් මකරත් රාවනත් ගැනය. රාවනා ගැන මා රාමායනයෙන් කියවා ඇතත් එහි සඳහන් වනුයේ ඉන්දියානුවන් අපේ රටේ සිටි අධිරදෙකු පහත්කර ලියා ඇති දේ යැයි ද මට සිතිණි. එනිසාම ඇත්ත ඇති සැටියෙන් වටහා ගැනීමට එකල අප රටේ ජීවත්-වුවන්ගෙන් විමසීමද ඉතාමත්ම ඇවැසි බව මට සිතුනි

මට ලැබී ඇති අවස්ථාව ඉතාමත් විරල අවස්ථාවක් බවත් එයින් උපරිම පල නෙලීමටත් මම අදිටන් කර ගතිමි. ඒ සඳහා ජන්තු සහ මකර පමණක් එකල ජීවත්ව මියගිය තවත් අය ඇති නම් ඔවුන්ද ජන්තුගේ සහ මකරගේ උපකාරයෙන් ගෙන්වා ගැනීමට අදිටන් කර ගතිමි.

එපමණක් නොව ඒ හා සමගම මගේ මතකයට නැගී ආයේ මා 1946 වසරේදී බදුල්ල රෝහලේ සේවය කරද්දී රාවනා ඇල්ලත් රාවනා ලෙනත් ගැන අසන ලද කතාවකි· පරම්පරා ගනඩ පැවත ආ ඒ ජනකතාවේ ඇත්ත නැත්ත සෙවීමට මෙය මහඟු වරමක්යැයිද සිතුවෙමි.

(3)

තෙවැනි දිනය

අළුයම පහට පමණ මා අවදි වූයේ කවුදෝ දොරට ගසන ශබ්දයෙනි. දොර ඇර බැලුවිට මා දුටුයේ මා කැඳවාගෙන යාමට කොග්ගල මහතාගේ ගෙදරින් පණිවුඩයක් රැගෙන වුත් සිටි සියාතුය.

පෙර දින රෑ කිහිප වරක්ම නිලමේ මා ගැන විමසූ බවත් හිරු නැඟීමට පෙර කෙසේ හෝ මා හමුවීමට ඇවැසි බවත් ඔහු කියා ඇත. මා ටික වේලාවකින් පැමිණෙන බව කියා සියාතු පිටත් කිරීමට තැත් කළද හේ මා සමඟම යා යුතු බව තරයේ ම කියා සිටියෙන් නොපමාවම මම එහි යාමට ලහි ලහියේ සූදානම් වීමි.

අළුයම තේ බොන විට මගේ බිරින්දෑ මා සමඟ කීයේ පෙර දින රෑ දොළහට පමණ ගෙදර ඉදිරිපිටවූ ජම්බු ගස එවේලේ හැමූ තද සුළඟකින් කඩා වැටෙනු ඇසී මා අවදි කිරීමට ඇය කොතකුත් දිරි දැරූ නමුත් නොහැකි වූ බවත්ය. එම ගස කැඩී තිබුණි නම් මා උදෑසන දොර ඇරිය විට දක්ක යුතු බවත් එබන්දක් මා නොදුටු බවත් ඇය සමඟ ගොස් බ ලූ විට ගස යහතින් තිබෙනු දුටිමි.

තේ පානයෙන් පසු, හිරු නැඟීමට පෙර කොග්ගල මහතාගේ ගෙදරට ලඟා වීමට පිටත් වීමි.

අතර මඟ දී සියාතු මා සමඟ කීයේ පෙර දින රෑ කොග්ගල මහතා බොහෝ වේලා හොඳ සිහියෙන් පසුවූ බවත් වරින් වර ආවේශ වී නොයෙකුත් දේ කී බවත්ය මා හමුවීමට අමුත්තන් කිහිපදෙනෙකුම පැමිණ ඇති බවත් මකර නම් බූතයෙක්ද මා හමුවීමට නොඉවසිල්ලෙන් සිටින බවත් නිලමේ කිහිප විටක් ම කියා ඇත.

කොග්ගල මහතාගේ ගෙදරට යන විටත් හිරු නැඟී නොතිබිණ. මා එහි පැමිණීමට විනාඩි කිහිපයකට පෙර නිලමේ කතා කොට මා ගෙදරින් පිටත් වූ බවද නව ටික වේලාවකින් එහි පැමිණෙන බවද පවසා ඇත. මා ගෙදරට ගිය විගසම කොග්ගල මහත්මිය මට කීවේ පිරිත් කීමට සංඝයා වහන්සේලා කිහිප නමකට ආරාධනා කර ඇති බවත් උදය වරුවේ උන්වහන්සේලා වඩිනු ඇති බවත්ය. කොග්ගල මහත්මිය දුන් තේ තේ කෝප්පය බොන විට කොග්ගල මහතා කාමරයේ සිටශබ්ද නගා කතා කරණු ඇසිණ. කොග්ගල මහතා මා පැමිණි බව දුටුයේ නැත.

''මහත්තය එන්නකො මෙහාට. ඔය තේ එකත් අරගෙනම එන්න. මහත්තයට කියන්න දේවල් බොහොම තියෙනව.''

තේ කෝප්පයත් අතේ ඇතිව ම මා කාමරයට යන ගමන්ම'' හා නිලමේ, ගුඩ් මෝනිං මොකෝ තේ ටිකක් නිලමෙටත් දෙන්නද?'' යි මම ඇසීමි.

''අපේ මේ තරම වටිනා බාසාවක් තියෙද්දි ඇඩි මහත්තයො ඔය මොර බාසාවක්? මෝනිං විතරද හොඳ වෙන්න ඕනැ? ඇයි එතතින් එහාට ගෙන ගහල ගියත් කමක් නැහැ නේද?' මහත්තය මටත් තේ ටිකක් ඕනෑද ඇහුව නේද? අනේ මන්ද මහත්තය, මහත්තය ගෙන් සංග්‍රහයක් විදින එකත් මට මහා ගව්රවයක්. හොඳයි එහෙනම මහත්තයගෙ තේ කෝප්පෙන්ම ටිකක් දෙන්නකො. ඊත් මට කෑම බීමනම් ඕනැ නැහැ.

මම තේ කෝප්පය ඔහු වෙත දිගු කළෙමි. ''හපෝ බැහැ මහත්තය ඔහොම නොවෙයි. මහත්තය බීල ඉතිරි කරල චුට්ටක් දෙන්න.'' මං තේ බාගයක් බී ඉතිරි බාගය නිලමෙට දුනිමි.

නිලමේ කෝප්පය දෝතින්ම ගෙන එය අමෘතයක් සේ බීවේ එක් උගුරටය.

''මහත්තය කවුද කියල හරියටම දැන ගත්තෙ ඊයේ රෑ තමා. ඊයේ රෑ මෙහෙ හරි සෙල්ලම්. මහත්තයගෙ පරණ යාළුවො කීප දෙනෙක්ම ආව මහත්තයව බලන්න. කෝ ඔතැම වෙලාවට මහත්තය නැහැ පොවෑ මට බෙරිල්ලක් නැහැ මහත්තය ඉන්න තැනට ඒ අයත් එක්ක යන්න කියල. ඉතිං මං ඒ ඇත්තොත් එක්ක ගියා මහත්තය-ගෙ ගෙදර දිහාවෙ. මහත්තය ගොරව ගොරව නිදි හැබෑටම මහත්තය ඔය තරම් හොඳට නිදගන්න හැකි හිත නිදහස් අයටළු, නේද? අපි කට්ටියම එකතු වෙල මහ හුලඟක් මැව්ව. දොරකඩ තිබුණ මහ ගහක් කඩා දැම්ම.''

''මොනව? මොනගහක්ද? දොරකඩ තිබෙන ගහ තාම ඒ විදියට ම තියෙනවනෙ. නිලමේ බොරුත් කියනව වගෙයි.''

''බොරු නම් අහන්න නෝනමහත්තයගෙන්. ඒ සද්දෙට නෝන මහත්තය නැඟිටල මහත්තය අවදි කරන්න කොයි තරම් වෑයමක් කළාද? කොහෙද මහත්තය නොවෙයි අවදි වුනේ. මකර මහත්තය ගෙ ඇඳ ලඟට ගිහින් මහත්තයා දිහා හුඟාක් වෙලා බලාගෙනත් හිටිය නෙ. මහත්තය රා[illegible]නා කාලෙ මකරලත් එක්ක භාරතයටත් ගියාලු රාවනා වෙනු-වෙන් සටන් කරන්න. මහත්තයගෙ ඒ කාලෙ නමත් කීවා. මට දැන් මතක නැහැ. දැනට අවුරුදු දාහකට වාගේ උඩදී මකර ගිහින් තියෙනව හූණියන් දේවතාවුන් වහන්සෙත් එක්ක යඥ කට්ටුවෙ රැස්වීමකට. ඒ රැස්වීම තිබිල තියෙ-න්නෙ සමනල අඩවියෙ කුහරගලයි. ඒ හමුවුනාට පස්සෙ මහත්තය දැක්කෙ ඊයෙ රෑලු. අද ඉර පායන්න ඉස්සර කොහොම හරි මහත්තයට මේ බව කියන්න කීව. නොවෙ-රදවාම අද රෑට එන බව කීව.' නිලමෙ දිග විස්තරයක් කළා

''ඇයි නිලමෙ ඒ අය දැන් ගෙන්වන්න බැරිද?'' මා ඇසුයේ නොඉවසිලිමත්වයි.

''ඒ අයට කතා කරන්න බොහොම රහසිගත දේ තියෙනවළු. ඒ නිසා දවල් කාලයෙ තවත් අය මෙහි ඉන්න

නිසා කතා බහට අවහිර වේයැයි කීවා. ඒ අය කීවා ඒ අයට මහත්තය හමුවුනෙ මං නිසා, මට බොහොම ප්‍රසංසා කළා මහත්තය මාත් දූන් හරි කෙරුම් කාරයෙක්. මටත් දූන් බලවත් යාළුවෝ ඉන්නවා. මං දන්නවා දූන් මට කිසි අතවරයක් කරන්න බැරි බව.

පරසිඳු පබු දනන් කළ පමණින් ඇසුරු
බෙලෙනිඳු මද වුවත් නොකරෙති රුපුන් ගරු
බරණිඳු ගෙල වසන නා රද වෙමින් සරු
ගුරුලිඳු අතින් ඇසි කිම යහළු තොරතුරු

''නිලමෙ හරි කවි කාරයෙක්නෙ. සුබාසිතෙත් කට පාඩම්නෙ'

'ඇයි මහත්තයො මං ගුරුවරයෙක් නෙ. මං ඔය පොත් ඔක්කොම කියවල තියෙනවා. හුඟක් හරිය කට පාඩම් කරලත් තියෙනවා. ඒ කාලෙ හැටියට මමත් ඒ පලාතෙ හිටිය හොඳ උගතෙක්.'

නිලමෙ වට පිට බැලුවේ මහත් අසහනයෙකින් මෙනි.

'ඔහොම ඉන්න මහත්තය, පිරිත් කියන්න හාමුදුරුවරු වඩිනවද කියල මං බලාගෙන එන්නම්.'

නිලමෙ පිටත්ව ගිය බැව් පෙණුන කොග්ගල මහත්මිය පිරිත් දේශනයට කටයුතු සූදානම් කරමින් සිටියා ය. නිලමෙ ආපසු පැමිණි බව පෙනිණ.

'මහත්තය මං ගිහින් ආවා. ස්වාමීන් වහන්සේලා පස් නමක් වඩිනවා, මෙන්න ජන්තුත් ඇවිත් ඉන්නවා. කෝ එයාගෙ කැපය නැති නිසා මහත්තය එක්ක කතා කරන්න විදියක් නැති නිසා ලතවෙනව. ජන්තු කියනව මකරයි තවත් එක්කෙනකුයි අද රෑට එනවලු. මකර ඇර තව කෙනෙක් මහත්තය හමුවන්න ආසාවෙන් ඉන්නවලු එයා රාවන-යුගය ගැන දිග විස්තරයක් දෙන්න සූදානම්ලු. හැබැයි මහත්තයයි මමයි කොග්ගලයි කැපයයි හැර වෙනත් කවුරු-වත් මෙහි ඉන්න එපාලු. බොහොම රහසිගත දේත් කියන්න යනවලු.

ඊයෙ රෑ මකර ඇවිත් මහත්තය බලල ගියාට පසුව ඒ ඇත්තන්ගෙ හමුවක් පැවැත්වුවලු. ඒ හමුවෙදි ජේනයා කිවලු ඉතාම කිට්ටු අනාගතයෙදි හෙළ දෑයට මහත් විනැසිරි-යක් එනවලු එය නවත් වන්න නම් අපේ හෙළ දූයේ අතීතය ගැන විස්තර පතුරුවා හරින්න ඕනෑලු.

හැම වසර දෙදහස් පන්සියයකට වරක් අපේ දූය වැනසෙනවලු. වසර දහදහසකට පෙර රක්ආනෙ තාරක මහරජතුමා සුර අසුර යුද්දෙදි සුරයින්ගෙන් මැරුම් කෑවලු.

වසර හද්දහස් පන්සියයකට පෙර මහබලිපුර මහ බලිරජතුමා සුරයින් ගෙන් මැරුම් කෑවලු.

වසර පන්දහසකට පෙර මහා රාවණා රජතුමා ගෙල සිඳ ගත්තෙ රාම කුමාරයට පැරදුන නිසාලු.

වසර දෙදහස් පන්සියයකට පෙර සිංහ පවුලෙ විජය මෙහි පාවෙල ඇවිත් සිව් හෙළ දූයට තමන්ගෙ පවුලෙ නම වන සිංහ එකතු කරල සිව් කපල සිංහ හෙළයක් හැදුවලු. ඉන් වසර දෙදහස් පන්සියයකට පසු මේ යුගයෙ ත් සිංහලය නැති වෙනවලු.

ඒ ටික ඒ අයට කරන්න හැකියාවක් නැතිලු. ඒ නිසා මහත්තයටවත් කියා තබන්න ඕනෑලු. මහත්තයට ඒ විස්තර දුන්නම හෙළිකළ යුතු මොනවද, හෙළි නොකළ යුතු මොනවද යන්න මහත්තය තෝරා බේරා ගනිලු. මං කල්-පනා කළේ කෑපය ගෙන්ඩා ගැනීම තමා අමාරුව.'

'ඊට මහක් මං යොදන්නම්. අපට කෑපයෙකු අවැසි නැහැ. ඒ ටිකත් නිලමෙටම කළ හැකියි. ඒ අය ආවම නිලමෙ කොග්ගලගෙ සිරුරින් අයින් වුනාම ඒ අයට හැකියි කොග්ගල මගින් කතා කරන්න. එය වඩාත් හොඳයි, එක් අතකින් කොග්ගලත් උගත් කෙනකු නිසා එම විස්තර හොඳින් තේරුම් ගෙන කියන්නත් හැකිවෙයි.'

'ඒකත් හොඳ අදහස තමයි. ඒ වුනත් කොහොමද මං කොග්ගල දාල යන්නෙ? මං අයින් වුනාම මට නැවත ආවේශ වෙන්න බැරි විදියට මහත්තය ආරස්සාවක් කළොත් මං ඉවරයි.' නිලමෙ කල්පනාකාරිව කීව,

''නිලමෙට මං විස්වාස නැතිද?''

''හොඳයි මහත්තය කියනවනම් කරන්නම්. කොහොමටත් මං ජන්තුගෙන් අහල එන්නම.'' නිලමේ ගොස් වැඩි වේලාවක් ගත නොකරම ආපසු ආවේය.

''මහත්තය මං ජන්තුගෙන් ඇහුව. ජන්තු එය ඉතාම හොඳයි කීව. මං ඇහුව එක්වරම මං කීප දෙනෙකුටම කැපයකු වන්නෙ කොහොමද කියා, ජන්තු කිව එක්වරකට කතා කරන්නෙ එක් අයකු බැවින් ඉන් අපහසුවක් නැහැ කියා.''

සංඝයා වහන්සේලා ගෙදරට වැඩිය බව නිලමේ අප සමඟ කී බැවින් කාමරයේ සිටි එක් අයෙකු හැර අනිත් සියළුදෙනාම උන්වහන්සේලා බැලිමට ගියහ. සංඝයා වහන්සේ පස් නමක් වැඩමකර සිටියහ. නිලමේ කලින් කී දේ ඇත්ත විය.

මේ වනවිට මුළු ගම පෙදෙස පුරාම කොග්ගල මහතාට ආවේශ වී ඇති මළ යකා ගැනද ඔහු මගේ අණසකට යටත්ව සිටින බවද පැතිරී හමාරය.

ආලින්දයේ වැඩ හුන් සංඝයා වහන්සේලා විසින් අසන ලද නොයෙකුත් පැණයන්ට පිළිතුරු දීමට මට සිදුවිය. ඒ වනවිට බූතයින් පිලිබඳ සෑහෙන අත්දැකීමක් ලබ සිටි මම මට හැකි තරමින් කරුණු තේරුම් කර දුනිමි. නිලමේ මගේ අණට කීකරු වී සිටීමට හේතු විමසූ විට මට ඊට කෙළින්ම පිළිතුරක් දීමට නොහැකි විය ඇතැම් විට මා පෙර අත්බැවේදි බොහෝ සේ දන් දී පින් රැස්කර ගෙන ඇති බැවින් එය විය හැකියැයි නායක හිමිපාණන් වහන්සේ කී සේක. මිනිස් ලොව දිවි ගෙවනතුරු තම

තමන්ගේ වස්තුව කෙරෙහිත්, නෑ දෑ දූ දරුවන් කෙරෙහිත් සීමා රහිත තන්හාවකින් කල් ගෙවූ අය මරණින් මතු මළප්‍රේතයින් වන බවත් දන් දීම එම ආශාව තුරන් කිරීමට ඇති ප්‍රධාන ම මාර්ගය බවත් උන්වහන්සේ දේශනා කළ සේක.

මේ සියල්ල බුදු දහමේ ඇතුලත්ව ඇති බවත් එබඳු දුකින් මිදීමට ඇති එකම මග කුම්මැහියකු නොවී දානමානාදි පින්කම් කිරීම බවත් ඒ හිමියන්ගේ දෙසුමෙන් අපට අසා ගත හැකිවිය. මිනිස්බව ලැබීම දිව්‍යාත්මභාවයක් ලැබීමට වඩා අපහසු බවත් එබැවින් අප ලබා ඇති එම දිවියෙන් නියම ප්‍රයෝජනය ගැනීම අප නාගේත් යුතුකම බවත් දෙසා වට පිට බලා යමක් අමතක වූවාසේ'' මේ අපේ අතරෙත් මිනිස් බව ලත් අය ලෝබ කුම්මැහිකමින් දැන් ජීවත් වන බව අප කවුරුත් දන්නා කරුණක් යැයි ද ඒ ගැන හොඳින් කල්පනා කළහොත් අපට පැහැදිලිව පෙනී යනු ඇතැයිද තව දුරටත් දේශනා කළ සේක.

සංඝයා වහන්සේලා වැඩහිටියේ කොග්ගල මහතා සිටි කාමරයට ඇතින් බැවින් උන්වහන්සේ කළ දෙසුම නිලමේට නොඇසුන නමුත් නිලමේ නාහිමියන්ට පිළිතුරු දුන් වීට හැම කෙනෙකුම පුදුම වූහ.

''හාමුදුරුවනේ, හිතන්න එපා මාත් ඔය කුම්මැහිකම කරල මළපෙරේතයෙක් වෙලා ඉන්න කෙනෙක්ය කියා. මා අයිති බලවත් යක්ෂ කට්ටුවට.''

හිමියන්ගේ දෙසුම එතැනින් අවසන් විය. නිලමේගේ අදහස අනුව ඔහු ලබා ඇති දිවිය ඔහුට සැපක් විනා දුකක් නැති බව නිලමේ කියන්නේයැයි සිමට මට සිතුනද බුදු බණට විරුද්ධව අදහසක් තාගේ මතයක් වුවද ඉදිරිපත් කර පව් පුරවා ගැනීමට බියෙන් මම නිහඩ වීමි.

ලොභ කුම්මැහියන් ලෙස ගම්මුන් අතර හංවඩු ගැසී සිටි කිහිප දෙනෙකුම පැමිණ සිටියවුන් අතර වූ බැවින්

නා හිමියන්ගේ දෙසුම ඔවුන්ට එල්ල කළ ඇණුම් පදයක් දෝ යි මම සැක සිතුවෙමි.

දහම් දෙසුම නතර කළ උන්වහන්සේ යම් යම් අයගේ මුහුණු බැලූ විට ඇතැමෙක් හිස සලා එය අනුමත කළ අතර ඇතැමෙක් උන්වහන්සේගේ බැල්ම මගහැරීමට මෙන් මුවා වූ සැටිද පැහැදිලිව පෙනුණි.

පිරිත් කීමට කටයුතු සූදානම් කෙරෙනතුරු මා නැවතත් කොග්ගල මහතා සිටි කාමරයට ගියෙමි. මා කාමරයට ඇතුළු වන විටම නිලමේ ඇසුවේ ''මහත්තය බණ ඇහුව නේද? අනේ හොඳ බණ ටික'' නිලමේ එසේ කීවේ ඔහුගේ නොවක් හැඟීමද නො එසේ නම් උපහාසයටදැයි තේරුම් ගැනීම මට අපහසුවිය.

කොග්ගල මහතාගේ කාමරයේ පුටු පහක් තබා පිරිවට අතුරා සංඝයා වහන්සේලාට වැඩ හිඳීම සඳහා සැකසින.

'කොහොමද නිලමෙ, ඊයේ රෑ කරදරයක් නැතිව නිදං ගත්තද?' මං ඇසුවේ නිලමේගෙ මානසික තත්ත්වය පිරිත් ඇසීමට සැකසී ඇතිදැයි දැනගැනීමටය.

'මොන නිදා ගැනීමක්ද මහත්තය මං කලිනුත් කීවනෙ අපට නින්දක් ඇවැසි නැහැ කියා. ඊයේ රෑ තිස්සෙ මකර ලත් එක්ක හැම තැනම ඇවිදින්න ගියා. ඒ අය හැම තිස්සෙම මහත්තය ගැනකීව. මකර මහත්තයගෙ හොඳ යාළුවෙක්ලු අද රෑ කොහොමහරි හමුවන්න ඕනැය කීව.

පිරිත් දෙසීමට වැඩම කළ සංඝයා වහන්සේලා අසුන් ගත් පසු මම පිරිත් නූල නිලමේගේ අතෙහි තැබුවෙමි.

'නිලමෙ දැන් පිරිත් ටිකක් අහන්නකො අපට නට පසුව කතා කළ හැකිනෙ' මම කීවෙමි.

'මහත්තය මං පිරිත් අහන්න කැමතියි නමුත් මංකමති නැහැ අර...... හාමුදුරුවො කියන පිරිත් අහන්න. එයා ළඟ කිසිම සීලයක් නැහැ. එයාට පිරිත් කියන්න එපා කියන්න.

සංඝයා වහන්සේලා පිරිත් දෙසුම පටන්ගත් සේක. 'නිලමෙ, කාගෙ කටින් කීවත් පිරිත්නෙ. බුදු ගුණනෙ කියන්නෙ. ඔහෙ කීවාවෙ'. නිලමෙගේ විරෝධය නැති කරණ අදහසින් මම කීවෙමි.

''ඒ උනත් මහත්තය, බුදු ගුණ කියතත් සිල්වතෙකුගෙ කටකින් කියන්න ඕනැ. කියන තැනැත්තා පිරිසිදු සිතින් යුතුයි. පිරිත් වල වචන නියමාකාරයෙන් උච්චාරණය කළ යුතුයි. ඒ වචන වලින් පිටවන ශබ්ද තරංග වලින් ශක්තියක් උපදිනව. පිරිත පටන් ගත් වේලේ පටන් අවසාන අනතුරු ගායනයේ ශබ්දය නොනවත්වා පැවතිය යුතුයි. ඒ නිසා තමා පිරිත් ගයන විට අඩුම ගණනේ දෙනාමක්වත් එක්ව පිරිත් ගයන්නෙ. ඔය කරුණු ටික සම්පූර්ණ වුනාම තමා පිරිතෙ නියම ගුණ ලැබෙන්නෙ.

අසිල්වත් අය සිවුරු දරණ එකත් වංචාවක්. පාපයක් සාපයක් ඔය ඇත්තෙතා හිතනවද මේ නිලමෙ පිරිත්වලට බියවෙල යන්න යයි කියල? නැහැ මහත්තය, මාත් හරි ආසයි පිරිත් අහන්න, නමුත් අර හාමුදුරුවන්ට නම් පිරිත් කියන්න එපා කියන්න.'

පිරිත් දෙසුම පවතින අතර නිලමෙ තරමක් නොසන්සුන් විය. ඔහු දැස් කරකවා ඉහතකී සංඝයා වහන්සේ දෙස ඔරවා බැළුවේය.

''ඔය .... හාමුදුරුවො නවත්වනව හොඳයි පිරිත් දෙසුම මං එක සැරයකුත් කිව. මං තරක මිනිහෙක් කියන්න එපා.,,

හිමි තම සිනා මුසු මුහුණින් යුතුව පිරිත් දෙසුහ. නිලමෙ තව වැරෙන් කැ ගැසීමට පටන් ගත්බැවින් පිරිත් දෙසුමට වඩා ඇසුනේ නිලමෙගේ කෑ ගැසීමය.

''ඔය දෙසුම නැවැත්තුවෙ නැතිනම් පුළුවනාව ඔය තල් අත්ත.'' නිලමෙ අවසන් තීරනය දුන්නේය.

ගිනි ගැනීමට කලක් නොවිය. අබල වූ පුටුවක් මත මල්බුලත් තට්ටුවෙහි දැල්වෙමින් තිබූ පොල්තෙල් පහනෙහි දුල්ල ඒ මේ අතට සැලෙමින් තිබින. .... හිමියන්ගේ පිරිත් දෙසුම නැවතිණ. අනෙක් සංඝයා වහන්සේලා දිගටම පිරිත් දෙසූ සේක. ඒ සමගම නිලමෙ සන්සුන්ව දොහොත් මුදුන් දී පිරිත් අසා සිටියේ මහත් සැහීමකිනි....... හිමියන්ද එතැනින් ඉවතට නොවැඩිය සේක. පිරිත අවසානයේදී නිලමෙට පින් අනුමෝදන් කරන ලදි.

නායක ස්වාමීන්වහන්සේ නිලමෙ ඇමතූ සේක ''නිලමෙ පින් අනුමෝදන් වුණාද?,,

''එහෙයි හාමුදුරුවනේ.''

,,දැන් ඒ ලැබූ පින් බලෙන් ඔය ප්‍රේත ආත්මයෙන් අත්මිදී කොග්ගල මහතාගේ සිරුරෙන් ඈත්වී මනුෂ්‍යාත්මයක උපත ලැබෙවායි ප්‍රාර්ථනා කර සාදු කියන්න.''

''හාමුදුරුවනේ, මං පින් අනුමෝදන් වුණා. එමින් මගේ බලතල තවත් වැඩිවුණ. ඒ ගැන ඔබ වහන්සේලාටත් පින් සිදුවේවා. මං ප්‍රේතයකු නොවෙයි. මං අයත් යක්ෂ කට්ටුවට. ඒත් මට කොග්ගල අත්හැරල යන්න බැහැ මං බොහොම මහන්සි වෙලයි කොග්ගලට ආවේශ වුණේ එහෙම තිබියදී මං කොහොමද කොග්ගල අත්හැරල යන්නෙ? අනික් අතට මෙන්න මේ මහත්තයාගෙන් අහලා බලන්න, ඒ මහත්තයගෙ ප්‍රතිපත්තියක් ගැන. ඒ මහත්තය කියපු හැටියට ''වරදක් කළ කෙනෙකුට දඬුවම් නොකිරීම වැරදි නොකර සිටින අයට කරන අපරාධයක්'' මාත් එය සම්පූර්ණයෙන්ම අනුගමනය කරනව. කොග්ගල මට වරදක් කරල තියෙනව. ඒ වරදට එයා දඬුවම් විඳින්න ඕනෑ. හාමුහුරුවො මං ප්‍රේතයෙක් කියල හිතාගෙන හිටියට මං කවුද කියල පෙන්වන්න පුළුවන්, ඒත් ......'' මෙහෙතෙම මැගැපත් ලෙස මං දෙශ බැළුවේය. ඉන් අනතුරුව දිග සුසුමක් ද හෙළුවේය.

පිරිත් අවසන් කර ආපසු වඩින සංඝයා වහන්සේලා සමඟ පසුගමන් ගිය මට නායක ස්වාමින්වහන්සේ වදාළේ නිලමේ පහසුවෙන් එලවීමට හැකි කෙනෙකු නොවන බවය.

ඔහු මට කීකරුව සිටිනුයේ කුමණ හේතුවක් නිසාදැයි තව දුරටත් සොයා බලන ලෙසද උන් වහන්සේ මට කීයේක.

ඉහත සඳහන්......... ස්වාමින් වහන්සේ සමඟ පිරිතෙන් පසු සාකච්ඡාවක යෙදී සිටි සියදෝරිස් මට මඟදී හමුවිය ඔහු මං සමඟ කී අන්දමට නිලමේ......... ස්වාමින් වහන්සේට පිරිත් කීමට ඉඩ නොදී ඇත්තේ, උන්වහන්සේගේ පිරිත් කීම ඉතාමත් බලවත් බැවින් නිලමෙ ඊට ඉඩ නොදුන් බවත් උන්වහන්සේ පිරිත සම්පූර්ණයෙන්ම දේශනා කළේ නම් නිලමෙ පිලිස්සී යා හැකි බවත්ය. ඒ බව ඒ ස්වාමින් වහන්සේ සියදෝරිස්ට කී බවද ඔහු මං සමඟ කීයේය. ඒ ස්වාමින් වහන්සේගේ අදහස විය හැකිය.

මා අනපසු කොග්ගල මහතාගේ කාමරයට යන විට ඔහු මා එනතුරු බලා සිටියේය.

,,ඈ, මහත්තයො, මේ ඇත්තො හිතන්නෙ මා පිරිත් කියල එලවගන්න හැකිවෙයි කියල. ඒ හරිය නම් බැරි වෙයි අපේ ඇත්තො පිරිත් වලට බය නැහැ. ගරු කරනව. ඒ ගරු කිරීම අවියක් කරගන්න බැහැ පින් අරගෙන වෙන ආත්මය කට යන්න කැමති නම යන්න හැකියි නමුත් බලෙන් යවන්න බැහැ හාමුදුරුවො ඒ ටික දන්නෙ නැති හැඩයි''

''එහෙනම් ඒ පිරිතෙන් ඇති පලක් නැහැ.'' මා කීවේ කලකිරීමෙන් මෙනි.

,ඇයි නැත්තෙ? දැක්කෙ නැතිද මං බොහොම අශාවෙන් අහගෙන හිටිය ඒ පිරිතෙන් මගෙ බලතල වැඩිවුණා, මට දැන් අමුතු ප්‍රාණවත් ගතියක් දැනෙනව. පිරිත් අහන්න කලින් මං එහා මෙහා ගියෙ බොහොම අමාරුවෙන් නමුත් දැන්? ෂහ්, විදුලිය වගේ.''

,,පිරිත් කියපු සංඝයා වහන්සේලා පස් නමක් වඩින බව නිලමෙම කීවේ උන්වහන්සේල මෙහාට ඒමට කලින් ඒ කොහොමද කීවෙ?''

,,ඇයි මහත්තය, මං ගියාගෙ පන්සල පැත්තෙ. ඉතින් මං දැක්ක හාමුදුරුවරු පස්නමක් වඩින බව. ඔය මහත්තලාටවගෙ නොවෙයි අපට බොහොමදුර පෙනීමක් තියෙනව. මහත්තලට නම් අතේ දුරවත් පෙනෙන්නෙ නැහැනෙ ඇගේ හැපුණත් පෙනෙන්නේ නැහැ. මං මේ ගෙදරට ආ දවසෙ ඉඳල කී දෙනෙකුගෙ ඇගේ හැපෙන්න ඇතිද? නමුත් ඒ කවුරුවත් මං දැක්කෙ නැහැ මහත්තය දන්නවනෙ මට ඕනෑ තැනකට ගිහින් එහි සිදුවන දේ බලාගන්න හැකි බව, කියන දේ අසා ගත හැකි බව.,,

නිලමෙට ඇස් නැහැ කන් නැහැ. එතකොට කොහොමද අහන්නෙ, බලන්නෙ?,'

මහත්තයත් කොතරම් කාරණා කාරණා දත් කෙනෙක් වුනත් මහත්තයත් නොදන්න දේ මේ ලෝකයෙ බොහොම තියෙනව. මිනිහෙක් හැදිල තියෙන්නෙ පංච මහා භූතයින් ගෙන් ආපෝ, තේජෝ, වායෝ, පඨවි, ආකාශ කියන පස් වැදෑරුම් දේ වලින්. ඒ පසෙන් හැදුන ශරීරයට අමතරව හැම සත්වයාටම හිතක් තියෙනව. මිනිහෙක් මැරුණම මිනිහගෙ හිත ඒ මැරුණ ශරීරයෙන් ඉවත් වෙනව. ඒ හිත තවත් ශරීරයකට ඇතුළු වීම තමා නැවත ඉපදීමය කියන්නෙ. අපි අහන්නෙ, බලන්නෙ වින්දනය ලබන්නෙ හිතෙන්. ශරීරය නැති වුනත් අහන්න බලන්න හැකියි. දැන් තේරුනාද?''

''වෙන්න පුළුවන්. හොඳයි නිලමෙ. ඔය ගැන පසුව කතා කරමු.'' මං කතාව නැවැත් වූයේ ඒ ගැන තර්ක කිරීමට තරම් දැනුමක් මට ඒ වන විට නොතිබුණේ යැයි සිතීමෙනි.

මහත්තය ඕව බොහොමයක් මං දැන ගත්තෙ මේ ඊයේ, මහත්තයගෙ පරණ යාළුවොත් එක්ක කතා කරද්දී. ඒ අයත් අද රෑ ආවම අපි තවදුරටත් ඔය ගැන කතා කරමු'

මේ වනවිට කෑම වෙලාවද ආසන්නව තිබූ බැවින් නිලමෙ සමග වැඩි කතාවකට මං නොපෙළඹිණ.

කෙසේ හෝ වේවා දිවා ආහාරයෙන් පසු නිලමේ සමග සාකච්ඡා කර බූතලෝකය පිලිබඳ විස්තර තව දුරටත් ලබා ගැනීමට සිතා ගතිමි,

නිලමේ බැඳ දැමීමට තව දින හතරකදී මාතරින් කට්ටඩි එන බව දන්වා මාතරින් ලිපියක් එදින ලැබුන බව කෑම කන අතර කොග්ගල මහත්මිය කීවාය. කොග්ගල සිටි කාමරය අප කෑම ගත් තැනින් තරමක් ඈතින් වූ බැවින් නිලමේ ගැන නොයෙක් දේ අනෙක් අය කතා කළ නමුත් මම ඒ කිසිවෙකට අනුබල දීමට ඉදිරිපත් නොවීමි. කෙසේ හෝ නිලමේට අහිතකර යමක් කතා කිරීමෙන් හැකිතාක් දුරට වැලකී සිටින ලෙස මම අනිත් අයට කීවෙමි ඇතැම්විට ඒ කතා නිලමේ අසා සිටියහොත් ඔහු දරදඬු වීමට ඉඩ ඇති බවද මම ඔවුන්ට කීවෙමි.

පෙර දින කීපයට වඩා නිලමේ දරදඬු කමින් අඩුවී ඇති බව ඔවුන් හැම දෙනම පිලිගත් අතර මගේ ඉල්ලීම පරිදි ක්‍රියා කිරීමට ඔවුන් පොරොන්දු වූහ.

මේ අතර මාතරින් කට්ටඩි පැමිණෙන තුරු නිලමේ හසුරුවා ගැනීම පහසුවීම සඳහා පළාතේ කට්ටඩියෙකු නූලක් බැඳීමට තවත් යාමයේ එන බවද කොග්ගල මහත්මිය මට පැවසුවාය. මේ ගැන මගේ අමනාපය පල කළ නමුත් ඉන් පලක් නොවීය.

නූල් බැඳීමට යාමේ දී කරදර ඇතිවිය හැකි බව මා පෙන්වා දුන් නමුත් පලාතේ බලවතෙකුගෙ ඕනෑ කමින් එය කෙරෙන බැවින් ඊට හරස්විය නොහැකි බව කොග්ගල මහත්මිය කී විට මම නිහඩ වීමි.

සැතපුම් දොලහකින් මෑත පොලිසියක් නොවූ බැවින්ද පලාතේ බලවතාත් මහජන නියෝජිතයාත් ඔහු වූ බැවින් ද ඔහුගේ අදහස් වලට පටහැනිව ක්‍රියා කිරීමට අකැමැති වූයේ ඔහු කියන දේ නොකලොත් පළාතේ විනුමක් නැති බැවිණි.

කලින් කර ගත් තීරණය අනුව භූත ලෝකය පිළිබඳව තවත් විස්තර ලබා ගැනීමට මම කොග්ගල මහතාගේ කාමරයට ගියෙමි. මා කාමරයට ඇතුළු වූයේ නිලමේ ගැන කතා කළ දේ කිසිවක් නොදත් පරිදිය.

"ඉතින්, නිලමෙ, කොහොමද? අපි නම් කෑව. නිලමෙට මොකුත් නැහැනෙ."

"මට මොකුත් ඕනෑ නැහෑ මහත්තය, මහත්තයගෙ කරුණාවම ඇති. ඒත් ඔය බකපණ්ඩිතයින්ට කියන්න මට කොචොක් කරන්න ඇවිත් පොට වරද්දගන්න එපා. කියල ඔය හැන්දෑවට එනවයි කියපු. තක්කඩිය මම දන්නව. ඌට එන්න කියපු පලාතෙ වැදගතොත් මං දන්නව පත්තිනි දේවාලෙ ඉන්න මගෙ යාළුවෙක් මට කිව උන්දෙන්නම අද හැන්දෑවෙ එනව කියල. ආපුදෙත්. ඔය දෙන්නටම මං හොඳ පාඩමක් උගන්වන්නම්. මාතරිනුත් කට්ටඩි එනවළු නේද? හොඳයි ආපුදෙත් මං බලාගන්නම්. ඔය කට්ටඩී දාහකට කරන්න බැරි දේ දැනටමත් මහත්තය කරල තියෙනව. ඒ බව උන් දනනෙ නැහැ මං කියා දෙන්නම් කො."

"එන පොට හොඳ බව මට වැටහිණ. නිලමේ මට මිතුරු බවක් දැක්වූ බැවින් මට උවමනා විස්තර පහසුවෙන් ලබා ගත හැකි බව මට විශ්වාස විය.

"නිලමේ හරි සන්තෝසයෙන් ඉන්නව වගෙයි."

"ඔව් මහත්තය, මට හරි සන්තෝසයි. මං ජීවත්ව සිටි කාලෙවත් හිටියෙ නෑති තරම් යාළුවෙක් මට දැන් ඉන්නව ඒක ලොකු සැනසීමක්."

"නිලමෙගෙන් මං පොඩි උදව්වක් බලාපොරොත්තු වෙනව. මං හිතනව නිලමෙ මට ඒ උදව්ව කරාවිය කියා."

"කියන්න මහත්තය. මං මහත්තයට ඕනෑ උදව්වක් කරන්න ලෑස්තියි. පණ උනත් දෙන්නම්. හැබැයි කොග්ගල අත හැරල යන්න කියන්න නම් එපා."

''ඔව් නිලමෙ පණ දෙන්නම කියයි. නිලමෙට පණක් නැති නිසා. නිලමෙට තියෙන්නෙ හිත විතරක්නෙ.''

ඒකත් ඇත්ත තමා. ඒක මට නිකම් ඔහෙ පුරුද්දට කියවුනා.''

'මං නිලමෙට කොග්ගල මහත්තය අත්හැර යන්න කියන්නෙ නැහැ. ඊට හේතුව මං නිලමෙ හොඳ හැටි තේරුම් අරන් තියෙනව. නිලමෙ ගෙන් මට බොහොම දේ ඉගෙන ගන්න පුළුවන්. මිනිසුන් මෙතෙක් නොදත් දේ භූතලෝකය ගැන කියා දෙන්න පුළුවන්. ඒ විස්තර නිලමෙගෙන් ලබාගෙන ලෝකයාට දීමට මං අදහස් කරනව. භූත ලෝකයෙ ඉන්න කෙනෙකුගෙන්ම එම විස්තර ලබාගැනීම වැදගත් වෙනව.

නිලමෙ කිව නොවෙද නිලමෙ ප්‍රේතයකු නොවෙයි යක්ෂ කට්ටුවට අයිතියි කියල. මං හිතාගෙන හිටියෙ යක්කු හොල්මන්, අවතාර ප්‍රේතයො ඔක්කොම එකයි කියල. ඉතින් ඔය ඔක්කොම එකම ජාතියක් නොවෙත් නම් මොනවද? වෙනස්කම්? මේ ගැන සම්පූර්ණ විස්තරයක් නිලමෙට දෙන්න හැකිනෙ කියන්න බලන්න.

මහත්තය, ඔය යක්කු, කිවම ඒ අයගෙත් නොයෙක් ප්‍රභේද තියෙනව. ඒ ඒ අයගෙ බල පුළුවන්කාරකම් වෙනස් සමහරෙක් මිනිසුන්ගෙන් බිලි පිදේනි ගැනිමට මිනිසුන්ට විනා කරනව. සමහරෙක් මිනී මරනව. සමහරෙක් හරි අහිංසකයි මිනිසුන්ට උදව් කරන අයත් ඉන්නව සමහර ප්‍රේතයොත් සාස්තර කියනාව ,,නිලමෙට බැරිද? සාස්තර කියන්න?''

,,අනේ මට බැහැ මහත්තයො. මට පුළුවනි නොගේ හරි ගිහින් එතැන සිදුවෙන දේ බලාගෙන ඇවිත් කියන්න කවුරු හරි කතාවෙන දේ අහගෙන ඇවිත් කියන්න. ඒ මිසක පසුගිය දේත් ඉදිරියට සිදුවෙන දේත් කියන්න මට පුළුවන් කමක් නැහැ. එහෙම හැකි අයත් ඉන්නව.

'මට තිබෙන ලොකුම බලය තමා කොග්ගල අරගෙන යන එක ඒක නම් කරනවා කරනවා මයි.''

'නිලමෙ කිවනෙ මං පදිංචිව ඉන්න වත්තෙ හැම තැනම ඇවිදල තියෙනව කියල. නිලමෙ දැක්කද ඒ වත්තෙ මං සිටුවල ඇති බෝ පැලය?

'ඔව්, මං දැක්ක ඒ පැලය බොහොම ජයට හැදෙනවනෙ කොහෙන්ද ඒක හොයා ගත්තෙ? ඒ බෝ පැලය හොඳ ජාති පැලයක් වගෙයි පෙනෙන්නෙ. පැල කරල තියෙන තැනත් හරි හොඳයි.''

'.හොඳයි ඒ බෝ පැලයේ කොළ ගණන කීයද කියන්න හැකිද?

''හොඳයි මහත්තයට කියන්න හැකිද කොළ කියක් තියෙනවද කියල? මහතත්ය කොහොමටවත් ඔය බෝ පැලයේ කොළ ගණින්ට නැහැ මං කීවොත් කොළ දෙසියක් තියෙනව කියල ඒක එහෙම නොවෙයි කියල මහත්තයට දැන් ඔප්පු කරන්න බැහැ එතකොට ඒ කියමන ඔප්පු කළෙත් නැහැ නොකළෙත් නැහැ ඒවගෙ දේ ඔය බූතයින් ගැන විශ්වාසවලත් තියෙනව මහත්තය.''

,,නිලමෙ තර්ක කිරීමට දක්ෂයිනෙ ඒත් හැම තැනම තර්කය සත්‍යය නොවෙයි. කමක් නැහැ. දැන් ගිහින් බෝ පැලය බලාගෙන එන්නකො. කොළ ගණන ගැනගෙන එන්න. මට නිලමෙ හමුවුණාට පස්සෙ බූත ලෝකය ගැන පොතක් ලියන්න හිතුන. බෝ ගහ ගැන පරීක්ෂණයක් පොතට ඇතුලත් කරනව. නිලමෙ දැන් ඉස්සරට වඩා කතා කරනව. කියන දේත් හොඳට තේරෙනව ඒ නිසා මං හිතනව මං ලියන පොතට වැදගත් කරුණු රාශියක් නිලමෙ-ගෙන් ලබාගත හැකිවේය කියා දැන් නිලමෙ ගිහින් බෝ කොළ ගැනගෙන එන්නකො.''

,නිලමෙ ගිය බව දැනුණි. කොග්ගල පිටි අත්ලෙන් දෑස් පිස දැමුවේය. වතුර ටිකක් ඉල්ලුවේය. එහෙත් ගෙන ආ වතුර බීමට ඔහුට නොලැබිණි.

'මහත්තය, මං ගිහින් ආව. බෝ කොළ විසි හතක් තියෙනව. තව දිග ඇරුණෙ නැති එක දළුවකුත් තියෙනව එතනත් ඉන්නව මගෙ යාළුවෙක්. ජීවත්ව ඉන්දදි එයා හරි උපාසකයෙක්. එයා මහත්තයට කතා කරන්න ආසලු. නමුත් කතා කරන්න විදියක් නැතිලු. මහත්තයට කියන්න කිව්වා ඒ බෝ පැලය අශ්වත්ථ බෝධියක පැලයක් කියල. හොඳට සාත්තු කරන්න කිව්ව. ඒ බෝ පැලය ගෙන්වෙච්චෙත් එයාලු.

එපමණක් නොවෙයි, මහත්තයට තවත් පණිවිඩයක් තියෙනව හැබැටම මහත්තය කොහොමද ඔය බෝ පැලය ලැබුණෙ ?''

'ඔය බෝ පැලය කොහෙන් ලැබුණද කියල මට කියන්න බැහැ. දවසක් උදේ පාන්දරම ඉස්තෝප්පුවෙ තාප්පෙ උඩ ඔය බෝ පැලය තිබුණ. මං ඒ පැලය ගෙන ගිහින් පැල කළා. කවුරු ගෙනාවද 'කොහෙන් ගෙනාවද' කියන්න මං දන්නෙත් නැහැ.

දිනය නම් මට හරියටම මතකයි. එකදස් නමසිය පනස් තුනේ නොවැම්බර් මස දහවෙනිද උදේ බෝපැලය දැක්කෙ මගෙ කුළුදුල් පුතාගෙ උපන් දිනට දින තුනකට පසුවද'

''එහෙනම් මහත්තය, ඔය බෝ පැලය ගෙනෙන්න ඇත්තෙ මං වගේ කෙනෙක් වෙන්න ඕනැ.

''නිලමෙ දූන් කියන්නකො පණිවුඩය මොකක්ද කියා'.

මං එන ගමන් ගියා මහත්තයාගෙ ගෙදර දිහාවෙත්.

ගෙදර ලඟ ටිකක් වෙලා නතරවෙල හිටිය. මහත්තයගෙ ගෙදරට නෑ දැයො වගයක් ඇවිත්. මහත්තය නැහැ කියල නෝන මහත්තය පසුතැවිලි වෙනව.

'මහත්තයට එන්න පණිවිඩයක් වත් යවන්න ඕනැය කියලත් කීව.''

ඒ වෙලාවෙ වතුර වීදුරුවකුත් අතැතිව කාමරයේ සිටි කොග්ගල මහත්මිය ''හපෝ මහත්තය ඔය පවෝරිස් කියන ඒවා විශ්වාස කරන්න එපා. මහත්තය පිටත් කරලා මොකක් හරි නාඩගමක් නටන්නයි ඔය හදන්නෙ. නැයො ඇවිත් යැ යි කිව්වම මහත්තය යයිනෙ. ඔකා මහ කපටිය. ඉස්සර වතාවෙක් ඔය වාගෙ අපිව රැවැට්ටුවා' ඕව විශ්වාස කරන්න නම් එපා.'' යි කීවාය.

'මහත්තය මං එක්ක කතා කරන්න ඕනෑ නම් කියන්න ඔය ගෑණිට කාමරයෙන් එළියට යන්න කියල. ඔය ගෑණි තමයි කොග්ගල කැවෙ. වැදගත් කෙනෙකුට කතා කරන්න ඒ ගෑණි දන්නෙ නැහැ.' නිලමේ කියාගෙන ගියේ කෝපයකිනුත් නොවේ.

'හපෝ උන්දැගෙ වැදගත්කම. පෙරේත දණ්ඩට ඔහොම කතා කරල මදි. නටාපියකො තව ටික දවසක් එතකොට දැනේවි' ඒ කීවේ කොග්ගල මහත්මියයි. එසේ කියා නිලමෙ තවත් යමක් කීමට පෙර කාමරයෙන් පිටවී ගියාය.

එවිට නිලමෙ '' ඕව ගණන් ගන්න එපා මහත්තය ගෑණු ජාතියම ඔහොම තමා මගෙ මැණිකෙත් කොයි තරම් හොඳයි කිවත් සමහර වේලාවට එයත් එහෙම තමා''

'නිලමෙත් ටිකක් කල්පනා කර බලන්න නිලමෙ. නෝනා ටත් හිතට අමාරු ඇතිනෙ. කොහොම උනත් කොග්ගල නෝනගෙ මහත්තයනෙ.' යි මම කීවෙමි.

'මහත්තය, ඔය නෝනාට කොග්ගල හමුවෙන්න ඉස්සර යි මට කොග්ගල හමුවුණේ එතකොට එයා අයිති මට යි මගෙ දුව අනුලටයි. ඔය නෝනාට කොග්ගලගෙ අයිතියක් නැහැ.'

'මේ ඕනෑ නැති කතාවලින් අපේ කථාවට බාධා වුණා නිලමෙ අපි අපේ කතාව පටන් ගනිමු. නිලමෙ සමහර වෙලාවට ලොකු උගතෙකු වගෙ කතා කරනව. නිලමෙ

කොතරම් දුරට ඉගෙනගෙන තියෙනවද? පාසැලේ කීවෙනි පන්තියට යනතුරු ගියාද?''

''මං මොනිටර් විභාගෙට යනතුරු ඉගෙනා ගත්ත මහත්තය. ටික කලක් මං ඉස්කෝලයක ඉගැන්නුව මගෙ මාම කෙනෙක් තමා ඒ පළාතෙ එක්තරා පන්සලක නායක හාමුදුරුවො. පන්සලට අයිති දේ පොල, වතුපිටි රාශියක් තිබුණ. ඒව පිට කෙනෙකුට යනවට හාමුදුරුවො කැමති වුණේ නැහැ. ඒ දේපොල තෑ දැයෙකුට ම පැවරීමට ගුරුකම අල්ලල දාල මට මහණ වෙන්න කීව. එතකොට නායක හාමුදුරුවන්ගෙ දේ පොල ඔක්කොම මට අයිති වෙනව. මං රස්සාවෙන් අස්වුණා. ටික කලක් යනතුරු මහණ වුණේ නැහැ කල් දම දමා හිටිය. ඒ අතරෙ නීතියෙන්ම නොවුනත් හාමුදුරුවන්ගෙ පුතෙකු වන කෙනෙකු මහණ කර ගත්ත බාල ගෝලයකු වශයෙන් මහණ වීමට මං කැමති වුණේ නැහැ. මට මහණ කමත් එපා වුණ. මං වතුපිටි බලාගෙන ගෙදර උන්න. කොහොම උනත් හාමුදුරුවො පන්සලේ ඉඩමක් මට ලියල දුන්න.''

''එහෙමනම් නිලමෙ ලොකු උගතෙක්?''

''ඔව් මහත්තය, ඒ කාලෙ හැටියට, ඒ පළාතෙ හැටියට මාත් ලොකු උගතෙක් තමා ඒ වගේම මං හොඳ නම්බු කාරයෙක්, අපේ පරම්පරාව සිංහල රජකාලෙ වරප්‍රසාද ලත් පෙළපතක්.''

''ඇත්ත වශයෙන්ම නිලමෙ මං හිතා හිටියෙ නිලමෙ වැඩි උගතෙකු නොවෙය කියායි සාමාන්‍යයෙන් අපි හිතා ඉන්නෙ එබඳු ආත්ම වල උපදින්නෙ නූගත් ගැමියන් පමණක්ය කියා එහෙනම් ඒ මතය වැරදියි. නිලමෙ උගතෙකු නිසා ම අපට නොපෙනෙන ලෝකය ගැන එහි ඉන්න නිලමෙගෙන් වැදගත් කරුණු ලබා ගන්න පුළුවන් එයින් අපේ වැරදි මත ඇතිනම් ඒව දුරු කර ගන්න හැකියි.''

''මහත්තයගෙ අදහස බොහොම හොඳයි. එහෙම නම් මහත්තය නොදන්න ඕනැ දෙයක් අහන්න, මං කියා දෙන්නම්.''

''නොදන්න දේ ගැන අහන්නෙ කොහොමද නිලමෙ එහෙම නොවෙයි නිලමෙ භූතලෝකයෙ විස්තර කියන්න එතකොට මට නොතේරෙන දෙයක් මං අහන්නම්.''

නිලමෙ දෑස් පියා කල්පනා කාරීව ටිකවෙලාවක් ගත කළේය.

(4)

කොග්ගල නිලමේ බණ දෙසයි.

මහත්තය, මිනිහෙකුගෙ ඉගෙණීමත් උගත්කමත් අනුව දැණීම වැඩි වෙනව. උගත් කමක් නැතත් උපතින්ම බුද්ධිය ලත් අයත් ඉන්නව. සමහර විට එබඳු අය උගතුන්ටත් නොකළහැකි දේත් කරනව. උගත්කමත් බුද්ධියත් දෙකම එක් වුණාම තත්ත්වය කොහොමද කියා සිතා බලන්න. උගත්කම කියන්නෙත් එක්තරා විදියක මොළ සේදිමක් බොහෝ උගතුන්ට පොතපතින් පිට පෙනෙන්නෙ නැහැ.

,,මං බොහොම පොත් පත් කියෙව්ව. වැඩියෙන්ම කියෙව්වේ බුද්ධාගමේ පොත් පත් බණ ඇසිමෙන් නොවෙයි පොත් කියවීමෙන් ම මං සැහෙන දැනුමක් ලබා ගත්තා මං පන්සලට ගියෙ ඉතාමත් කලාතුරකින්. ඊට හේතුව' ආගම එපාවෙල නිසා නොවෙයි. මගෙ රස්සාවක් නැති උනාට පස්සෙ මහණ වෙන්නත් බැරිවුණා. ඉතින් එහෙම මිනිසුන් අතරමං කරණ අයගෙන් මොන බණ ඇහිමද?''

,,ටිකක් ඉන්න නිලමෙ. නිලමෙ මහණ වෙන්න අදහස් කළේ පන්සලේ දේපොල උරුම කර ගන්නද? එහෙම නැතිනම් සසරෙ දුක වැටහිල සසර දුකින් එතෙර වන්නද?,,

'මහත්තය මං අමාරුවේ දැම්ම නේද? නායක හාමුදුරුවො කී නිසා මහණ වෙන්න සිතුව. දේපොල අයිතිය සඳහා නායක හාමුදුරුවො තමන්ගෙම පුතා මහණ කළාට තමා මටත් ඒ පිස්තුවෙ ආසාව ඇතිවුණෙ මං පන්සල අත්හැරිය නිසාම ආගම අත්හැරියෙ නැහැ. ඒ නිසාම මං පව්කාරයකු කියල හිතන්න එපා. මං මැරෙන මොහොතෙ මගෙ දේපොළ කෙරෙහි මගෙ මැණිකෙ කෙරෙහි, කොග්ගල කෙරෙහි, සීමා රහිත ආදරයක් ඇල්මක් තිබුණ. ඒ මොහොතෙ මං දැනගත්ත මං මැරෙන බව. එක් අතකින් මගෙ පවුලෙ අනාගතය ගැන මං දුක් වුණා, මට මතක් වුණා සමහරෙක් මට මසුරෙක්ය කී හැටි. ඒත් මසුරුකම කළේ කාගේවත් දෙයක් කඩාවඩා ගන්න නොවෙයි මගෙ දේපොල නිකරුනේ නාස්ති කළේ නැහැ මිනිසුන් සමහ මං වැඩි ඇසුරක් තිබුණෙ නැති එක ඇත්ත ඒත් මං ගතකළේ ධාර්මික ජීවිතයක් මං දැන් බය නැතිව කතා කළෙ මහත්තය කරුණාවන්ත කෙනෙකු බව තේරුම් ගිය නිසා. ජීවත්ව ඉන්දදී මාත් ඔය වගෙම කරුණාවන්තයි''.

'එහෙනම් නිලමෙ මාත් මැරුණම නිලමෙ වගේ උපදී ද දන්නෙ නැහැ. එහෙම වෙනව නම් මං කරුණාවන්ත වෙන්න කැමති නැහැ. මාත් නිතර පන්සල් යන්නෙ නැහැ නමුත් බෞද්ධ දර්ශනය කෙරෙහි මගෙ පැහැදීමක් තිබෙනව. බෞද්ධ වතාවත් හැකි තරමට කරනව. ඒ නිසා මං හිතනව මාත් නිලමෙ වගේමයි.

ඊයෙ පෙරේදා වගෙ නොවෙයි නිලමේ දැන් හොඳට කතා කරනව. පිරිතෙන් නිලමෙට ගුණ ලැබුණා වගෙයි.

'ඇත්ත තමා මහත්තය, පිරිතෙන් මට අමුතු පණක් ලැබුණ. මෙතෙක් මං පසුවුණේ සැහෙන බියකින් ඒ බිය මොකක්ද කියා මම ම දන්නෙ නැහැ මේ ආත්මයට ආ දවසෙ ඉඳලම ඒ බිය තිබුණ තාමත් බිය නම් තිබෙනව ඒත් පෙර තරම් නැහැ.''

'නිලමේට දැන් ආත්ම දෙකක අත්දැකීම තියෙනවනෙ ඒ වගේම ආගම ගැනත් හොඳ දැනුමක් තියෙනව කිවනෙ නිලමේ දන්නව ඇති කෙනෙක් මැරුණොම දින හතකින් මාස තුනකින් අවුරුද්දකින් ආදී වශයෙන් පිරිතක් නැතිනම් බණක් කියවල දානයක් දෙනව. සමහර අය පිරිත් කියවන්නත් තවත් අය බණ කියවන්නත් ඇති හේතුව කුමක්ද? නිලමේට බැරිද එය තේරුම් කර දෙන්න? ඔය දෙකෙන් වඩා හොඳ කොයිකද?''

''ඔය දෙකෙන් එකකට වඩා අනෙක හොඳයි කිමට බැහැ දෙකම එක වගේම හොඳ යි නමුත් ඒ කරවන අයගෙ අදහස් අනුව නම් වෙනසක් තිබෙනව. පිරිත්වල බණවල වගේ අසා තේරුම්ගෙන ජීවිතය හැඩ ගස්වා ගන්න කරුණු ලබන අය විරලයි. පිරිතේ බල කිහිපයක් තිබෙනව මං ඉගෙනගෙන ඇති හැටියට මෙ ශබ්ද ශාස්ත්‍රය අනුව ඒ ශබ්ද ගොණු කරල තියෙන හැටියෙන් බලවේගයක් උපදිනව. ඒ බලවේගයෙන් මනුෂ්‍ය ශරීරයටත් පරිසරයටත් යම්කිසි බලපෑමක් ඇතිවෙනව. ශබ්දය මහ බලවත් දෙයක්. ගස් ගල් සුනු විසුනු කිරිමට වූවත් පුළුවන්. මහත්තය, කල්පනා කර බලන්න, හුණු කැබැල්ලකින් කළු ලෑල්ලෙ ලියනකොට ගල්කූරකින් ගල් ලෑල්ලෙ ලියන කොට වියළුන බට ලියක් තවත් බට ලියකින් පිරිමදිනකොට ඇතිවෙන ශබ්දය ඇහෙන කොට ඇතැම් අයගෙ ඇඟ හිරි වැටෙනව, දත් හිරිවැටෙනව සමහර වෙලාවට ගොරවනකොට අකුණු ගහනකොට ඒ ශබ්දයෙන් වීදුරු ජනෙල් දෙදරණ හැටි මහත්තය අහල ඇති. වීනා දෙකක තත් එක ගාණකට තද කරල යැහෙන දුරකින් දෙක ඇත් කරල තියල එකක තත දෙදරවනකොට ඒ එක්කම අනිත් තතත් දෙදරනව. ශබ්දයෙ ඒ තරම් බලයක් තියෙනව.

පිරිත කියන තැනැත්තගෙ සිත එක්තැන් කිරීම බලවත් නම්, කරුණාවන්තයෙක් නම් කුමක් හෝ ප්‍රාර්ථනයක් ඇති නම් ඒ චිත්ත තරංගවල බලවේගයකුත් ඇතිවෙනව. පිරිත

අසා සිටින තැනැත්තගේ කිසියම් විශ්වාසයක් ඇතිනම් ඒ පිරිතෙන් තමාගේ පැතුම ඉටුවේය කියා එම සිතිමත් බලපානව ඒ අනුව මියගියකෙනෙකු වෙනුවෙන් පිරිත් කියන්නෙ, ඒ මියගිය ඇත්ත භූත ආත්මයක ඉපිද තමන්ට හිරිහැර අතවර කිරීම වැලැක් වීමට, මියගිය තැනැත්තගෙ නෑ දැයො පිරිතෙ බලයෙන්ම තම තමාගේ ආරක්ෂාව ලබාගත්තනව. ඒ අනුව තමා පිරිත් කියල මාවත් එලවගන්න අදහස් කළේ. ඒ ටික හරි යන්නෙ නෑ ඒ පිරිතෙන් මගේ ශක්තිය වැඩිවුනා.

අනිත් අතට කෙනෙක් මිය ගියාම දින හතකින් හෝ මාස තුනකින් හෝ අවුරුද්දකින් හෝ ඒ තැනැත්ත සිහිකරල ඒ තැනැත්ත තමන්ගෙන් වෙන් වීමේ දුක නැති කර ගැනීමට, සිත සනසා ගැනීමට බණ අහනව. සමහර විට බණ කියවීම ඒ මිය ගිය තැනැත්තා කෙරෙහි බියක් සැකක් නැති නැදැයින් කරන දෙයක් විය හැකියි.''

''එතකොට කියන්නෙ මිය ගිය අය වෙනුවෙන් පිරිත් කියවන්නෙ මියගිය නෑයගෙ භූත ආත්මයක් කළහැකි අරවරයන්ගෙන් බේරීමටත්, බණ කියවන්නෙ තමාගෙ දුක තුනී කරගැණීමටත්ය කියා.''

''ඔව් මහත්තය, මට නම් හිතෙන්නෙ එහෙමයි. ඊට හේතුව සාමාන්‍ය විශ්වාසයක් තියෙනව පිරිත් වලින් භූතයින් එලවන්න හැකිය කියා. නමුත් ඒ අය දන්නෙ නැහැ පිරිතෙන් හැම භූතයෙක්ම එලවන්න බැරි බව ජීවත්ව සිටියදී මිථ්‍යාදෘෂ්ඨික නොහොත් අබෞද්ධව සිටි අයෙකු භූතාත්මයකට පැමිණි විට කියන පිරිතෙන් ජීවත්ව සිටියදී බෞද්ධව සිටි අයෙකුට තරම් බලපාන්නෙ නැහැ. ඇදහීම නැහැ. ඊට හේතුව ඒ අයට බලපාන්නෙ ශබ්ද බලයත් පිරිත කියන තැනැත්ගෙ අධිෂ්ඨාන බලයත් කියන තැනැත්තා සිල්වතෙකු වීමත් පමණක් බැවිනුයි. අබෞද්ධයෙකු ඒ පිරිත අහනකොට එතන විශ්වාසය නැහැ. ඇදහීම නැහැ. එනිසාම ප්‍රතිඵල අඩුයි.

පිරිත ගායනා කරන, තැනැත්තගෙ සිල්බලය, ගායකයගෙ හිතේ බලය, නොහොත් අධිෂ්ඨානය, ශබ්ද තරංග වල බලය සහ අහන තැනැත්තගෙ පැහැදීම යන කරුණු පහක් සම්පූර්ණ වුනාමයි පිරිතක නියම ගුණය ලැබෙන්නෙ පිරිතක් නිකම ම කියාගෙන ගිහින් වැඩක් නැහැ. එහි ශබ්ද තරංග වල ශක්තිය උපදින්න ගායනා කරන්න ඕනැ එතකොටයි නියම ගුණ ලැබෙන්නෙ.

මං දන්න එක හිමි නමක් ඉන්නව. ඒ උත්තමය කලක් ඉගැන්නුව. ඒ හිමියො පණ්ඩිත හිමිනමක් නියම පණ්ඩිතයෙක් උගන්නල ලබපු පඩියෙන් තමුන්ට විතරක් නොවෙයි රටටත් වැඩකළා. හරිම සිලවන්තයි. අන්න ඒ වගෙ කෙනෙකු ගායනා කරන පිරිත බලවත්.

බණ කීමෙන් කෙරෙන්නෙ මියගිය තැනැත්තා ගැන හිත හිතා දුක්වන අයට මරණය ගැන කරුණු කියාදීල දුක තුනී කිරීමයි. එතැන තියෙන්නෙ මිය ගිය තැනැත්ත කෙරෙහි ඇති බියත් පහකිරීම නොවෙයි දුකතුනී කිරීමයි.'' නිලමේ නිහඩ වුනා.

'නිලමෙ කියන්නකො පිරිත නිලමෙට බලපෑවේ කොහොමද කියල.' මං කීවෙ පිරිත් බූතයින් වෙත බලපාන සැටි දැනගැනීමටයි.

''මහත්තය ඇයි ඔය තරම මං ගැනම අහන්නෙ?''

''මට නිලමෙ ගැන පමණක් නොවෙයි ඇත්ත වශයෙන් බූත ආත්ම කියල දෙයක් ඇති නම් ඒවායෙ විස්තර දැන ගන්න ඕනැ. නිලමෙ ඉන්නෙ බූතාත්මයක නිසා නිලමෙට හමුවෙලා ඇතිනෙ අපිට හමුවෙන්න නැති, අපි දකින්නෙ නැති, අපට කතා කරන්න බැරි අපිට නොපෙනෙණ නොයෙක් තරාතිරමෙ බූතාත්ම මා හිතන හැටියට අපිට නොපෙනෙණ කිසියම් ආත්ම විශේෂයක් අපි දැන් කතා-කරන දේත් අසාගෙන ඇති. අප අවටත් හැසිරෙනවා

ඇති. ඒ අය යම අවස්ථා වල යම අයට පෙනෙණවත් ඇති සමහරෙකුට පෙනෙන්නෙම නැතිව ඇති. මා හිතන-වා නිලමෙ ඒ අය ගැන හොඳට දන්නව ඇතිනෙ. ඒ අය ගැන නිලමෙදන්න හැම දෙයක්ම මා දැනගන්න සතුටුයි. මා බොහොම සතුටුවුනා නිලමෙ ජිවත් ව ඉන්-දදි උගතෙකුව සිටි නිසා. මරණින් පසු භූතාත්මයක උපන්නත් මිනිස් ජීවිතයෙ උගත් ඥ නැති වන්නෙ නැහැ. ඒ නිසා නිලමෙට හැකියාවක් තිබෙන්න ඕනැ සාමාන්‍ය කෙනෙකුට වඩා හොඳට නියම තතු විස්තර කර දෙන්න. නිලමෙගෙ අත් දැකිම් වලින්ම ගැටළු සහිත තැන් තෝරා බේරා දෙන්න හැකිනෙ.''

'මහත්තයාගෙ කල්පනාව බොහොම හරි. භූතයො කියල කොටසක් ඉන්නව. හැම භූතයෙකුම එක හා සමාන නැහැ. බොහොම භූතයින් මිනිසුන් සමඟ හොඳ හිතින් නොවෙයි ඉන්නෙ. බොහොම දෙනෙකු කල් ගෙවන්නෙ ක්‍රෝධයකින්, වෛරයකින්, අසහනයෙන්. කාගෙන් හෝ පලිගැනිමට සමහරෙක් බලා ඉන්නව. සමහරෙක් මනුෂ්‍ය සංහතියම එක්ක තරහයි. සමහරෙක් ඉන්නව ඇතැම් මනුෂ්‍යයින්ට උපකාර කිරීමට බලාගෙන. ඇතැම් අය ආලය, ආශාව, තන්හාව, ක්‍රෝධය. වෛරය ආදී නොයෙක් හේතුන් නිසා භූතයින් වෙලා ඉන්නව. මනුස්සයෙකුට කොතරම් ආදරෙන් භූතයෙක් ආවත් භූතයෙක් ඉන්න බව දැනගත් හැටියෙම මනුෂ්‍යය භූතය එලවන්න හදනව. අරියාදු කිරීමට පටන් ගන්නව. එතකොට භූතයත් ඒ මිනිහ කෙරෙහි වෛර බඳිනව. භූතයත් මිනිහට හිරිහැර කරන්න පටන්ගන්නව. පලිගන්න හදනව.'

''හරියට හරි මහත්තය. ජිවත්වන මිනිස්සු ඔයටික තේරුම ගත්තොත් භූත කරදර බොහොම අඩුකරගන්න හැකියි. හැම භූතයෙක් වගේම භූතයින්වෙලා උපදින්නෙ මරණ මොහොතෙ ඇතිවන හිත අනුවයි. මා දන්න බොහොම

බූතයො ඉන්නව බූත ආත්මෙන් අත්මිදීමට ආසාවෙන්. නමුත් ඒ අයට තව කෙනෙකුගෙ උපකාරය නැතිව ඒ ටික කරගන්න බැහැ. මහත්තයට මං හොඳ යෝජනාවක් කරන්-නම්. මගෙන් ලබාගන්න විස්තර අනිත් අයටත් කියන්න, පොතක් ලියන්න.'' මහා ලොකු යෝජනාවක් කළා වගේ නිලමේ දැස් මහත් ලෙස විවර කර මං දෙස බැළුවා.

'පිස්සු කතා කරනවද නිලමේ? මං පොතක් ලිව්වොත් ඒකෙන් මුදල් උපයන්නෙ වෙන කවුරුවත්. දැනුම ඇති තැනැත්තට, ලියන තැනැත්තට ඉතිරිවන්නෙ ලිවීමෙන් ලැබෙන සැනසීම පමණයි. හොඳ දැනුමක් තිබුණත් ලියපු පොත් පල කරගන්න බැරිව කී දෙනෙක් ඉන්නවද?' මං නිලමෙට කීවෙ ඒ බව මළ පෙරේතයෙකුටවත් කියං සැනසීමක් ලබා ගන්න.

'ඉතින් ඕක සුළු දෙයක්නෙ මහත්තය. භාරදෙන්න ඒ ඇත්තො මේ අපට. අපි වැඩ දෙන්නම්. මට මතකයි මං කොග්ගල හොයන කාලෙ මට හමුවුනා ඔයවගෙ කෙනෙක්. අනුන්ගෙ දැණුම කුට්ටු දෙකට අරගෙන පවුම් ගණන් හම්බ කරපු කෙනෙක්, ප්‍රේත ලෝකෙ ඉපදිල දුක් විදිනව. මං ඒ ගැන එතරම් උනන්දුවුනේ නැහැ විස්තර හොයන්න.'

'කමක් නැහැ මහත්සි වෙන්න එපා. එයා මේ රටේ කෙනෙකු වෙන්න බැහැ.'

''මහත්තය අද රෑට නීදිමරන්න සූදනම්වෙල ඉන්න. මහත්තයගෙ පරණ යාළුවො කීප දෙනෙක්ම එනවළු මහත්තය හමුවන්න. මාත් කැමැතියි ඒ අය එනවට මහත්තය නිසා මටත් හැකි වෙනව මහ බලවත්තු ඇසුරු කරන්න. එතකොට මගෙත් බල පුළුවන්කාරකම් වැඩිවෙනව.'' නිලමෙ කීවෙ මහත් සන්තෝෂයකින්.

'නිලමෙ, ලොකු අය ඇසුරු කළ පමණින්ම හිස් උඩුමවා ගන්න එපා. ලොකු අයගෙ බල පුළුවන්කාරකම් අරගෙන ඒවා පෙන්වන්න ගියාම අමාරුවෙ වැටෙනව.' මං කීවෙ බලවත් භූතයින්ගෙ ඇසුර නිසා නිලමෙ මටත් පාලනය කරගත හැකි නොවේයැයි සිතමිනි.

'විකාර කතා කරනවද මහත්තය, දන් බලන්නකො ඔය සාත්තර කියන බූතයො ගැන. කොහේ හරි ඉන්න මල පෙරේතයෙකු ආවේශ වුන මිනිහෙක් හරි ගෑණියෙක් හරි කියන්නෙ කතරගම දෙවියන් නැති නම් විෂ්ණු දෙවියන් ආරූඪෙන් සාත්තර කියනව කියල. මෝඩ මිනිස්සුත් එහෙමයි දෙවියනි, එහෙයි දෙවියනි කියා වැඳ වැටෙනව. ඉතින් බලන්නකො ඒ කැපයන්ට මොන හෙණයක්වත් නැහැ.

කොග්ගල මහත්මිය තේ බීම සඳහා මට කතාකළ හෙයින් මම කාමරයෙන් පිටවීමි. වේලාව පස්වරු හයට පමණ විය.

(5) ඔ

රාවන යුගයෙ අබූතයො

සවස හයට පමණ මාත් නිලමේත් කතාවේ යෙදී සිටි තැනට ජන්තුගේ කැපයා වූ බණ්ඩා ද පැමිණියේය.

'මහත්තය මට හිතෙනව අදත් මට ආවේශයක් එයි කියල.' කියමින්ය ඔහු කාමරයට ඇතුළුවූයේ. කාමරයට ඇතුළුවූ ඔහු මං අසලින් ම බිම ඇනතියා හිඳගත්තේ නළල දොහොත් මත තබාගෙය.

'මං හැන්දෑවෙ ඇඟපත සෝදන්න යනකොට කවුදෝ මගෙ කණට කොඳුරල ඇහුව නිලමෙ බලන්න යන්නෙ නැතිද දන්ම පලයන් කියා. මං ඉතින් ඇඟපත සෝදගෙන ආව.' බණ්ඩා කියේ ඇඟ මැලි කඩමින්ය.

'ගෙය අවට මහා කුණාටුවක් හමා යන බව ඇසුණි. වත්තේ ගස්කොළන් කැඩියාමට මෙන් ඇඹරෙන හඬ ඇසුණි. බණ්ඩා කීවා සේ ම අමුත්තෙක් ලඟ ලඟ ම එන බවට සැකයක් මටද ඇතිවුණි.

මොහොතක් ගතවිය. කතාබහක් නැතිවම බණ්ඩා බිම දිගාවිය. 'හහ්, හහ්,.. හා,... හා.. ආ... හමුවුණා, මට හමුවුණා. මහා බදුරුත් හමුවුණා. ඉතින් බදුරූ, අවුරුදු දහස් ගණනකට පසු හමුවුණා. කොහොමද තතු?. කොහොම ද චිත්‍රා? හහ්, හහ්, චිත්‍රා වුන සිත්තම්. සිත්තම් ගීය නිසා තාමත් තපස් රකිණවද?' බණ්ඩා කියාගෙන ගියේ මහා හොරහැඩි හඬකිනි.

මං අන්දුන් කුන්දුන් විය, එහි තේරුම කුමක්ද? මහා බදුරූ කවුද? කවුද ඒ කතාකළේ? කාටද කතා කළේ? මහා බදුර නම් වූ තවත් භූතයෙක් මෙහි පැමිණ ඇතිද? ටික වේලාවක් මම නිහඬවීමි.

'මහත්තය, ඇයි මේ බිතවෙල? කවුද දන්නවද ඔයා? ඔයත් ඒ කාලෙ හරි කෙරුම් කාරයෙක්. රාවනා රජතුමා බාරතයට සේනාව ගෙනයන්න ලංකාවත් බාරතයත් යා කරල පාලැම (පාලම) බඳින කාලෙ ජන්තුට බොහොම උපකාර කළෙත් මකර තමා.

'ඔය කියන්නෙ හනුමාගෙ පාලමද?' මං ඇසුවා හනුමගෙ පාලැම? හනුම නොවෙයි ඔය පාලැම හැදුවෙ අපි. ඒ හොකැබක්කට ඒතරම් දෙයක් කළ හැකිද? එසේ කීවෙ අමුත්තා. ඔය ඇත්තො තමා මකර. මහත්තයගෙ පරණ යාළුවෙක්ලු. මං අද උදේ කීවෙ ඔයා ගැන තමා.' එසේ කිවේ නිළමෙය.

'හා, හා මට එක පාරටම අඳුනගන්න බැරිවුණා. මකර ඒ ගැන අමනාපයක් නැහැනෙ?'

'අපි මේ අබූතයන් ඔය සුළුදේ ගැන එතරම් අමනාප වන්නෙ නැහැ. අවුරුදු දහස් ගණනකට පස්සෙ උඹ හමුවුන එක මට ඇති. උඹට මතකනෙ අපි ඉස්සර කරපු සෙල්ලම්. මං අද උදේ උඹ ගැන කීවම උඹේපරණ යාළුවො දෙන්නෙක් කිව උඹව බලන්න ඕනැ ය කියා. ඒ දෙන්නත් දැන් ඇවිත් ඉන්නව. මට දැන් වැඩි වෙලාවක් ඉන්න බැහැ. මං යන්න ඕනැ. මේ වෙලාවෙ මෙහි වෙන කවුරුවත් නැති නිසා

මගේ කැපයත් එවලයි මං ආවෙ. ඊයෙ මං උඹ දැකපු වෙලේ සිටම උඹට කතා කරනතුරු මට ඉවසිල්ලක් නැහැ. ඒ නිසා තමා මං මේ දූන් ආවෙ. අපි කීප දෙනෙක් ම අද රෑ පහළොස් පැයට එනවා. නිලමෙගෙ කැපයත්, මගෙ කැපයත් හැර වෙන කිසි කෙනෙකුට මෙහි ඉන්න බැහැ. වෙනත් ඇත්තො හිටියොත් උන්දෑලට වැඩ වරදියි. හොඳද?' මකර කියාගෙන ගියේ ය.

'පොඩ්ඩක් ඉන්න මකර, මකර කීව නොවෙද අබුතයින් ගැන? කවුද ඔය අබුතයින්? අපි අබුතයින් යැයි කියන්නෙ බදුරුල බුතයින් යැයි කියන අයට. බුත කියන්නෙ පස් මහා බුතයින්. ඒ කිවෙ වතුර, ගිනි, හුලඟ, අනු, හිස්ගනි, නොහොත් හිස්බව, නමවූ පහ එක්වී හැදුන දේ තමා බුත කියන්නෙ. මිනිස් සතුන් ආදි පණ ඈති දේට ඊට අමතර තව දෙකක් තිබෙනව. ඒ තමා හිතත්, පණත්, ඒ දෙක ඔය පහට අයිති නැහැ. වතුර, ගිනි, වායු, අනු, හිස්ගති යන පහට අමතර තව හිතත් පණත් එකතු වුනාම හතක් වෙනව ඊට කියනව හතා නොහොත් සතා කියල. අපිට සිරුරු නැහැ. අපට තියෙන්නෙ හිත පමණයි, ඒ නිසා බුතයින්ගෙන් නොසැදුන අපි අබුතයින්. ඒ නිසායි අපි අපට අබුතයින් යැයි කියා ගන්නෙ, ඔය හෙළ වදන් හැදුන හැටි දූනගන්න ඇවැසි නම් මං කැදවන්නම් අපේ බාහුරු. බස හුරු නැනැත්තා බාහුරුයි. මං පමාවුනා වැඩියි. මං යන්නම්.'

'මේ මකර, මකර, තව මොහොතක්'. මං ඉල්ලුවත් බණ්ඩා නිහඬවිය. මකර ඒ වනවිටත් සීගිරියෙහි විය හැක.

'මං කුමක් කළ යුතුදැයි සිතීමට පවා මට ඉඩක් නොලැබිණ. ආව, කීව, දීව, (ගියා) මම කල්පනා සයුරේ ගිලුනෙමි. මහා බදුරු කවුද? මකර කතාකළ හැටියට මගෙ නම බදුරුය. ඒ කෙසේද? වැරදීමක් වීත්ද? බුතයින් සමඟ වැරදි හැඳින්වීමකින් ඔවුන් නොමඟ යවා කටයුතු කිරීම මහා අවදානමකි.'

දහසක් සිතුවිලි අතර මම අතරමං වීමි. මං මීට කුමකට මැදහත් වුයෙම්දැයි ලතැවීමි. පොඩ්ඩ වැරදුනොත් මං ඉවරයි. බූතයින්ගෙන් ගැලවීමට, ඔවුන් මෙල්ල කිරීමට මං දන් කෙහෙම්මල් මන්තරයක් වත් නැත. අද රෑ දොලහට එනවලු. මං කුමක් කරන්නද? දූන් ඔවුන් නැවැතිමට හැකියාවක්ද නැත. කමක් නැහැ වෙන දෙයක් උණාවෙ අද රැටත් මෙහිම ඉන්නව. මෙ ගැන අන් කිසිවෙකු නොදනී. මකර කිවෙ ඔහු අබූතයෙක්ය කියා ඔව් ඒකත් ඇත්ත. පංච මහා බූතයින් නැතිව සිත පමණක් ඇති ඇත්තො අබූතයො.

සිතුවිලි ලොවෙහි අතරමංව සිටි මට නිලමෙ මං අමතනු පවා නොඇසිණ. කිහිප වරක් මං අමතා මගෙන් පිලිතුරක් නැති බැවින් ඔහු 'මහත්තයෝ' කියා වැරෙන් කෑගසා ඇත. කාමරයෙන් පිටත සිටි කිහිප දෙනෙක් ම කාමරය තුලට ආවෝය.

'මහත්තයා, ඇයි බර කල්පනාවක වැටිලා හිටියෙ? මං දන්නවා මහත්තයා බය වුනෝ නම නැති බව. ඒත් ඇයි මං කීප වරක්ම කතා කලා මහත්තයාට ඇහුණෙ නැත්තේ ඇයි?'

'නිලමෙ මං ලොකු ප්‍රශ්නෙකට මූණ පාලයි ඉන්නෙ නිලමෙට බැරිද? ගිහින් මකරට එන්න එපා කියන්න, එයාට ලොකු වැරදිමක් වෙලා තියෙනව. එයා මට කතා කලේ මහාබදුරු කියලයි මගෙ නම බදුරු නෙමෙයිනෙ මං වෙන කෙනෙකු කියා මං අඳුරන්නෙ නැතිව එහෙම කීවද දන්නෙ නැහැ එහෙම නම් නොකියා එයා රවටන එක හොඳ නැහැනෙ'

''ඔන්න, ඔන්න මහත්තයාත් තොත්ත බබා වෙන්න හදනවා බදුරු කියන්නෙ මහත්තයාගෙ දූන් නම නෙවෙයි මහත්නයා රාවනා යුගයෙ ජීවත්ව ඉන්දදී නම තමා බදුරු කියන්නෙ මහත්තයාගෙ දූන් නම නොවෙයි, ඊයෙ රෑ මකර මට ඒ කතාව කීව ඒ කාලයේ මහත්තයා බාරතය යටත්

කරන්න රාවන සේනාවත් එක්ක බාරතයට ගියාලු. යුද්ද කරන්න. සින්තම් කියන්නෙ මහත්තයාගෙ ඒ කාලෙ හයඞ්කාර මහත්තයා යුද්ද කරන්න පිටරට ගියාට පසුව සින්තම් චිත්‍රා කියන නම අරගෙන නව කෙනෙකු එක්ක විවාහ වුනාලු රටවල් යටත් කරගෙන බදූරු ආපසු ආවම ඒ ගැන හිත කලකිරිල බදූරු ගියාලු තපස් රකින්න ගැහැනියක් නිසා හිත කලකිරුනය කියා අනිත් අය මහත්තයාට ගිනහුනාලු ඒකයි එදිලෙ චිත්‍රා ගැන ඇහුවෙ දූන් තේරුණාද? ඒ ඇත්තො මහත්තයාට හරි ආදරෙයි ඒ බව මට කිව.''

''මගෙ ඇහට ලේ ඉනුවෙ දූනුයි නිමමෙට නිවන් සැපම ලැබේවා යි'' මට සිතුණි

''නිලමෙ, දූන් අපි අපේ සාකච්ඡාව පටන් ගනිමුද? මකර ආවයින් ඒකටත් බාධාවක් වුනාෆන ඔය බූතයො යි කියන ජාතිය කරන අවතාර හොල්මන් ඇයි සමහර අයට පෙනෙන්නෙත්. සමහර අයට නොපෙන්නෙත්? ඊට හේතු පහදා දෙන්න හැකිද?''

'බූතයින්ට සෑම මිනිසෙකුටම බූත බලය පෑමට හෝ පෙණී සිටිමටහෝ බැහැ තද ආත්ම ශක්තියත් කරුණාවත් ඇති අයට බූතයින් ගරු බුහුමන් දක්වනවා ඒ අයගෙ අණට කීකරු වෙනවා යම්කිසි විදියකින් එබඳු අයෙක් බූතයෙක් දූක්කත් බය වෙන්නෙ නැහැ ඒ නිසාම බූතයෙකුගෙන් එබන්දෙකුට අතවරයක් වෙන්නෙත් නැහැ කරන්නත් බැහැ බූතයින්ගෙන් මිනිසාට වන අතවර වලින් සියයට අනුවක්ම වන්නෙ මිනිසා බූතයාට ඇති බිය නිසයි. නිදසුනක් ලෙස අපි කොග්ගල ගනිමු පළමුවෙන්ම එයාට මං ආවේශ වෙන්න කලින් යන්තම් මිනිහ අඳුනන්න බැරි පුළුවන් ගොම්ම න්වෙලාවේ මාව එයාට පෙනෙන්න සැලැස්සුවා මහත්තයා අපිට ශරීර නැහැ ශරීරයක් මවාගන්න පුළුවන් තරම් බලතල ඇති බූතයො හිටියත් මට ඒ බලය නැහැ එබඳු බලයක් නැති බූතයෙකුට අවතාරයක් වශයෙන් හෝ තමාගෙ නියම රූපයම හෝ පෙන්වන්න ඕනැ වුනාම ඒ බූතයා මවනවා මිනිහාගෙ

හිතේ එබඳු රූපයක් ඒ මනසෙ මැවුන රූපය මසැසින් දුටු රූපයක් හැටියට ඒ මිනිහ හිතනවා ඒ දැක්ක රූපය තමාගේ සතුරෙක් නම්, ඒ රූපය මැවී පේනෙන තැනැත්තා තමාට පහර දුනහොත් හෝ අනවරයක් කළහොත් හෝ තමාට එම බුතයාගෙන් ගැලවීමට හැකියාවක් නැත යන ආත්ම පරාජිත හැඟීමක් ඔහුට ඇති වුවහොත්. ඔහුට බියක් ඇති වෙනවා සමහර විට මර බියෙන් පෙලෙනව තමාගේ හිත හිණ වූ තරමට බියත් වැඩි වෙනවා බියවීමෙන් ඇතිවෙන කම්පන-යෙන්ම සමහරෙකු මැරිලා වැටෙනවා එතකොට කියනවා යකා ගහලා මැරුණා කියල නමුත් ඇත්ත වශයෙන්ම මිනිහා මැරෙන්නෙ බිය නිසා ඊට පස්සෙ මරණය ගැන විභාගයක් පවත්වල දොස්තර මහත්තයෙක් මිනිය කපලා කොටලා තීර්නය කරනවා හෘදයාබාධයකින් නැති නම් මොළේ නහරයක් පුපුරලා මරණය සිදුවුණා කියලා එහෙමත් නැතිනම් ස්වභාවික හේතූන් නිසා මරණය සිදුවී ඇති බව තීර්ණය කරනවා බුතයෙකුට බියවෙල හුස්ම ගන්න අමතක වෙල මරණය සිදුවුණය කියල කවුරුවත් කියන්නෙ නැහැ ඇත්තම කියනව නම් මිනිහ මරලා තියෙන්නෙ මිනිහමයි එයාගෙ අස්ථාන බියෙන් ''

'එතකෙට නිලමෙ ඇයි කොග්ගල මහත්තයාට ආවේග වෙන්න වරම ගත්තෙ? වරම ඕන නැහැනෙ මිනිහව නිකම්ම බය ගන්වල මරන්න තිබුණනෙ.',

'මං එහෙමත් කරන්න හැදුවා නමුත් බැරිවුණා කොග්ගල අලි අමාරු කරයා මිනිහත් දක්ෂ කට්ටන්ඩියෙකනෙ ඒ නිසා එයාට කිට්ටු වීම ලේසි නැහැ කට්ටඩියෙක් නොවූනත් අර මං ඉස්සර කීව වගෙ බලවත් කෙනෙක් නම් ආවේශ වෙන්න වරම් ඉල්ලුවත් වරම් ලැබෙන්නෙ නැහැ වරම් අරගෙන ආවත් ඊට සුදුසු වේලාවක් වෙන්නත් ඕනැ.

''කොග්ගලට ආවේශ වෙන්න හොඳ අවස්ථාවක් මං බල බලා ඉන්න කොට මං දැක්කා කළුවර වැටිගෙන එන වෙලාවෙ කොග්ගල තනියම පිලිකන්නට යනවා කවුරුවත් පේන තෙක් මානයේ හිටියෙ නැහැ මං හිතුවා මං දැක්ක හැටියෙම කොග්ගල බයේම මැරෙයි කියල. ඇයි මහත්තය

එයා මං දැක්ක හැටියෙම මං මැරෙණ මොහොතෙ එයා මට දීපු පොරොන්දුව මතක් වෙනවනෙ. ඒ එක්ක ම එයාට සිහි වෙනවා මං මැරිල බොහොම කලක් ගත වෙලා බව. ඔහු ඉදිරියේ ඉන්නෙ මගෙ අවතාරය බවත් ඇවිත් ඉන්නෙ පලිගැනීමට බවත් එයාට වැටහෙනවා ඒ අනුව තද මානසික අසහනයකුත් ඇතිවෙල තමා වැරදි කාරයා ය යන තීන්දුව තමා කෙරෙහි ම ඔහුගේ යටිහිත නිකුත් කරනව. ගැලවීමට මඟක් නැති බව පෙනුණාම බයේම මැරෙයි කියල මං හිතුව. නමුත් එහෙම උනේ නැහැ. එයාට සිහි නැතිවීමට තරමට බියවුනාට මාරක කම්පනයක් ඇති වීමට තරම් ඒ බිය සැහුනේ නැහැ. කොග්ගල කෑගැසූ ශබ්දය ඇසී ගෙදර අය ඇවිත් කොග්ගල උස්සගෙන ගියා. ඒ වෙලාවෙ බියෙන් විකෘත වූ කොග්ගලගේ මනසට මං රිංග ගත්ත. කොග්ගලගේ මනස බියෙන් විකෘත වුනේ නැතිනම් මට එයාගෙ මනසට ඇතුල් වෙන්න බැහැ. එවේලේ පටන් කොග්ගලගෙ මනස නොවෙයි ඔහුව හසුරුවන්නෙ, මගේ මනසයි.

''කොග්ගලට නිලමෙ ආවේශ වෙලා නොවෙයි අසනීප උනේ. හීන්බණ්ඩගෙ දුව කසාද බඳින්න පොරොන්දු වෙල ඒ පොරොන්දුව කඩ කළ නිසා තමාගේම යටි හිතේ තීන්දුවක් අනුව තමා වැරදි කාරයෙක්ය. ඒ නිසා හීන්බණ්ඩා මළයකෙකු වී තමා මරන්න එනවාය යන හැඟීම කොග්ගලගෙ හිතේ වද දීමෙන් වූ මානසික විකෘති යක් හැටියට කෙනෙක් හැඳින් වුවහොත් නිලමෙ ඒ ගැන මොකද කියන්නෙ?''

''සමහර විට එහෙම වෙන අවස්ථාවලුත් තිබෙන්න පුළුවන්. එහෙම අවස්ථාවක නම් මේ වාගේ තත්වයක් ඇති වෙන්නේ නැහැ. එහෙම අසනීප උන තැනැත්තා මානසික විකෘතියකින් හැසිරෙනවා විනා මේ වගේ පුද්ගලයකු වශයෙන් කතා කරන්න හෝ තේරුම් බේරුම් සහිතව පිළිතුරු දෙන්න හෝ හැකියාවක් ඇතිවන්නෙ නැහැ

එහෙම නැතිනම් සමහර විට තමා කළ වරදකට යමෙක් තමාට කොඩිවිණ, හූනියම්, ආදිය කළායැ යි අදහසක් ඇති වුවොත් තමාගෙ සත්‍යවාදි යටිහිත තමාගේ වරද පිළිගැනීමෙන් කොඩිවින ආදියෙන් හෝ හූණියම් ආදියෙන් හෝ සිදුවන්නේ යැයි කියන දුක හෝ අතවරය හෝ විඳිනව, යම් කෙනෙකුගේ උඩු හිත තමා කළ වරදක් වසා ලීමට තමා නිවරද ඝරුවෙකු ලෙය හැසිරීමට තැත්කළත් තමා සුදනෙකු හැටියට ලෝකයාට පෙන්වීමට තැත්කළත් සත්‍ය තත්ත්වය යටිහිතේ බලපානව. එබඳු අවස්ථාවල දඬුවම් දීමට කෙනෙකු නැතත් යටි හිතේ බල පෑමෙන් තමන් විසින් ම තමාට නොදැනුවත්ව ම දඬුවම් කර ගන්නව. බොහෝ දුරට කරුමෙ පල දෙනවයි කියන්නෙ එබඳු අවස්ථා වලටයි.

'හොඳයි නිලමෙ, එතකොට අපිට කියන්න බැරිද කොග්ගලත් ඒ විදියට තමා කළ වරදට දඬුවම් විඳිනව කියල.?'

'කොග්ගල ඒ ගණයට අයත් වෙන්නෙ නැහැ. එක අතකින් කොග්ගල අලි අමාරුකාරය. හරි ගල් හිතක් තියෙනව. මන්තර කාරය, ගුරුකම්කාරය. කට්ටඩිය, තාක්කඩිය මඟෝඩිය. ඒ මිනිහගෙ හිත කොයිතරම් මැරවරද කියනවනම් ඕවගේ දේවලින් කම්පා වෙන්නෙ නැහැ. මං හිතනව මහත්තයට දූන් නියම තත්ත්වය වැටහිලා ඇති කියා.

කොග්ගලගෙ බිය, මරණය ඇති කිරීමට තරම් නොවීමට හේතු උවමනා නම් මං කියාදෙන්නම්. එක් වතාවක් මං කොග්ගලට ආවේශ වුනාට මරන්න බැරිවුණා. මරන්න බැරි වුනත් මං ආවේශ වුනාට පසු විඳින්න සිදුවුණ වද හිංසා ගැන ඔහු දන්නව. ඒ නිසා බියවීම ඒ ප්‍රමාණයට සීමා වුණා. යම් විදියකින් මං දුටු හැටිය කොග්ගලගෙ හිත තිගැස්සුණේ නැතිනම්, බිය වුණේ නැති නම් එදා මට කොග්ගලට ආවේශ වීමට බැරිවෙනව. කොග්ගල මහත්තයගෙන් ඇත් වුනාම තම ආරක්සාව නැතිවුණා කියා කොග්ගල බියෙන් පසුවුණේ. එදා මට කොග්ගලට ආවේශ වීමට බැරිවුණා නම් ඊලඟ වතාවෙ ඊටත් වඩා අමාරු වෙනව.'

'නිලමෙත් හරි අමාරුකාරයෙකු වගේ පෙනෙණව. නිලමෙ මනෝ විද්‍යාවත් දන්න වගෙයි.'

'මං දන්න මනෝවිද්‍යාවක් නැහැ මහත්තය. මං ජීවත්ව ඉන්දදි නොයෙකුත් පොත් පත් නම් කියවල තියෙනව. කියෙව්ව විතරක් නොමෙයි, ඒව ගැන නැවත නැවත කල්පනා කළා. විග්‍රහ කරල බැලුව. නොතේරුණ දේ නැවත නැවත කියවල තේරුම් ගත්ත. මං හිතන්නෙ නැහැ අද භූත ලෝකයෙ ඉන්න අයගෙන් බොහොම ටික දෙනෙකුට හැර මේව ගැන තේරුමක් ඇතිය කියාත්, පැහැදිලිව අදහස් ප්‍රකාශ කරන්න හැකිය කියාත්, ඊට හේතුව, අවුරුදු ගණන් තමා සිටින පරිසරයෙන් පිට කිසිවක් ගැන හිතන්න හේතුවක් නැතිව ඔහේ පල් වෙවී ඉන්නව. ඒ අයගෙ සිතීමෙ සහ අදහස් ප්‍රකාශ කිරීමෙ ශක්තිය තව තවත් මොට වෙනව. වතුර ගන්නෙ නැති ළිඳක වතුර පල් වෙනව මහත්තය. වතුර ගන්න ගන්න තව තවත් වතුර උණල වතුර පිරිසිදු වෙනව. මිනිහෙකුගෙ හිතත් ඒ වගෙයි. අපි ජීවත්ව ඉන්දදි අපි අහල තියෙනව අමනුෂ්‍ය ලෝකයක ඉපදීම දුකක්ය කියා. ඉතින් මැරිල මළ පෙරේතයෙක් හරි මළ යකෙකු හරි වෙලා ඉපදුනාම ඒ ගැන කල්පනා කර කර ඉන්නව මිසක් වෙන කරන්න දෙයක් නැහැනෙ.'

'නිලමෙ මහා දාර්ශනිකයෙක් වගෙයි. ඇත්ත වශයෙන් මං හරිම සන්තෝසයි නිලමෙ හමුවීම ගැන. මං හිතන්නෙ මේ හමුවීම මගේ වාසනාව පමණක් නොවෙයි, මේ රටේ මිථ්‍යා මත වලින් මුලාවෙල ඉන්න බොහෝ අයගෙ වාසනාව. නිලමෙ වගේ කෙනෙකු හමුවන්නෙ කලාතුරකින්. මං හිතනව මට ඉන් නියම පල ලබන්න හැකිවේය කියා.'

"ඒ ගැන සැක හිතන්න එපා මහත්තය. මං දන්නෙ නැති දේ මගෙ යාළුවන්ගෙන් හරි අහල මං මහත්තයට කියා දෙන්නම්. මං ජීවත්ව සිටියදී ස්ථිර රැකියාවක් කියල එකක් තිබුණෙ නැහැ, වතුපිටි වලින් ලැබුණ ආදයමින්

වියදම් කරල යමක් ඉතිරි වුණා. මං අනවශ්‍ය වියදම් කළේ නැහැ. මිනිහෙකුට මුදල් හදල්, වස්තුව වැඩිවුණ තරමට තමයි තණ්හාව වැඩිවන්නෙ. දුප්පතෙකුයි පොහොසතෙකුයි අරන් බලන්න. පොහොසතාගෙ තණ්හාව වැඩියි. ඒ නිසාම දුක වැඩියි. නමුත් එයාට තේරෙන්නේ නැහැ එය දුකක් කියල. මංගෙත් තණ්හාව වැඩි නිසා තමා මට මගෙ ගෙදර දොර, වතුපිටි, අඹු දරුවන් දාල යන්න බැරිවුනේ ජීවත්ව සිටි කාලෙ මං සෑහෙන කාලයක් ගතකලා පොත් පත් කියවන්න. මැරුණට පස්සෙ කොග්ගල බලන්න ගිය වෙලාවෙ හැර මං නිතරම හිටියෙ ඒ ගෙදරමයි. මං මැරුණට පස්සෙ මගෙ මැණිකෙත්, මගෙ දුවත් මගෙ කාමරයෙදී දැක්කා. නමුත් ඒ අය බිය වුනේ නැහැ. මං එහි හිටියට ඒ අයගෙ අසතුටක් තිබුනේ නැහැ. ඒ අය ඒ ගැන ගෙදරින් පිට කිසි කෙනෙකුට කීවෙත් නැහැ. මගෙන් ඒ අයට හිරිහැරයක් වුනෙත් නැහැ. ඇතැම් අවස්ථාවලදී ඒ අයට මං උදව් කළා මං ඒ කාමරය මගෙ මරණින් පසු වාසයට තෝරාගත්තෙ ඒ කාමරය තමා ගෙදරින් ම අඳුරු කාමරය. එහෙම තැන්වල ගැවසෙන්න අපේ අය කිසි බියක් නැහැ. කළුවර වැඩිවුන තරමට අපි කැමැතියි ඒ වගේම සමහර මිනිස්සු කළුවරට බියයි. ඒ කළුවරට ඇති බියක් නොවෙයි. අපිට බිය නිසා. ඒ අය දන්නව, කළුවර තැන්වල අපි ඉන්න බව. ඒ අයගෙ හිත පිරිසිදු නම් බිය වීමට කිසිම හේතුවක් නැහැ. ඒ අය බිය වන්නෙ නැති නම් අපටත් සළ හැකි දෙයක් නැහැ.

ඔන්න මහත්තය අපේ සාකච්චාව වැඩි වෙලාවක් කරන්න ලැබෙන එකක් නැහැ. මට නූල් බඳින්න කට්ටඩියෙක් එනව්. ආපුදෙන් ඕනෑ කට්ටඩියෙක් නැති නම් තක්කඩියෙක්. මං උගන්වන්නම් හොඳ පාඩමක්. එයා මීට පස්සෙ ආයි නම් කට්ටඩිකම් කරන්නෙ නෑ. ආන්න කට්ටඩිය ගෙට ගොඩවුණා. ආ ඔන්න එනාව අර මර දූති මහත්තයට පණිවුඩය දෙන්න. යන්න මහත්තය ගිහින් අහගෙන එන්න මොනවද කියන්නෙ කියල. මං ඉන්නම් නොදන්නව වගේ.'

එසේ කියා අවසන් වත්ම කොග්ගල මහත්මිය කාමරයට ආවාය. 'මහත්තය හමුවෙන්න කවුද ඇවිත් ඉන්නව. පොඩ්ඩ-කට එළියට එන්නකො.'

මම ඇය පසුපස ඉස්තෝප්පුවට ගියෙමි. 'මහත්තය, ආතුරයට නූලක් බඳින්න කට්ටඩියෙක් ඇවිත් ඉන්නව. නූල මතුරගෙන ඇවිත් තියෙන්නෙ. අනේ මහත්තය, මහත්තයත් ටිකක් උදවු වෙන්න.' ඈ එසේ කීවේ කොග්ගල මහතාට නෑසෙන්නට වියහැකිය. එහෙත් ඒ සියල්ල නිලමේට නොරගසක් බව මං දැනගෙන සිටියද ඒ බව කොග්ගල මහත්මියට නොකීවෙමි.

'හොඳයි එහෙනම් ලෑස්ති කරන්නකො. මං හිතන්නෙ නැහැ මගෙන් එතරම් උදවුවක් ඇවැසි වෙයිකියා. කට්ටඩින්ට බූතයො බයනෙ. ඒ නිසා මං හිතනව නිලමෙව එයාට මෙල්ල කරගන්න එක ඒ තරම් දෙයක්ය කියා' මගේ අමනාපය වහාල මම ඇයට එසේ කීවෙමි.

'කෙසඟ සිරුරක් ඇති හිස මුදුනින් කොන්ඩය බැඳි උඩුකය නිරුවත් මැදි වියේ පුරුෂයෙකු ඉස්තෝප්පුවේ වාඩිවී සිටියේ අතේ කහ නූලක්ද ඇතිවය. පසෙකින් මල් බුලත් තට්ටුවක් ද විය. මං දුටු ඔහු ඉමහත් ගරුසරු දක්වා ඉතා සුහද සිනාවකින් මට සංග්‍රහ කළේය.

'මහත්තයත් බූතයින් මෙල්ල කරන්න ටිකක් බල තල ඇති කෙනෙකුය කියා ආරංචියි. මාත් හොඳ හොඳ වැඩ කරල තියෙනව. ඇත්තටම මහත්තය ඔය කොග්ගල මහත්තයට වැහිල ඉන්න එකා කොහොම එකෙක් ද? මට ආරංචියි මහත්තයගෙ අණට නම් වලංගු යි කියල. මගෙ හිතේ හැටියට නම් ඔය නූල මතුරල බැන්දම ඕකව තවකා-ලිකව අයින් කරන්න හැකියි. දින තියල නූල බැඳල දාල ඊට පස්සෙ තරමක තොවිලයක් කරන්න වෙයි. මං තාම නූල ජප කරල ඉවර නැහැ. තව ටිකක් තියෙනව.'

''එසේ කියමින් මං පිළිතුරක් දීමටත් පෙර නූල මැතිරීමට පටන් ගත්තේය. නූල ජප කිරීමට පටන් ගැනීමත් සමඟම කොග්ගල මහතා මහ හඬින් කෑගසනු ඇසිණ. පුදුමය නම් කොග්ගල මහතා සිටි කාමරය නූල මැතිරූ තැනින් සෑහෙන දුරකින් වූ නමුත් නූල මැතිරීමට පටන් ගත් බව කොග්ගල මහතා දැන ගැනීමය.,,

''ඔයි කට්ටඩිරාල උඹ ලෙඩා බලන්නේවත් නැතිව ද නූල ජප කරන්නේ? මෙහාට වරෙන්කො උඹෙ මූණ ටිකක් බලාගන්න' උඹ ඉගෙන ගත්තා මදි බං මාව මෙල්ල කරන්න. මේ නිලමෙ කවුද කියල උඹ දන්නෙ නැතිවයි ගොනා වෙන්න හදන්නෙ. මහත්තයෝ මෙහාට එන්න ටිකක්. ඕකට කියන්න බොරු කරන්නෙ නැතිව යන්න කියලා. ආවාවෙ මං ලඟට. ගහනවා දෙකට කැඩිලා යන්න. ගහනවා තොට මේ අල්මාරිය (කොග්ගල මහතා දිගාවී සිටි පෙට්ටිය පාමුලවූ පකිස් පෙට්ටි වලින් සාදන ලද පරණ අල්මාරියක් පෙන්වමින්) ඇතුලට යන්න. ඒයි. උඹ දැනගනින් කොග්ගල අතහැරල මං එනවා උඹ පස්සෙ. එතකොට කොග්ගලට එන්න වෙයි උඹට නූල් බඳින්න, නවත්තපන් ඔය කෝලම් ආපු අකක් බලාගෙන පලයං තක්කඩියා පලයං ,,

''ඔහොම තමයි නූල දිස්ඨි වෙනකොට විඤ්ඤාණෙ රත් වෙනවා. තව ටිකකින් මිනිහ දුවන්න හදයි. තුන් හතර දෙනෙකුට තදකරලා අල්ල ගන්න කියන්න. බැඳලා දුම්මොත් වඩාත් හොඳයි ' අවසාන වගන්තිය කියන විට ඔහුගේ සිතේ ඉමහත් බියක් ද ඇති වී ඇති බව ඔහුගේ මුහුණේ පිළිබිඹු වී තිබිණ,

'ඒයි තක්කඩිය, මොනවද? තෝ කියන්නෙ. මාව බඳින්න? තොට බයෙ මං දුවන්නෙ නැහැ. බොල, මං මෙහෙම ඉන්නම්. කොරපිය තොට පුළුවන් දෙයක්!. කොග්-ගල සිටියේ තරමක් ඈත කාමරයක නමුත් කට්ටඩියා කී සියලු දේ ඔහුට ඇසුණා සේ ය.

කෙසේ වෙතත් නූල මැතිරීම නැවතුනේ නැත. කට්ටඩියා දිගට ම මතුරයි. නිලමේ ද දිගටම බණියි. රැස්ව සිටි අයගේ විමතිය වැඩිවෙයි.

''නූල දුන් නම් හොඳටම දිස්යි වෙලා.,, කට්ටඩියාගේ දූත් වෙව්ලයි, කට්ටඩියා සමග අවතේවයට ආ ගෝලයා කීවේ කට්ටඩියා බියෙන් වෙව්ලනු යැයි රැස්ව සිටි අයගෙ සැක වැලැක්වීමට වියහැකියි. නිලමේගේ ගර්ජනාව ද තව තවත් වැඩිවිය.

මං කොග්ගල සිටි කාමරයට ගොගියේ නූල බැඳීමට අනුබල දීමෙන් මා ද ඊට හවුල් වී ඇතැ යි සිතීම වැලැක්වීමට ය. නිලමේ මා සැක කළහොත් මං කෙරෙහි තිබූ ඔහුගේ හොඳ හිත පලුදු වීමට ඉඩ තිබූ බැවිනි. එනිසාම මා නූල් බැඳීම හා කිසිවිටෙක සම්බන්ධ වීමට අකමැති වීමි.

පැයකට පමණ පසු නූල ද අතින් ගෙන නැඟී සිටි කට්ටඩියා කොග්ගල මහතා සිටි කාමරයට යමින් 'ගෙදර කිල්ලක් හෙම තියෙනව නම් වැඩෙ හරියන්නෙ නැහැ., කියමින් වටපිට බැළුවේය.

''ඇයි, ඔයි ගෙදර කිළි කුණු තියෙනව ද? අහන්න තිබුණෙ මැතිරිල්ල පටන් ගන්න ඉස්සර වෙලානෙ.'' නිලමෙ කී නමුත් කට්ටන්ඩියාට එය නෑසුණා සේය.

කට්ටඩියා කොග්ගල මහතා උඩුකුරුව සයනය කළ මෙට්ටය පසෙක හිඳ, අසල සිටියෙකු දෙස බලා ''මේ... මෙ දෙන්නෙක් දෙපැත්තෙන් අල්ලා ගන්නවා නම් හොඳයි.'' කී නමුත් ඒ සඳහා කිසිවෙකු ඉදිරිපත් නොවූයේ කට්ටඩියාගේ ආරක්ෂාවට වඩා කොග්ගල මහතාගේ සැප පහසුව එතැන සිටියවුන් ද තැකුවා සේය. අනිත් අයට කෙසේ වෙතත් මට නම් සිතුනේ කට්ටඩියා හුදු බිය නිසා ම එසේ කී බව ය. කට්ටඩියා නැවත වරක් එම ඉල්ලීම කළ පසු කට්ටඩියාගේ ගෝලයා ද තව තිදෙනෙක්ද කොග්ගල මහතාට කිට්ටු වූහ. ඉන් පසු දිරිමත් වූ කට්ටඩියා කොග්ගලගේ හිසේ තබා නූල මැතිරීමට පටන් ගති.

කට්ටඩියා මතුර යි. කොග්ගල දහලයි. ''බූතයා බයේ වෙව්ලයි.,, කෙනෙකු කියේ ඇණුම් පදයක් යැයි මට සිතිණ. ඒ කීයේ කට්ටඩියාගේ ගෝලයා බව පසුව මම දැන ගතිමි.

"තක්කඩියෝ, මෙතනින් යනවාද? නැත්ද? නවත්තපිය තොගෙ කුණුහරුප.,, කොග්ගල ගිගුම් දෙයි කොග්ගලට දූන් දූන් සෙලවීමටවත් බැරිය. ඒ ඔහු මෙට්ටයට තදකර තරුණයින් හතර දෙනෙකු අල්වා ගෙන සිටි බැවිනි එහෙත් කොග්ගල දත්මිටි කයි. කට්ටඩියා දිගටම මතුරයි.

"තෝ ඔක නැවැත්තුවෙ නැත්නම ගහනවා තොට අර අල්මාරිය ඇතුලට යන්න.,, කොග්ගල කී නමුත් කිසිවෙකුත් එම තර්ජනය ගැන එතරම් තැකීමක් නොකළේ ය.

"කී දෙනෙක් ඔහොම කියල ඇත්ද?,, කට්ටඩියා කිවේ ඔහුට එවැනි අත්දැකීම් මීට පෙරත් ලැබී ඇති බව පෙන්වීමට මෙනි. ඔහු නූල අතින් ගෙන ආතුරයාගේ අතේ බැඳීමට සැරසෙත්ම "මෙහෙමත් තක්කඩි ලෝකෙ තවත් ඉන්නවාද? බුදු ගුණෙන් මතුරපු නූලක් වම් අතේද? බඳින්නෙ මෝඩයෝ? ඈ ගොනෝ කවුද තොගෙ ගුරා?,,

තමා නූල බැඳීමට සූදානම් වූයේ වම් අතේ බවත් එය වැරදි බවත් තේරුම් ගියා සේ කට්ටඩියා ටිකක් පසුබට විය. කට්ටඩියාගේ සටනේ පළමු පරාජිත පියවර එය විය. තමා කල වරද නිවරද කරණු වස් ඔහු වම් පසෙහි සිට දකුණු ඇලයට මාරුවීමට උක්කුටිකයෙන් ම මෙට්ටය අයිනෙණ් යාමට සූදානම් විය. මෙහි කලින් සඳහන් කළ අල්මාරිය කොග්ගල මහතාගේ දෙපා මුල මෙට්ටය අද්දර විය. කට්ටඩියා කොග්ගල මහතාගේ දෙපා දෙසට ඇදෙත්ම ඔහුට අනිත් පැත්තට යාමට ඉඩ දීමට මෙන් කොග්ගල මහතා දෙපා නවා ගත්තේය. අල්මාරිය සවි ශක්තියෙන් තොර පරණ පකිස්පෙට්ටි ලෑලිවලින් සෑදූ පරණ එකක් විය. කොග්ගල මහතාගේ දෙකකුල් සහ අල්මාරිය අතරට කට්ටඩියා පැමිණෙත්ම කොග්ගල මහතා වේගයෙන්ම තම දෙපා දිගු කරමින් දෙපයින් ම කට්ටඩියා තල්ලු කළේය බලාපොරොත්තු රහිත පහරක් වැදීමෙන් කට්ටඩියා විසි වී ගොස් අල්මාරියේ වැදුනි. අල්මාරියේ දොර කැඩී කට්ටඩියා අල්මාරිය තුල හිරවිය. නිලමේගේ තර්ජනය ක්‍රියාත්මක විය. මැතිරූ නූල ද කට්ටඩියා අතින් ගිලිහිණ. එතැන සිටි දෙදෙනෙකුට කට්ටඩියා එළියට ගැනීමට සිදුවූයේ කැඩුන දොරත් සමඟ අලිමාරිය ඇතුලට විසිවූ කට්ටඩියා එහි තුල හිර වූ නිසාය.

නූල් බැඳීම අමතක කළ කට්ටඩියා නැගී සිටියේ 'මේ ගෙදර තද කිල්ලක් තියෙන්න ඕනෑ, යි කියමිනි.

"තියෙන්න නම් ඕනෑ. නැති එක තමා වරද.,,යි කොග්ගල මහත්මිය අහක බලාගෙන කීවේ ගෙදර කිල්ලක් නැති බව පැමිණ සිටියවුන්ට දැනගැනීමටය. ඇය තරමෙත් පුපුරමින් කාමරයෙන් පිටවී ගියාය.

කට්ටඩියාද මහා සටනකින් පරාජිතවූවෙකු සේ බිම බලාගෙන ම නිහඬව ඉස්තෝප්පුවට ගියේ කිසිවක් නොදෙඩාය. ඉස්තොප්පුවේ කොණක වූ පුටුවකට වී බුලත් විටක් හැපීමට සූදානම් වෙමින් කීවේ, "ගෙදර කිල්ලක් නැතිනම් ඇවිත් ඉන්න කෙනෙකු හෝ කිල්ලට අසු වී ඇති,,යි කියායි.

මමද කාමරයෙන් පිට වී ඇවිත් පැමිණ සිටි අයත් සමඟ කථාවට වැටුනෙමි.

කට්ටඩියා ගැන පැමිණ සිටියවුන් අතර නොයෙකුත් නොයෙකුත් කසුකුසු පැතිරුණද කට්ටඩියාට කෙළින් ම යමක් කීමට කිසිවෙකුත් ඉදිරිපත් නොවීය. නූල බැඳීමට නැත් කිරීමට පෙර කට්ඩියාගේ ඕනෑ එපාකම් සෙවීමට බොහෝ දෙනෙකු වූ නමුත් නූල බැඳීම වැරදීමෙන් පසු කට්ටඩියා ඉන්නවා ද නැද් ද කියා බැලීමට කෙනෙකු නොවිය.

මගේ ගෙදර අසලින් පැමිණියෙකු මා සමඟ කීවේ මගේ නැන්දම්මා සහ නැනන්ඩිය අප බැලීමට බදුල්ලේ සිට පැමිණ ඇති බවය. එද සවස නිලමේ මගේ ගෙදර ගොස් ආපසු පැමිණි වේලේ කී දෙය සත්ත බවද එවෙලේ මට වැටහිණ. බෝ පැලයේ කොළ ගැන බැලීමට මට ඇවැසිව තිබුණද ඡන්තුට හා මකරට දී ඇති පොරොන්දුව නිසා එදින ගෙදර යාමට නොහැකි විය. එහෙත් නෑදෑයින් පැමිණ ඇති බව දැන දැනත් ඔවුන් බැලීමට නොයෑමෙන් නොමනාප වීමටද ඉඩ ඇති බැවින් එයද බරපතල පැණයක් විය. මට ගෙදර ඒමටය කියා මගේ ගෙදර කෙනෙකු කීවේ දැයි පණිවුඩයක් දුන් තැනැත්තාගෙන් මම ඇසුවෙමි. ඔහු මා හමුවීමට එන බව මගේ ගෙදර කිසිවෙකු නොදත් බව කිව්ට මා කීයේ 'එහෙනම්, ඔය වගක් මා එක්ක කිබව පස්සෙ වත් නෝන මහත්තයට හෙම කියන්න එපා.'

ටික වේලාවකට පසු මම නැවතත් කොග්ගල මහතාගේ කාමරයට ගියෙමි. නිලමේ හඬ නඟා සිනාසීමට ගති. "ඇ මහත්තයා, අර කට්ටිය පටි බේරගෙන යන්නෙ නැතිව තවත් බලා ඉන්නවනෙ. මහත්තයවත් කියන්නකො ඔය මිනිහට මගෙ දෑසට නොපෙනී යන්න කියලා.,,

'මහත්තයා දැක්කා නේද? මං කියපු දේ අකුරට ම. කරපු හැටි. කට්ටඩියට අල්මාරිය ඇතුලට යන්න. ගහනවා කිවා කියපු දේ ඒ වගේ ම කළා, මහත්තය දන්නවා ද ඒක කලේ කොහොමද කියා? .. මං මගේ යාළුවෙකු ලවා බල කලා නූල බැඳීමට වම් පැත්තට එන්න. එච්චර යි. ඊට පස්සෙ ඉතුරු ටික කලේ මම. ඔය මනුස්සයො වගෙ නොවෙයි මහත්තය බූතයො කියන ජාතිය කිව්වොත් කරනවා බොරු කියන බූතයො ඇති. නමුත් මේ හීන් බණ්ඩාර නිලමෙ එහෙම කෙනෙකු නොවෙයි."

"නිලමෙගේ නම හීන් බණ්ඩාද? එහෙම නැතිනම් හීන් බණ්ඩාරද?,, මා ඇසුවේ කලින් එක් වතාවක ඔහුගේ නම හීන් බණ්ඩා යැයි කී බැවිනි.

"බණ්ඩාර බණ්ඩට වඩා වැදගත්නෙ මහත්තයා. බණ්ඩ කියන්නේ බණ්ඩි කියන එකේ පුරුෂ ලිංගෙ. එතකොට බණ්ඩාර කියන්නෙ බඩා කියන එක, බණ්ඩාර කියන්නෙ ආරපු බඩක් ඇති තැනැත්තට. ආරපු බඩක් ඇති තැනැත්තා හීන් බඩක් ඇති කෙනෙකුට වඩා වැදගත් නිලමේ සිනාසුනේය.

'නිලමෙ විහිළු කරනව වගෙයි.' මා කියේ එක් අතකින් සතුටුවෙමිනි

'ඔව් මහත්තය, පොඩි විහිළුවක්, නිලමෙ කීවේ දෙගිඩියාවෙනි. එක් අතකින් නිලමේ මා සමඟ ඉතා කුළුපග වීමට තැත් කරන්නේ යැයි මම සිතුවෙමි. දෙදෙනෙකු අතර ඇති පරතරය අඩුවී සුහදතාවය වැඩි වූවිට දෙදෙනා

අතර රහසක් නැතිවෙයි. එයින් නිලමෙ දත් සියල්ල මට අසා දැනගත හැකිවේයැ යි මමසිතුවෙමි.

'නිලමෙ කොහොම ද අද රැට මකර එහෙම එනවා නේද? අපි දැන්ම ම සූදනම් වෙල ඉදිමු. පහළොස් පැයට එනවා කිව නේද?

''ඔව් මහත්තය, එහෙනම් මහත්තයත් ගිහින් කෑම හෙම කාලා එන්න. කෑම නම් දැන් සූදනම්. අන්න මහත්-තයාට කැඳවන්න සූදනම් වෙනව.,, නිලමේ කීයේ ගෙදර හැම තැනකම සිදුවෙන හැම දෙයක්ම දත් සේය.

ඒ සමහම වාගේ වතුර වීදුරුවක්ද රැගෙන කොග්ගල මහත්මීය රෑ කෑමට ආරධනා කිරීමට කාමරයට පැමිණියාය.

''එහෙමනම්, නිලමේ මං කෑම ටිකක් කන්න යන්නම්. නිලමෙට තනිවට ඔය බණ්ඩා ඉන්නෙ. මං එනකම් බණ්ඩා එක්ක කථා කර කර ඉන්නකො.,. මං එසේ කීවේ මා කෑමට යන බව කීමටය.

'මහත්තයත් ගිහින් කෑම කාලා එන්නකො මට තනියක් නැහැ. බණ්ඩ උඹත් ගිහින් කෑම කාලා වරෙන්. මං යන්නම් රෙකුලාසි පාලම දිහාවෙ ගිහින් එන්න.,, නිලමෙ කීවේය.

''කමක් නැහැ බණ්ඩ ඉන්න. බණ්ඩට පස්සෙ කන්න පුළුවන් නොවැ. නිලමෙ එහෙනම් ජන්තුව කියන්න මං රාවනා යුගය ගැන අහන්න ආසාවෙන් ඉන්නව කියල,'' මම කාමරයෙන් පිටවීමි,

කෑම කන අතරෙ හැම කෙනෙකුම වාගෙ කිවේ නිලමෙ සන්සුන්ව සිටි බවය. 'ඔව් ඉතින් මහත්තයාට පින් සිද්ධ වෙන්න නිලමෙ සද්ද නැතුව ඉන්නව. නැත්නම් කොහෙද'' යටි සිතින් මම සතුටු වුවද මා සිනාසුනා පමණි.

(6)

රාවන යුගයෙන් ආ අමුත්තෝ

රාත්‍රි කෑමෙන් පසු නවයහමාරට පමණ මම නැවතත් කොග්ගල මහතා සිටි කාමරයට ගියෙමි. එවේලේ කාමරයේ කිහිප දෙනෙකු සිටි බැවින් මා තරමක් කනස්සල්ලට පත්ව වටපිට බැලිමි. මැදියම් රැයේ එනම් රෑ දොලහට පමණ මකර ආදී පිරිස පැමිණීමට පොරොන්දු වී ඇත. ඔවුන් සමඟ සාකච්ඡා කරන විට වෙනත් කිසිවෙකු නොසිටිය යුතු බැව් ඔවුන් කළින්ම දන්වා ඇත, මා විසින් දෙන ලද එම පොරොන්දුව ඉටු කිරීමට නොහැකි වන සැටි මට පෙණුණි. කුමක් කළ යුතුද යි තීර්ණය කිරීම මට ම අපහසු වීය, බූතයන්ට දෙන පොරොන්දු හරියටම ඉටු නොකළහොත් පොරොන්දු දෙන තැනැත්තාගෙන් ඔවුන් පළිගන්න බව මා අසා ඇත. නිලමේ මට යටත් වුවාට මකර ආදීන් කෙබඳු බලතල ඇත්තවුන් දැයි මා නොදත් බැවිනුත් මගේ බලතල කුමන ආකාරයකින් මට ලැබී ඇති දැයි ඊම ම නොදත් බැවිනුත් තත්ත්වය තවත් බරපතල විය.

අමුත්තන් සිටියදී මෙය නිලමේ සමඟ හෝ සාකච්ඡා කර කුමක් කළ යුතුද යි තීර්ණය කිරීමට ද නොහැකි වීමෙන් මම තවත් පසුතැවිලි වීමි. එහෙත් කිසි ලෙසකින් වත් නොසිතු අන්දමේ සහනයක් සහ සහයෝගයක් එම අවස්ථාවේ දී නිලමෙගෙන් ලැබිණි. කිසිවෙකු බලාපොරොත්තු නොවූ ලෙස නිලමේ කලහකාරී තත්ත්වයක් ඇතිවුවේය, ඔහු තද කෝපයකින් පෙළෙන බව පෙනිණ,

රෑ එකොළහ පමණ වනවිට කොග්ගල නිලමේ අවට සිටි බොහෝ දෙනෙකු පිටවී ගියද දෙතුන් දෙනකු රැඳි

සිටියහ. මේවන විට නිලමේ දත්මිටි කෑමටද අසල සිටියවුන් දෙස රවා ඔරවා බැලීමට ද පටන් ගත්තේ අවට සිටියවුන් නොසන්සුන් කරමිනි.

හිටි හැටියේ ම නිලමේ නැඟී සිටියේය. ''අද මං බලන්න බොහොම බලගතු ඇත්තො කිප දෙනෙකු එනවා ඒ ගෙන්වන්නෙ මට හිරිහැර කරන එවුන්ට හොඳ පාඩමක්, උගන්වන්න. අද මට නිදහසේ ඉන්න ඕනැ. එයෙක් වත් මේ කාමරේට ඇතුළු වුවහොත් හොඳ පාඩමක් උගන්වනවා යනවා ද නැත් ද මෙතනින් එළියට? නිලමේ අවට සිටියවුන් දෙස බැල්මක් හෙළා ගර්ජනා කළේය. මම ද ඔවුන් දෙස බලා අභිංසක බැල්මක් හෙළීමි.

එකිනෙකා නොකැමැත්තෙන් මෙන් කාමරයෙන් එළියට ඇදුණි. ඒ අතර බණ්ඩා ද කාමරයෙන් පිටවීමට සැරසුණි. මම ඔහු දෙස බලා ඉඟියක් කර ඔහු නතර කර ගතිමි, ඊ දෙලහ වනවිට කාමරයේ ඉතිරි වූයේ මාත් කොග්ගලත් බණ්ඩාත් පමණි. කාමරයේ දොර වසා දොරගුළු ලන ලෙස මම බණ්ඩාට නියෝග කළෙමි.

ජනේලයෙන් ඇතුළු වූ මා වවුලෙක් කාමරය වටම පියාඹා නැවත ජනේලයෙන් පිට වී ගියේය. ගෙයින් පිටත තද කුණාටුවක් හමා යනු ඇසිණ. ''හා මහත්තස ඔන්න අපේ යාළුවො ටික එනවා. සුදනම් වෙන්න පිළිගන්න.' නිලමේ කීවේය.

බණ්ඩා කලබල විය. හිස නොසොල්වා ම දෑස් කරකවා වට පිට බැළුවේ කාමරයේ සිටි යමෙකු දෙස බලන්නා සේය. බිම වාඩි වී සිටි බණ්ඩා අසල වූ පුටුවක් මත වාඩිවිය. සාමාන්‍ය දිවියේදී බණ්ඩා ඒ ගෙදර පුටුවක් මත වාඩි වී සිටනු මා දැක නැත.

බණ්ඩා කතා කළේය. ''ඉතින් බඳුරු, කොහොමද? මෙන්න අපි ආවා, පොරොන්දු වුණා වගේ ම' ජන්තුත් ආවා. සුබාත් ආව. දූත් අපේ කාලේ තුන් දෙනෙකු ම

මෙහි ඉන්නව, පොඩි මදිකමකට තියෙන්නෙ අනිත් දෙදෙනට කැපයො නැහැ. කමක් නැහැ. ඕනැ වෙනකොට මගේ කැපය දෙන්නම් ඒ අයටත් බදුරුට කතා කරන්න ඕනැ වෙනකොට. එතකොට කරදරයත් නැහැ නෙ.?,

''මකර පැමිණි බව මට වැටහුණි.,,

''මකර, ඇත්ත කියනව නම් මට තේරුනේ නැහැ මකරගෙ කතාව. ජන්තු කී හැටියට මමත් රාවන යුගයෙ ජීවත් වෙල ඉඳල තියෙනව. නමුත් මං දැන් මිනිසත් බවක් ලබලා ජීවත් වන්නෙක්. ඒ කාලෙ දේවල් කිසිවක් මා දන්නෙ නැහැ. අනික් අතට මං කල්පනා කළා මකරට වැරදිමක් වත් වෙලාද කියා මකර මං වගෙ වෙනත් කෙනෙකු ගැන හිතල මං ඔහුය කියා රැවටිල වෙන්න පුළුවන්. මං පුනරුත්තත්තිය විශ්වාස කරණව. සමහරවිට මං රාම රාවනා යුගයෙ සටන් කරල මැරිල නොයෙක් ආත්මවල ඉපදිල අන්තිමට දැන් ඉන්න ආත්මයේ උපදින්න ඇති කියලත් හිතන්න පුළුවන්.,,

''ඒක තමා මමත් කියන්නෙ. අපිට වරදින්නෙ නැහැ. මටත් වැරදීමක් වෙලත් නැහැ. මං බදුරු හොඳට අඳුනනව. උඹ රාම රාවනා සටනට ආවේ නැහැ එතකොට නුඹ තපස් රකින්න ගිහින්. රාම රාවනා සටනට බදුරුත් ආව නම් හොඳ හොඳ සෙල්ලම් බලන්න තිබුණා. තපසට ගියාව පස්සෙ උඹ මට හමුවුනේ එකම එක වතාවයි. අවුරුදු පන්දහසකට වඩා කලක් පැවත එන අපේ දූයේ උඹ නැවත ඉපදීමක් ලබල තියෙනව. දැන් උඹට තියෙන්නෙ ඒ කාලෙ තිබුණ සිරුර නොවෙයි. ඒ සිරුරු ලකුණක් වත් දැන් නැහැ. නුඹට දැන් ඇත්තෙ ඉතා කුඩා සිරුරක්. ඒ කාලේ නුඹ යෝධයෙක්, සිරුර කොතරම් වෙනස් වුනත් ඒ කාලෙත් නුඹ සතුව තිබුණ' අපි හොඳට හඳුනන යම් කිසිවක් අදත් නුඹ සතුව තිබෙනවා. එක නැති කරන්න බැහැ. ඒ තමා නුඹෙ යටි හිත.

ඒ කාලෙ අපි දෙන්නම එක හා සමාන වුනත් දැන් නුඹේ සිරුර කුඩා වෙමින් අඩිත් අය තරමට [illegible] තිබෙනව. මට සිරුරක් නැහැ. නමුත් අපි දෙන්නාටම පොදු නැති කිරීමට බැරි එක් දෙයක් තිබෙනව. ඒ තමයි සිත. නුඹට

උඩු සිතයි, යටි සිතයි කියල දෙකක් තිබෙනව. නමුත් මට ඇත්තෙ එක හිතයි. අප දෙදෙනා කොටස් කරලා බැළුවොත් මට කියන්න හැකියි බදුරුට කොටස් හතක් (7) ඇති අතර මට ඇත්තෙ කොටස් එකයි. නමුත් මං හිතනව මගෙ ඒ එක කොටස බදුරුගෙ කොටස් හතට ම වඩා බලවත් ය කියා. බදුරු සතුව ඇති වැඩිපුර කොටස් තමා පස් මහ බූතයින්ගෙන් හැදිල තිබෙන සිරුර. මට සිරුරක් නැහැ. ඒ හිතත් නිකම් ම එකක් නොවෙයි සිතුවිලි පරපුරක්. අවුරුදු දහස් ගණනක දේ ඔය හිතේ තැන්පත් වෙලා තිබෙනව. ඒවා තියෙන්නෙ යටි හිතේ. නමුත් උඩු හිතින් යටි හිත වැහිලයි තියෙන්නෙ. උඩුහිතින් ඇවැසි වන්නෙ පස් මහ බූතයින්ගෙන් හැදී ඇති සිරුරහසුරවන්න. ඒ සිරුර හසුරුවන්න බදුරුගෙ උඩුහිත නිතර ම වෙහෙසෙනව. ඒ නිසා යටිහිත තව තවත් යටපත් වෙනව. නැතිනම් නින්දට යනව. සමහර වෙලාවට යටි හිතෙන් දෙන නියෝග උඩු හිතෙන් ක්‍රියාත්මක කරනව. ආත්ම ගණනාවක් ඝනකොට යටි හිතේ ඇති දේ තව තවත් යටපත් වෙනව. මට එහෙම දෙයක් නැහැ මගේ සිත වෙහෙස කරන්න හෝ මගෙ සිතෙන් රකින්නා හෝ මට සිරුරක් නැහැ. ඒ නිසා මගේ සිත පැහැදිලියි. අවුරුදු දහස් ගණනක දේ යට නොවී නොවැසී තිබෙනව. පැහැදිලි ව මතකයි. වැඩ ගොඩක් පිරිල තියෙන උඹෙ සිත් දෙකකට වඩා මගේ එක සිත පැහැදිලි නිසා මට නුඹ හොඳ හැටි හඳුනා ගන්න හැකියි.''

''මට තේරුණා මකර, නමුත් මගෙ ශරීරය ඒ කාලෙ වගෙ නොවෙයි නම්, ඊට වඩා වෙනස් නම් කොහොමද මකර මං හඳුනා ගත්තෙ?''

''මං හඳුනා ගත්තෙ නුඹෙ සිරුර නොවෙයි, නුඹේ හිතයි. නැත් නම් සිතුවිලි පරපුරයි. දැන් ජීවත්වන නොයෙකුත් කටයුතු වලින් අවහිරකම් වලින් පිරිල තිබෙන සිත් ඇති අයගෙ වගෙ නොවෙයි අපේ සිත් නිදහස් ව විවේකී ව තිබෙනව.''

"ගෙයින් පිට මහා කුණාටුවක් හමා යන ශබ්දයත් ගස්වැල් ඇඹරෙන ශබ්දයත් ඇසී මම වටපිට බැළුවෙමි.

"හඃ හඃ හා බාසුරු, උඹත් ආවද? වැඩක් නැහැනෙ අපි ආවිට මේ මිනිහට අපව පෙණෙන්නෙ නැහැනෙ. එයාට ම මතක නැහැ එයාගෙ අතීතෙ. තමන්ගෙ අතීතෙ දන්නෙ නැති එකෙකුගෙන් කාටවත් වැඩක් නැහැනෙ. මං ටිකක් කියා දුන්න. දැන් නම් වැටහිල තියෙනව. බොහොම කාලෙකින් පරණ සගයො ටික එකතු වුනා. ජනකත් හිටිය නම් කොතරම් හොඳද?" මකර කී දෙයින් මට වැටහී ගියේ රාවනා කල්ලියේ තවත් එකෙකු ආ බවය.

ඈත අතීතය, වත්මන සහ අනාගතය. @

කාමරය එළියකළ ලාම්පුව අමාවක ගණඳුරින් පරාජය පිළිගන්නාසේ ටිකින් ටික මිලින විය. කොග්ගල ද නද නින්දේ විය. දෙගොඩහරි මැදියම් රැයේ අවදිව සිටියේ මමත්, උස් පහත් වෙමින් අඳුරත් සමඟ සටන් කළ ලාම්පු දැල්ලත් පමණකැයි මට සිතුණි.

"හාහ්, බඳුරු මං අඳුණන්න හැකිද?" ඒ බාසුරු විය හැකිය. "කොහොම අඳුණන්නද? මට ඔබ පෙණෙන්නෙ නැහැනොවැ" මං එසේ කීයේ බාසුරු නැමත්තෙක් ආ බැව් මකර කී නමුත් එතෙක් වූ සිදුවීම් ගැන සිතන විට ඒ බාසුරු නොව වෙනත් තැනැත්තෙකු විය හැකි බැවිනි.

"ඔව් නුඹේ අද බවත්, කාලයට හොඳ දෙයක්. තුන් ලොවක් නතුකළ, මහරජෙකු බිහිකළ. හෙළ දූයක් නැසෙන හැටි. අපේ නම් ඔබෙ හිසේ, කෙස් කෙළින් සිටිනු' ඇත"

"මං හිතනව ඔබ බාසුරුය කියා. කුමක්ද ඔබ කියන දූය නැසුම?" මම කීවෙමි.

“අඳෝමැයි බදුරු, අඳෝමැයි. ඔබට පෙණෙනව. ඔට බලන්නෙ නැහැ. ඔබට ඇහෙනව ඔබ අහන්නෙ නැහැ. ඔබට හිතෙනව, ඔබ හිතන්නේ නැහැ. එයින් දූත් වැඩක් නැහැ. ඉතින් කොහොමද ඔබේ වත ගොත?”

“මං නම් මිනිස් අත්බැවක් ලැබ අප දූයේම ඉපදී සිටිනවා. ඔබ නම් ඈත අතීතයෙ සිටම රාවණා යුගයෙන් පසු එකම අත්බැවකයි.” මං එසේ කීයේ කලින් ආ අතීතයන් මාද රාවණා යුගයේ සිටි බැව් කියා තිබූ බැවිනි.

“ඒ ඇත්ත. මං මෙතෙක් එකම අත්බැවක සිටි බැවින් එද සිට මෙද තෙක් හැමදෙයක් මට හොඳින් මතක ඇත. අපේ රැහැ දූත් කෙමෙන් වැනසී යනබවයි මට පෙනෙණු-යේ” ඔහු කීයේ කලකිරීමකිනි.

“ඔව් බාසුරු අපේ රට සහ අපේ රැස විදෙස්සන්ට යටත්ව තිබී අට වසරකට පෙර නොවැ නිදහස ලැබුණේ. (මට බාසුරු හමුවුයේ 1956 දීය.) අපේ ඒ හෙල උරුම විදෙස්සන් වැනසුවා. ඒවා නගා ගැනීමට නව කලක් ගතවේවි. රාවණා යුගයේ සිට එකම දිවියක සිටින ඔබට අපේ අතීතය ගැන හොඳ මතකයක් ඇති. මං නොදත් ඒ කරුණු මට කියා දුනහොත් එයත් ලොකු සේවයක්.” ඈත අතීතයෙ තොරතුරු බාසුරුගෙන් ලබා ගැනීමට ඇරයුමක් කළෙමි.

“ඔව් බදුරු, දනිමි මං අතීතය. වත්මනත් පෙනෙනවා. අනාගතයත් බලා කරුණු කීමට හැකියි. ඒත් ඉන් පලක්නැහැ. විදෙස්සන්ටත් වඩා දූයට විත එන්නෙ අප රැහේ උන්ගෙනුයි. දූයට ලැදිකමක් ඇති, බසට පණ පුද ඇති, මට මගේ හෙළ දූයට, අයත්වන ඉරණමක්, වලක්වන අදහසින්, මට පෙණෙන දේ ඔබට, කිව හැකියි. මං එසේ කියනුයේ, ඒ දනුම හෙළ දූයේ, හිමටමින් හෙළිදරවු කිරීමටයි.

හෙළ දූයේ මුල් උපත, වසර ගණනින් මිණුම, කියිම කිසි කෙනෙකු හට, නොකළහැකි දෙයක් නොවැ. හඳෙන් ආ කුමරියන්, හිරු කුමරුවන් සමඟ, දඹගිරියෙ මුදුනෙදී.

එක්ව විසුමෙනුයි අප, හෙළ උපත සිදුවුයේ. භාරතයෙ සුරයිනුත්, ලක්දිවේ අසුරයින්, සමඟ මහ සටන් කර, අසුරයින් පැරදුනා වසර දස දහසකට, පෙර දවසෙ රක්වානෙ, තාරක නම් ලැබූ, හෙළ රජෙකු භාරතයෙ, සුර කැලෙන් වැනසුනා. හෙළ දූයත් ඒ යුගයෙ, ඒ සමඟ වැනසුනා. නැවත හෙළ බලය නැඟ වසර දෙදහසක් සහ පන්සියක් ගෙවූ තැන, මහබලී නම් නුවර රජ පැවිණි මහබලී, අසුර රජ් සුර කැලෙන් වැනසුනා. ඉන් වසර දෙදහකුත්, පන්සියක් පසුව ගොස්, මහාරාවණ නමින්, දස ඔටුනු පැලඳ සිටි, මහා හෙළ රජාණන්, රාමයන් ගෙන් පැරද සිව් හෙළය වැන සුනා. ඉන් වසර දෙදහකුත්, පන්සියක් ගෙවුන තැන භාරතෙන්, පාවී ආ සිංහ පවුලට අයත්, දෙටුසිංහයා මෙහිදි, රජ ඔටුනු පැලඳුවා. සිංහ මෙහි ආ කාලෙ මෙහි තිබුණෙ සිව් හෙළය, නොහොත් සිංහළය නොවැ. යක් රැහැන් නා රැහැන්, දෙව් රැහැන් රක් රැහැන් එක්ව තිබු සිව් හෙළය සිංහ පවුලෙන් ආව සිංහගෙන් වැනසුනා. සිංහ පවුලේ සිංහ, සිව් යන්න ලොප් කළා, සිංහ නම එක් කළා, සිංහ හෙළ යැයි කියා, නව දූයක් බිහි කළා.

ඉන් වසර දෙදහස් පන්සියක් ගිය තැනයි අද යුගය. හැම වසර දෙදහස්, පන්සියයකට වරක් වෙනස්වන හෙළ දූයට, මේ යුගය සිව් වැන්න විය හැකියි. ඒ අනුව බලනකල අදත් අප හෙළදූයේ වෙනස්වීමක් පෙනේ. බාසුරු කියාගෙන ගියේ යාදින්නක් සේය.

''ටිකක් ඉන්න බාසුරු, මං හිතන්නෙ නැහැ මේ යුගයෙ හෙළදූය වැනසේය කියා. වසර අටකට පෙර (1948) නිදහස ලැබූ අප හෙළ බොදු රජයක් ලබා ඇත. එනිසා මං හිතනව මේ යුගයෙ හෙළ දූයේ නැඟිමක් ඇතිවේය, කියා'' මං කීයේ මගේ නොවක් හැඟීමය.

''බදුරු ඔබ හිතන්නේ එය එසේ යැයි කියා. වසර දෙදහස් පන්සියකට පෙරදි අපේ සිංහළයො හැම මළවුන්

පිදුම නවතා බුදු දහම පිලිගත්ත. එහෙත් මේ රට විදෙස්සන් හට යටත්වී තිබු කාලයේ විදෙස් දහමක් මේ රටේ පැතිරුණා. හෙළයිනුත් බොහොමයක් ඒ දහම වැළඳගෙන විදෙස්සන් හා එක්වුනා. එයින් උන් බලවත් වුනා. මෙකල හෙළයෙකු වුවොත් බොදුනුවෙකු හෝ කිතුනුවෙක්. එයින් පිට හෙළ යෙකු නැහැ. එහෙත් හෙළ බොදු කම නැඟීමෙන් බලැති හෙළයින් වෙන්වුනා. ඉන් අපේ හෙළ බලය බිඳුනා. තවත් ටික කලකදී හෙළ බස රජබසක් කර නීති පණවයි. එවිට හෙළ බස නොදත් හෙළයින් හෙළයිනට එරෙහිව නැගෙයි. තවත් හෙළයින් එයින් බෙදෙනව. හෙළ දූයේ බොහො බලවතුන් හෙළ බස නොදත් අය බොදුනුකමකුත් නැති අයයි. හෙළ බස නොදත්තෙන් පර බසට ගැතිවෙමින් ගතින් මෙහි සිටි නමුත් සිතින් උන්ගේ දිවිය ගෙවනුයේ බටහිරයි. ඔවුන් දෙකොටස එක්ව හෙළ බොදු රජය නැසුමට හැම උපා යොදවති. බලකාමයෙන් රත්ව තැන ලැබීමට මත්ව හෙළ නොවුවන්ගෙන්ද සහය ලැබ ගන්නා බව සක් සුදක්සේ පෙනේ. හෙළ දදය (කොඩිය) වෙනස්කොට පටි ගැසූ දා පටන් හෙළ බලය අඩුවුනා. උන් සැවොම එකතුවී මෙරට හෙළයන්ට තනි අයිතියක් දෙනු බැරිය, මේ රටේ දිවි ගෙවන හැම කෙනෙකුහටම අයිතියත් දිය යුතුයි කියන්නන් රජ බලය ලබනු ඇත.

ලක පැවතිද සිටම නැව් බිඳි අහම්බෙන් පාවී ආ එවුන් සහ මෙහි පැමිණි වෙළෙන්දන් බොහොමයක් මෙහි රැඳී අප බසද ඉගෙන ගෙන අපේ පිලිවෙත් රැගෙන අපේ දූයටම එක්ව හෙළයින්ම වූ නමුත් සිරිත්වත් විරිත්වත් අපේ දේ නොපිලිගත් පිටරටින් අපේ රට පාවදෙන දිනය දුන් අත ලඟය.

අපේ හෙළ දූයේ නම හෙළවුයේ බස නිසයි. බස මළා නම් එද හෙළයාගෙ මලගමයි.

රටින් රටකට පැමිණි විදෙස්සන් එරට බස, සිරිත් හා විරිත් වත් නොපිලිගෙන සිට තමන්ගේම වූ ආගමද තම තමන්ගේ බසද රටෙහි පතුරන්නවුන් රට යටත් කිරීමට පැමිණි සතුරන් ලෙසයි සැලකිම. උන්ට දිරිදෙන අපේ උන් හැමත් අපේ සතුරන් ලෙසයි අප හැම සැලකුවෙ.

එහෙත් බල ලෝබයින් බල ලැබ අනාගතයෙදී හෙළ බසත් දකුණු බාරත බසත් බටහිරින් ආ බසත් සම තැනක තබන සැටි පෙනීයයි. තුනට සම තැනක් දී තුනෙන් වැඩ කරණවිට හෙළයින්ගෙ යහ බසට වැඩක් නැති බැවින් මහ ජාතියේ කොලු පැටවු නවත් බල ලෝබයින්ගෙ බසට අවනතව අවි අතට ගන්න බව පැහැදිලියි. සාමයේ නාමයෙන් අවිගත්ත වුන් නිසා හෙළ උපත් නවත්වා හෙළයින්ගෙ අනුපාතෙ සුළු එවුන් තරමටම අඩුව යන සැටි පෙණෙන්.

බඩ වියත රැකීමට බාරතෙන් ඇවිත් මෙහි උතුරෙ සහ කන්ද උඩරටත් තුන් පෙදෙසෙ නතරවී කල් ගෙවූ ජන රැසක් දෙමළ තුන් කටටුවක් එක්ව හා වෙන වෙනම රට බෙද ගැනීමට මහ සටන් කරනු ඇත. හෙළදිව පැවතිද සිට පැවතෙන මහා හෙළදූය බල ලොබින් පිල් බෙදි දෙපිලක්ව සැදීසිට තරහයට සුළුජාතිකයින්ට සැප පහසුකම් සලස්වන සැටි පෙණේ. හෙළ බසත් මක ලා සිංහෙළ නසාලා ''සිරි ලකුන්'' යැයි නමක් පටබැදිමෙන් එකල හෙළයින්ම හෙළ දූයට වල කපති.

ඇත ඒ අතීතයෙ සිටම ඉරහඳට වැදුම් වැදි මළවුන් පිදූ හෙළයින් බොදුබැතිය වැලඳගෙන වසර දෙදහකුත් පන්සියක් ගෙවීමෙන් අන් බොදු රටවල් මෙන් අඩහඳටත් තරුවටත් බැති පිදුම් කරන පිරිසකගෙ අණසකට යටත්වන සැටි පෙණෙන්. බාසුරුගෙ යාදින්න නොකඩවා ඇදහැලුනි.

පිල් බෙදුම නවත්වා එක බසක් දූය බඳින බැම්ම ලෙස යොදගෙන මෙරට වැසි හැම දෙනම එම බසෙහි දැනුම ලබා වෙනත් තව විදෙස් බස් හැකි පමණ උගතහොත් වෙනත්

රටවල් සමඟ හුවමාරු කරණ විට එම බසින් කළහොතින් විදෙස් බැඳුමත් වැඩේ. විදෙස් බස් වලින් ලියූ පොත්පතුත් අප බසට පෙරළවා මෙහිම තැන්පත් වුවොත් අපේ රට ලොවේ ලොකු පොත් ගුලක් වන බවත් නියතවේ. ඒ ඈත අතීතයෙ පිට රටින් මෙහි පැමිණි අය සමඟ උන් බසින් උන් සමඟ කතාකළ හැකියවුන් බොහොමයක් මෙහි හිටිය. බාසුරු මදක් නිහඬවිය.

අප රටේ අනාගත පැවතුමට මෙන්න හොඳ නිදසුනක්. එක්තරා ගල් ලෙනක සිංහ පවුලක් හිටිය. ටික කලක් යන අතර ඒ ලෙනට කොටි පවුලකුත් ඇවිත් සිංහයට බැලමෙහෙ කිරීමට එහිම නැවතුන, සිංහයා සහ කොටියා සමගිසම්පන්න වී එකට දඩයම් කළා. තවත් ටික කලකදී කොටියා සහ සිංහයා ඉවත ලන කටු කැබලි සහ මසින් යැපීමට නරියෙකුත් ආව ගිය. නරිය තම බිරියකුත් කල් යත්ම තව තවත් බිරියනුත් සමඟ විත් ඒ ලෙනේ කොටසකම දිවී ගෙවුව. නරිය නරි බිරින්දන් වැඩි වැඩිය ගෙන ආව. කලක් ගතවී යත්ම නරියගෙ බිරින්දන්ගේ පැටවු වැඩිවුනා. නරි බලය තර වුනා. තවත් ටික කලකදී කොටි පැටවු ටික දෙනෙක් ලෙනේ අයිතිය පතා සිංහ පැටවුන් සමඟ දබරයට එළඹුනා. සටන් කළ සිංහ පැටවුන් සමඟ කොටි පැටවු බොහොමයක් මියැදුනා. නරි බිරින්දූලගේ දරු පැටවු වැඩිවුනා. නරි බලය තරවුනා එම ලෙනේ අයිතියත් නරි රැලට අත්වුනා.

'දූන් ඉතින් බලන්නකො, අපේ හෙළ දූයට ඒ කතාවත් ගැලපේද?.. බාසුරු නිහඬ වුනා.

''නිලමෙ බාසුරු ගියාද?'' මං ඇසුවෙ තරමක නිහැඬියාවකින් පසුවයි.

''නැහැ. මට ඔබට උපදෙසක් දිය යුතුව ඇත බඳුරු. අපේ දූයට නම් දූන් දෙවියන්ගෙ පිහිට පමණයි ඇත්තෙ. යක් රැහෙන් උපුල්වන්, රක් රැහෙන් විබීසන, නා රැහෙන් සුමන, දෙව් රැහෙන් කඳ කුමරු අපේ දූය රැක ගනී.

එයින් දෙදෙනෙකුමත් දූන් හෙළයින්ට අභිමීවෙල. උපුල්වන්, විෂ්ණු වෙල, කඳ කුමර ස්ඛන්ද නොහොත් කන්දසාමි වෙල. ඒ දෙදෙන දූන් රකිනුයේ හෙළයන් නො ව හින්දූනුයි.

කෙනෙකුහට ආපද විපතකදී ඕනෑම කෙනෙකුහට වැද වැටිළ දන ගහල උදවු ඉල්ලුවොත් හෙම පිත් තකා එය කරයි. එහෙත් දූයක් රකිනුයේ උපකාර කරණුයේ ඒ රැගේ දෙවියන් පමණයි.

ඒ නිසා බදුරු පුත අපේ දූය රැකීමට අපේ හෙළ දෙවිඳුන් යැදුම් කර සිටීමට අප දූයට දන්වන්න. ආසිරි බදුරු, ආසිරි.,, බාසුරු නිහඬ වුයේ ආසිරි පතමින්ය.

''මට දූන් නිදිමතක් නැහැ නිලමෙ තව කවුරුවත් ගෙන්වමුද?'' මම නිලමෙ ඇමතුවෙමි.

''මහත්තයට නිදිමත වෙන්නෙ කොහොමද, හොඳට නිද ගත්තනෙ. මහත්තය බාසුරු එක්ක කතා කළේ නින්දෙ ඉන්දදී සිතුවිලි රැලි මගින්. මං කල්පනා කළේ බාසුරු කී අන්දමට එක බාසාවක් කතාකරණ ජාතියක් හැදීමට හැකිනම් ගම් ගැටුම් නැතිවෙයි. එතකොට අපිට සිංහල බොදු. සිංහල, කිතුනු, සිංහල හින්දු, සිංහල මහමදික ආදී වශයෙන් සිව් හෙළයක් නැවත බිහිකළ හැකියි.'' නිලමෙ එසේ කී විට මළයකෙකුට වුවත් අපේය යන හැඟීමෙන් අපේ දූයට බැඳීමට හැකිවෙයැයි මට සිතුනි.

''මහත්තය අපි කොටගම කන්දෙ ඉන්න අමර ගෙන්-වමුද? කුඹුකන් කුමාරයගෙ රජදහන කෙළවරේ රාවණ රජතුමාගෙ බෙහෙත් වත්තෙ බුලු ලෙනෙයි එයා ඉන්නෙ. මහත්තය අතීතෙ ගැන හොයන නිසා මගෙ යාළුවන්ගෙන් මං අතීතය ගැන සෑහෙන විස්තර හොයාගෙන තිබෙනව කුඹුකන් ඔය පටන් ගන්නෙ ඒ කඳුවැටියෙන්.'' නිලමෙ එසේ කියා අමර සොයා ගියේය.

වසරකට වැඩි කලක් සිතුමිණි කියවන්නන් අතර හොල්මන් කළ කොග්ගල නිළමේ කතාවේ කොග්ගල මහතාගේ නියම නම හෙළිකිරිමට අවසර දීම ගැන කොකාවල මහත්මියට මගේ නොවක් තුති මෙයින් පිරිනමා කොක්ගල කතාවේ ඇතුල් පැත්ත හෙළි කිරිම වටියයි සිතමි.

1956 වසරේදි පලිගැනීමේ අදහසින් මියගිය හීන්බණ්ඩා නිළමේ ආවේශ වූයේ රුහුණු රට උපත ලැබ බද්දුලු දිගාවේ ලුණුගල පාසැලේ උප ගුරුවරයෙකු ලෙස සේවය කළ දෙන් ප්‍රැන්සිස් හේවා කොකාවල මහතාටය.

වෙද විදුහල්පති රන් පෑනක් තෑගි කරයි.

ගම්පහ වෛද්‍යාචාර්ය ඩී. ඇම්. ජයසිංහ
ඩී. ඇස්. ඒ. සී. (ගෞ) ලි.ප අ ක 648
විදුහල්පති, ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලය,
1977 – 06 – 29.

සිතුමිණි කර්තෘ තුමා වෙත,

මහත්මාණෙනි,

ඔබ පතෙහි පලවෙන 'කොග්ගල නිළමේ' කතාව කර්තෘ හේ. මාකස් ප්‍රනාන්දු මහතාට සාහිත්‍යයත්, ඉතිහාසයත් අගය කිරීමේ තිලිනයක් වශයෙන් මේ සමග එවන "පාකර් 51" පෑන ඒ මහත්මාට මා නමින් ප්‍රදානය කරන මෙන් ඉල්ලමි.

දූය හිතැති,
අ. කලේ; ඩී. ඇම් ජයසිංහ.
ගම්පහ සිද්ධායුර්වේද විදුහලේ
විදුහල්පති.

ඉහත සඳහන් පෑනද, එම ලිපියේ මුල් පිටපතද, සිතුමිණි සංස්කාරක තුමාගෙන් සාදරයෙන් පිළිගත් බව දන්වමි.

හේ. මාකස් ප්‍රනාන්දු.

(1977 ජූලි 8 වන සිකුරාද සිතුමිණි පත්‍රයෙන්)